මාකඳුර පරිශ්‍රය

26.6 කායර් මණ්ඩල සංවධර්න මධ්‍යස්ථානය

26.7 වෛද්‍ය මධ්‍යස්ථානය

26.1 පුස්තකාලය



26.1.1 පසුබිම් තොරතුරු

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයීය පුස්තකාලය පුස්තකාල තුනකින් සමන්විතය. ඉන් එකක් කුලියාපිටිය පරිශ්‍රයේ පිහිටා ඇති අතර එමගින් ව්‍යවහාරිකවිද්‍යා පීඨය, තාක්ෂණ පීඨය සහ ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය යන පීඨයන් තුනට සේවය සපයන අතර මාකඳුර පරිශ්‍රයේ පිහිටා ඇති පුස්තකාලය මඟින් කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය හා පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය යන පීඨවලට සේවය සපයයි. තෙවනි පුස්තකාලය ලබුයාය වෛද්‍ය පීඨ පරිශ්‍රයේ පිහිටා ඇති අතර එමගින් වෛද්‍යපීඨය සඳහා සේවය සපයනු ලබයි.

26.1.2 කුලියාපිටිය පරිශ්‍රයේ පුස්තකාලය

පැරණි පරිපාලන ගොඩනැගිල්ලේ පළමු මහලෙහි කුලියාපිටිය පුස්තකාලය ස්ථාපිතව ඇත. පරිපාලන කාර්යාලය නව ගොඩනැඟිල්ලට ගෙන යාමෙන් පසු සමස්ත පළමු මහල පුරාම පුස්තකාලය ව්‍යාප්ත කෙරිණි. ඒ අනුව වර්ග අඩි 7326කින් සමන්විත මුළු පළමු මහලෙහිම පුස්තකාලය ව්‍යාප්තව පවතී. මෙහි සිසුන් 70 දෙනෙකුට අසුන් ගැනීමේ පහසුව ඇත.

26.1.3 මාකඳුර පරිශ්‍රයේ පුස්තකාලය

මාකඳුර පරිශ්‍රයේ පුස්තකාලය ප්‍රධාන අභ්‍යන්තර මාර්ගයට ආසන්නව, පීඨ දෙක අතර මැද පිහිටා ඇත. මෙම පුස්තකාලය නව දෙමහල් ගොඩනැඟිල්ලකින් සමන්විත වන අතර මෙය 2006 ජූලි මස 27 වන දින විවෘත කරන ලදී. මෙය වර්ග අඩි 7200කින් සමන්විත වන අතර සිසුන් 70 කට අසුන් ගැනීමේ හැකියාව ඇත.

26.1.4 වෛද්‍ය පීඨ පුස්තකාලය - ලබුයාය පරිශ්‍රය

වෛද්‍ය පීඨයේ පරිගණක විද්‍යාගාරය සහ පරිපාලන ගොඩනැගිල්ල අතර ලබුයාය පරිශ්‍ර පුස්තකාලය පිහිටා ඇත මෙම පුස්තකාලය සඳහා වෙනම දෙමහල් ගොඩනැගිල්ලක් ඇති අතර එය දළ වශයෙන් වර්ග අඩි 45,000 කින් සමන්විතය. මෙය ආසන 216 කින් සමන්විත වේ. ගොඩනැගිල්ල 2021 අප්‍රේල් මස 07 වෙනිදින විවෘත කරන ලදී.

ජයග්‍රහණයන්

ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී ඩී ජී ඒ එස් මල්කාන්ති මහත්මිය වැඩ ආවරණය කිරීම සඳහා වැඩ බලන පුස්තකාලයාධිකාරී තනතුරෙහි 2024.01.01 දින සිට මාස හයක කාලයක් කටයුතු කළාය.

සහකාර ලේඛකාධිකාරී (පුස්තකාල සේවා) ඩී එස් එච් එස් ඩබ් හෙට්ටිආරච්චි මහත්මිය 2024. 04.01 දින සිට ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී පුස්තකාල සේවා තනතුරට උසස් වීම් ලැබුවාය

ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී කේ. ජී. අයි. ජයවර්ධන මහතා වැඩ බලන පුස්තකාලයාධිකාරී (වැඩ ආවරණය සඳහා) තනතුරට 2024.06.05 දින සිට2024.12.21 දින දක්වා කාලය සඳහා පත්විය

ඉල්ලා අස්වීම්

ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී ඩී.ජී.ඒ.එස් මල්කාන්ති මහත්මිය 2024.12.30 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී තනතුරින් ඉල්ලා අස්වූවාය.

පුස්තකාල සේවක එච්.ඒ.පී. පී හෙට්ටිආරච්චි මහතා (පුස්තකාල සේවක I ශ්‍රේණිය) පුස්තකාල සේවක පළවන ශ්‍රේණියේ තනතුරින් 2024.09.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවයෙන් ඉල්ලා අස්විය

විශ්‍රාම ලැබීම

ඩී පී එම් දසනායක මහතා (පුස්තකාල සේවක I ශ්‍රේණිය) 2024.08.29 දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවයෙන් විශ්‍රාම ලැබීය

ස්ථාන මාරුවීම්

කුලියාපිටිය ප්‍රධාන පුස්තකාලයේ සේවය කළ ඒ සී එගොඩගේ මහතා (පුස්තකාල සේවක II ශ්‍රේණිය) 2024.03.05 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මාකඳුර පරීශ්‍රයේ පුස්තකාලය වෙත ස්ථාන මාරුවීම් ලැබීය

මාකඳුර පරිශ්‍ර පුස්තකාලයේ පුස්තකාල සේවක පළවන ශ්‍රේණියේ තනතුරෙහි සේවය කළ එච්.ඒ.සී.පී හෙට්ටිආරච්චි මහතා 2024.3.5 දින සිට ක්‍රියාත්මක වන පරිදි කුලියාපිටිය පරිශ්‍රයේ ප්‍රධාන පුස්තකාලය වෙත ස්ථාන මාරුවීම් ලැබීය

අධ්‍යයන නිවාඩු

ඩබ් එම් තුසිතා කුමාරී මහත්මිය (ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී) 2024.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යයන නිවාඩු ලැබුවාය

26.1.5 පුස්තකාලය හඳුන්වා දීමේ වැඩසටහන්

පහත සඳහන් පරිදි කුලියාපිටිය මාකඳුර සහ ලබුයාය පරිශ්‍රයන්හි දී නවක සිසුන් සඳහා පුස්තකාලය හඳුන්වා දීමේ වැඩසටහ සාර්ථකව ක්‍රියාත්මක විය

ව්‍යවහාරිකවිද්‍යා පීඨය	2024 ඔක්තෝබර් 25 දින
ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය	2024 අගෝස්තු 23 දින
පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය	2024 ඔක්තෝබර් 16 සහ 23 දිනයන්
වෛද්‍ය පීඨය	2024 පෙබරවාරි මස 02 දින (06 වෙනි කණ්ඩායම) 2024 දෙසැම්බර් 12 වන දින (07 වෙනි කණ්ඩායම)

26.1.6 සහභාගි වූ වැඩමුළු

- 2024.03.17 වන දින ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී W. M. තුසිතා කුමාරී මහත්මිය විසින් මාර්ගගතව පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨයේ 2022 කණ්ඩායමේ ආහාර තත්ත්වය කළමනාකරණවේදී බාහිර උපාධි පාඨමාලාවේ ආයතනික පැවරුම සහ ඉදිරිපත් කිරීම සඳහා විද්‍යාත්මක සොයා ගැනීම් සඳහා සුහුරු සෙවීම් ක්‍රමවේදයන් ප්‍රගුණ කිරීම යන මැයෙන් පුස්තකාලය හඳුන්වා දීමේ වැඩසටහන සිදුකරන ලදී
- ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ සහකාර පුස්තකාලයාධිකාරී ඒ. පී. එම්. එම්. ඩී. බී. දයානන්ද මහතා 2024.05 මස වන දින කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ කෘෂි ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශයේ තෙවන වසර සිසුන් සඳහා විද්‍යාත්මක ලේඛනය සඳහා කළමනාකරණ මෙවලම්

භාවිතය Reference management tools for scientific writing යන මැයෙන් වැඩමුළුවක් පැවැත්වීය

- ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී W. M. තුසිතා කුමාරී මහත්මිය 2024.06.11 දින පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨයේ ආහාර තත්ත්ව කළමනාකරණ බාහිර උපාධි පාඨමාලාවේ 2022/ 23 අධ්‍යයන වර්ෂයේ ශිෂ්‍ය කණ්ඩායම සඳහා Fqm 3163 Industrial Assignment precentation reference management tool zotero for Scintific Writing යන මැයෙන් මාර්ගගත දේශනය පැවැත්වූවාය
- සහකාර පුස්තකාලයාධිකාරී ඒ. පී. එම්. එම්. ඩී. බී. දයානන්ද මහතා 2024 අගෝස්තු 01 වන දින කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ ජෛව පද්ධති තාක්ෂණ ඉංජිනේරු අධ්‍යයනාංශයේ සිසුන් සඳහා reference management tool for scientific writing යන මැයෙන් වැඩ මුළුවක් පැවැත්විය.
- සහකාර පුස්තකාලයාධිකාරී ඒ. පී. එම්. එම්. ඩී. බී. දයානන්ද මහතා 2024 දෙසැම්බර් මස 21 වන දින පශ්චාද් උපාධි, අපේක්ෂිත බාහිර සිසුන් සඳහා "Unlocking Knowledge: Making the most of Libarary Research strategies to Horness Library Tools for Academic Success" යන මැයින් දැනුවත් කිරීමේ වැඩමුළුවක් පැවැත්වීය.

26.1.7 මාර්ගගත වැඩමුළු

- ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වැඩබලන පුස්තකාලයාධිකාරී තුසිතා කුමාරි මහත්මිය විසින් 2024 ජූලි මස මේ දාහතර Smart searchµng technques for researchers යන මැයෙන් මාර්ගගත වැඩමුළුවක් විද්‍යාර්ථීන් පර්යේෂකයන් සහ පශ්චාද් උපාධි අපේක්ෂක සිසුන් සඳහා පවත්වන ලදී
- සහකාර පුස්තකාලයාධිකාරී ඒ සී එම් එම් ඩී බී දයානන්ද මහතා සහ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී ඩී ජී ඒ එස් මල්කාන්ති මහත්මිය විසින් 2024 ඔක්තෝබර් මස 5 වන දින සහ 2014 ජූලි මස 24 දිනයන්හිදී පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨයේ තෙවන වසර සිසුන් හට හා කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ උද්‍යාන විද්‍යාව හා භූමි අලංකරණ අධ්‍යයනාංශයේ අවසන් වසර සිසුන් සඳහා වැඩමුළුවක් පවත්වන ලදී
- සහකාර පුස්තකාලය ආදිකාරීන් ඒ සී එම් එම් ඩී බී දයානන්ද මහතා විසින්ම පර්යේෂකයන් සහ පශ්චාද් උපාධි අපේක්ෂකයන් සඳහා Reference management tools for Scientific Writing යන මැයෙන් ඔක්තෝබර් මස 03 වන දින මාර්ගගත වැඩමුළුවක් පවත්වන ලදී.

26.1.8 බාහිර ක්‍රියාකාරකම්

2024 ඔක්තෝබර් මස 30 වන දින සාහිත්‍ය මාසය නිමිත්තෙන් විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සහ සිසුන් සඳහා "සිත්තම් රූ රටා දෙදහස් විසිහතර" යන මැයෙන් චිත්‍ර තරගයක් ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයීය පුස්තකාල ජාලය මගින් සංවිධානය කරන ලදී

26.1.9 ලියාපදිංචි පාඨකයෝ

කුලියාපිටිය පුස්තකාලය

පාඨකයෝ	2024.12. 31 දිනට	2024 වර්ෂය තුළ
සිසුන්	4735	788
අධ්‍යයන කාර්ය මණ්ඩලය		
ස්ථිර	117	01
තාව කාලික	55	03
විධායක නිලධාරීන්	28	-
අනධ්‍යයන කාර්ය මණ්ඩලය	214	04

මාකඳුර පරිශ්‍රයේ පුස්තකාලය

පාඨකයෝ	2024.12. 31 දිනට	2024 වර්ෂය තුළ
සිසුන්	2546	544
අධ්‍යයන කාර්ය මණ්ඩලය		
ස්ථිර	79	-
තාව කාලික	130	25
විධායක නිලධාරීන්	7	-
අනධ්‍යයන කාර්ය මණ්ඩලය	87	05

ලබුයාය පරිශ්‍ර පුස්තකාලය

පාඨකයෝ	2024.12. 31 දිනට	2024 වර්ෂය තුළ
සිසුන්	513	108
අධ්‍යයන කාර්ය මණ්ඩලය		
ස්ථිර	15	-
තාව කාලික	32	08
විධායක නිලධාරීන්	01	-
අනධ්‍යයන කාර්ය මණ්ඩලය	12	04

26.1.10 පොත් සහ වාර සඟරා ගිණුම පුස්තකාල ප්‍රතිපාදන

පොත් හා මාසික වාර සඟරා රුපියල් 1,000,000.00

26.1.11 පොත් තොග

පරිග්‍රහණ ලේඛනය අනුව 2024.12.31 දිනට සමස්ත පොත් තොගය

<u>කුලියාපිටිය පරිශ්‍ර පුස්තකාලය</u>

සමස්ත එකතුව 41109

2024 වර්ෂය තුළ ලැබුණු පරිත්‍යාග 46 වටිනාකම 39,930.00

<u>මාකඳුර පරිශ්‍ර පුස්තකාලය</u>

සමස්ත එකතුව 19903

2024 වර්ෂය තුළ ලැබුණු පරිත්‍යාග 18 වටිනාකම රුපියල් 20,966.00

<u>ලබුයාය පරිශ්‍ර පුස්තකාලය</u>

සමස්ත එකතුව 3639

2024 වර්ෂය තුළ ලැබුණු පරිත්‍යාග 152 වටිනාකම රුපියල් 642,128.00

26.1.12 ආදායම - පුස්තකාල දඩ

<u>කුලියාපිටිය පරිශ්‍රය</u>

නැති වූ පොත් සඳහා අය කිරීම්	රු 1970.00
නැති වූ කාඩ් සඳහා අය කිරීම්	-
පුස්තකාල දඩ (ප්‍රමාද ගාස්තු)	රු 37,810.00
එකතුව	රු 39,780.00.

මාකඳුර පරිශ්‍රය

පුස්තකාල දඩ (ප්‍රමාද ගාස්තු) රු 6,518.00

ලබුයාය පරිශ්‍ර පුස්තකාලය

පුස්තකාල දඩ (ප්‍රමාද ගාස්තු) රු 1,885.00

සමස්ත පුස්තකාල පරිශ්‍ර තුනම සඳහා ආදායම රු 48,183.00

පොත් සංරක්ෂණය සඳහා බැඳුම් අංශයේ සංඛ්‍යා ලේඛන

බඳින ලද පොත් ගණන	70
පුස්තකාල අවශ්‍යතා	35
අනෙකුත් අංශ අවශ්‍යතා	35

26.2 ශාරීරික අධ්‍යාපන ඒකකය

26.2.1 හැඳින්වීම

ශාරීරික අධ්‍යාපන අංශය විශ්වවිද්‍යාල ප්‍රජාවගේ විශිෂ්ටතම ක්‍රීඩා සහ නවෝත්පාදන පරිසරයක් සැපයීමෙහි ප්‍රධාන සැපයුම්කරු මෙන්ම එය වැඩිදියුණු කරන්නා ද වෙයි. අපගේ අදහස වන්නේ සෞඛ්‍යය සහ සමබරතාව පිළිබඳ ඉහළ අගයක් සිසුන් සහ කාර්ය මණ්ඩලය සඳහා සපයා දීමත් කාර්යක්ෂමව වැඩ කිරීමේ පරිසරයක් මෙන්ම සෞඛ්‍යමත් ප්‍රීතිමත් ආරක්ෂිත ප්‍රජාවක් බිහිකරලීමේ හැකියාව අප සතු බවයි. 2024 ජනවාරි මස 01 දින සිට දෙසැම්බර් මස 31 ක් දින දක්වා වන මූල්‍ය වර්ෂයේ සිදුකරන ලද අංශය මගින් මෙහෙයවන ලද ක්‍රීරීඩා ක්‍රියාකාරකම් අන්තර්ගත කොට මෙම වාර්තාව පිළියෙළ කර ඇත.

26.2.2 දැක්ම

සමාජයට මනා සමබරතාවකින් යුතු නිරෝගී පුද්ගලයකු බිහිකිරීම සඳහා පුද්ගලයාගේ කායික මානසික සහ සමාජ විද්‍යාත්මක අංශ වර්ධනය කිරීම

26.2.3 මෙහෙවර

අපගේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා ශාරීරික අධ්‍යාපන වැඩසටහන් ඵලදායිව සහ උසස් අන්දමින් යොදා ගැනීම

26.2.4 ශාරීරික අධ්‍යාපන අංශයේ කණ්ඩායම් ව්‍යුහය

අධ්‍යක්ෂක, ශාරීරික අධ්‍යාපන ඉහළ ශ්‍රේණිය
ශාරීරික අධ්‍යාපන උපදේශක ජ්‍යෙෂ්ඨ 01
ශාරීරික අධ්‍යාපන උපදේශක ii ශ්‍රේණිය - 03
මාණ්ඩලික සහකාර ජ්‍යෙෂ්ඨ - 01
ක්‍රීඩා පිටි භාරකරු iii ශ්‍රේණිය
වැඩ සහයක විශේෂ) ශ්‍රේණිය - 01
වැඩ සහයකන් ii ශ්‍රේණිය 01
වැඩ සහයක iii ශ්‍රේණිය - 03

26.2.5 බාහිර උපදේශකවරු

පහත සඳහන් ක්‍රීඩා කටයුතු සඳහා බාහිර උපදේශකයන්ගේ සේවය ලබා ගන්නා ලදී. 2024 වර්ෂයේ දී අපගේ අංශය විසින් අදාළ ක්ෂේත්‍රයන්හි පලපුරුදු උපදේශකවරුන් පහළොස් දෙනෙකු බඳවා ගන්නා ලද අතර පහත සඳහන් ක්‍රීඩා ඉසව් සඳහා පුහුණුකරුවන් ලෙස ඔවුන්ගේ සක්‍රීය දායකත්වය සපයන ලදී.

අංකය	ක්‍රීඩා ඉසව්ව	නම	සුදුසුකම්
01	කැරම්	බී.ඩී.ආර්. කුමාර මහතා	ජාතික ක්‍රීඩක කැරම්
02	ටයිකොන්ඩු	එස් ඒස් එස් අයි ප්‍රනාන්දු මහතා	ලියාපදිංචි පුහුණුකරු
03	චෙස්	යූ ටී නානායක්කාර මහතා	ලියාපදිංචි පුහුණුකරු
04	පාපන්දු	එම් ආර් එන් ඔසීන් මහතා	ලියාපදිංචි පුහුණුකරු

05	රෙස්ට්ලින්	කේ.පී.ඩී ප්‍රියන්ත මහතා	ගුවන් හමුදා පුහුණුකරු
06	කරාතේ	එල් ආර් ආර් ජේ හේරත් මහතා	ජාතික කරාතයේ සංගම් සාමාජික
07	පිහිනුම්	තෙන්නකෝන් මෙයා	ලියාපදිංචි පුහුණුකරු
08	එල්ලේ	.එම් තුෂාර චින්තකමයා	ලියාපදිංචි පුහුණුකරු
09	බැඩ්මින්ටන්	ඩී දිසානායක මෙයා	ලියාපදිංචි පුහුණුකරු
10	රක්බි පාපන්දු	බුද්ධික දිනේෂ්මයා	ලියාපදිංචි පුහුණුකරු
11	බර ඉසිලීම	ආර්. ජී එම් එස් විජේරත්න මයා	පුහුණුකරු ත්‍රිත්ව විද්‍යාලය
12	volleyball	අයි එන් ජයා මයා	බලපත්‍ර ලාභී පුහුණුකරු
13	ක්‍රිකට්	බී පි උබේසේකර මයා	ලියා පදිංචි පුහුණුකරු
14		මිලාන් බොතේජු මයා	AHF Level
15	මේස පන්දු	මධු සංක මයා	TTF Level
16	කබඩි	එම් එම් ඒ විජේසිංහ මයා	ලියා පදිංචි පුහුණුකරු
17	බේස් බෝල්	එච් එයි කේ ප්‍රබුද්ධ මයා	ලියාපදිංචි පුහුණුකරු

26.2.6 වාර්ෂික වැඩසටහන්

වාර්ෂිකව පහත සඳහන් තරග ඉසව් ශාරීරික අධ්‍යාපන අංශය මගින් සංවිධානය කෙරේ.

අන්තර්ජීත නවක ශූරතාවය

විශ්වවිද්‍යාලය තුළ පවත්නා පීත අතර පළමු වසර සිසුන්ගේ ක්‍රීඩා දක්ෂතා එළිදැක්වීම සඳහා මෙම තරග ඉසව්ව ක්‍රියාත්මක වේ. තරගකාරීවවිශ්වවිද්‍යාලය තුළ ක්‍රීඩා කිරීම හඳුන්වා දෙන අතර නවක සිසුන් ලෙස විශ්වවිද්‍යාලයට ප්‍රවේශ වන සිසුන් සඳහා ක්‍රීඩා පිළිබඳ නව හැඟීමකින් යුතුව සෞඛ්‍යමත්ව තරග කිරීම හුරු පුරුදු කෙරේ

අන්තර්ජීය තරගාවලිය

නවක සිසුන්ගේ ශූරතාවට සමගාමීව පීඨයන්හි සියලු වසරවල අධ්‍යාපනය ලබන සිසුන් සඳහා මෙම ක්‍රීඩා තරග විවෘත වේ. පුළුල් පරාසයක පැතිරුණු ක්‍රීඩා තරග ඉසව් ක්‍රියාත්මක කෙරේ.

අන්තර් විශ්වවිද්‍යාල ශූරතාව

විවිධ විශ්වවිද්‍යාලවල තරගකරුවන් සම්බන්ධ කර ගනිමින් පුළුල් පරාසයක පැතිරුණු තරග රාශියක් සමඟ මෙම අන්තර් විශ්වවිද්‍යාල තරග පැවැත්වේ

දායකත්වය දරන විශ්වවිද්‍යාලයේ තරගකරුවන් වෙනත් විශ්වවිද්‍යාලවල තරගකරුවන් සමග තරග වදී

වර්ණ ප්‍රදාන උත්සවය

විශේෂ දක්ෂතා පළකළ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ගෞරවයක් ලබාදීම පිණිස මෙම වර්ණ ප්‍රදානය සිදු කෙරේ

වර්ණයන්ගෙන් සංකේතවත් වන්නේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ කැපී පෙනෙන ලක්ෂණ පෙන්නුම් කරන ලද ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ත්‍යාග සහ සහතික පත් ලබා දීමයි

නිර්මාණාත්මක වැඩසටහන්

මෙම වැඩසටහන් සඳහා තරගකාරී නොවන විනෝදාත්මක භෞතික වැඩසටහන් සංවිධානය කරන අතර එමගින් සමස්ත යහපත සහ කායික නිරෝගීතාව ඇති කරයි. මෙම නිර්මාණාත්මක වැඩසටහන් මගින් පුළුල් පරාසයක පැතිරුණු දක්ෂතා කැමැත්ත මගින් සිසුන් තුළ විනෝදකාමී අදහස් වර්ධනය වීමත් තරග කිරීමත් සිදුවෙයි

ශාරීරික යෝග්‍යතා වැඩසටහන්

මෙම වැඩසටහන්වල දී වඩාත් අවධානය යොමු කරවන්නේ සෞඛ්‍යමත් ජීවන රටාවකට හුරු කරවීම සහ ශාරීරික යෝග්‍යතාව රැක ගැනීමයි. ඊට අයත් වන්නේ යෝග්‍යතා පන්ති, වැඩමුළු, සහභාගී වන්නන්ගේ ශාරීරික යෝග්‍යතාව වර්ධනය වන ආකාරයේ අභියෝගාත්මක අංගයන්ය.

නම්නීකරණ වැඩසටහන්

ශාරීරික අධ්‍යාපන අංශයේ ක්‍රියාපටිපාටිය සහ කාර්යයන් නවක සිසුන්ට හඳුන්වා දීම සඳහා මෙම වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

තොරතුරු ලබාදීමේ වැඩසටහන් පහසුකම් හඳුන්වා දීමේ චාරිකා ශාරීරික අධ්‍යාපන ඒකකයේ සම්පත් හා අවස්ථා සඳහා සිසුන් හුරුකරවීම සඳහා වන වැඩසටහන් ආදිය මීට අන්තර්ගතය.

2024 අන්තර් විශ්වවිද්‍යාල ශූරතාවය 2024 අගෝස්තු මස 22වන දින සිට දෙසැම්බර් මස පළවන දින දක්වා ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමය මගින් හතළිස් තුන්වන අන්තර් විශ්වවිද්‍යාල ශූරතා තරග ඉසව් සංවිධානය කරන ලදී. විවිධ විශ්වවිද්‍යාල පරිශ්‍රයන්හි දී ක්‍රීඩා තරග ඉසව් 24ක් සංවිධානය කෙරිණ.

අන්තර් විශ්වවිද්‍යාල දැල්පන්දු ශූරතාව ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමය වෙනුවෙන් ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය උදිත් කේ ජයසිංහ මහතාගේ අනුශාසකත්වය යටතේ 2024 නොවැම්බර් මස 08 දින සිට 10 දින දක්වා ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ දී මෙම දැල්පන්දු ශූරතාව සංවිධානය කෙරිණි. සියලුම විශ්වවිද්‍යාල නියෝජනය කරමින් ශිෂ්‍යාවන් 182ක් කණ්ඩායම් 16 සහ නිලධාරීන් 26 මේ සඳහා සහභාගි වූ හ.

26.2.7 ජයග්‍රහණ

සමස්ත ජයග්‍රහණය දහවෙනි ස්ථානය (16 ක් අතරින්)

කේවල ඉසව්

ඉසව්ව	වර්ගය	ගැහැනු පිරිමි	නම	ස්ථානය
මල්ලව පොර	65 Kg	පිරිමි	ඩබ් එම් වී සි ඩී විධෙතුංග	තෙවන
	70 Kg	පිරිමි	ඩබ් පි ඩී එරන්ද	තෙවන
	86 Kg	පිරිමි	කේ එස් එස් ඩීකුමාර	තෙවන
	92 Kg	පිරිමි	එඩී එම් එන් ධේ කරුනාරත්න	තෙවන
බර ඉසිලීම	52 Kg	පිරිමි	එස් සි එල් ප්‍රනාන්දු	දෙවන
	81 Kg	පිරිමි	එස් ඒ පි බී සේනානායක	දෙවන

ටයිකුන්ඩු	කේවල කණ්ඩායම්	පිරිමි	එස් පි එල් ප්‍රනාන්දු	තෙවන
		පිරිමි	එස් ඒ පි බී සේනානායක	
			එස් සි එල් ප්‍රනාන්දු	
	74-80 Kg	පිරිමි	එස් ජේ එම් රවිහාන්	දෙවන
	80-87 Kg			
		පිරිමි	එච් යූ වීරසිංහ	තෙවන

2024 අන්තර් විශ්වවිද්‍යාල ශූරතා සහභාගීත්වය

පීඨය	ව්‍යවහාරිකවිද්‍යා	කෘෂිකර්ම	ව්‍යාපාර අධ්‍යයන	පශු සම්පත් ධීවර හා පෝෂණ	වෛද්‍ය	තාක්ෂණ	එකතුව
පිරිමි	28	19	97	11	5	94	254
ගැහැණු	13	23	45	20	1	13	115
එකතුව	41	42	142	31	6	107	369
සමස්ත ලියාපදිංචි සංඛ්‍යාව	712	1231	2411	439	657	946	6393
සහභාගීත්වය ප්‍රතිශතය	5.75	3.40	5.88	7.06	0.91	11.31	5.76

26.2.8 නම්නීකරණ වැඩසටහන්

නම්නීකරණ වැඩසටහන් නවක ශිෂ්‍යයන් දැනුවත් කිරීම සඳහා සංවිධානය කරන ලදී මාර්ගගත සහ පෞද්ගලික සහභාගිත්වයෙන් සියලු පීඨයන්හි සිසුන් සඳහා නම්නීකරණ වැඩසටහන් පවත්වන ලද අතර මෙහි ප්‍රාථමික අරමුණ වූයේ ශාරීරික අධ්‍යාපන අංශය පිළිබඳව ප්‍රාමාණික අන්දමින් නවක සිසුන් දැනුවත් කිරීමයි

මෙම සැසි මඟින් දැක්ම සහ මෙහෙවර පිළිබඳව අවබෝධය ලබාදෙන අතරන් ප්‍රමාණික වෘත්තීය අංශ පිළිබඳ දැනුවත් කිරීම ද මෙහි දී සිදුවේ. තවද විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සක්‍රීයව ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන ක්‍රියාකාරකම්වල යෙදෙමින් අනාගත වාසි සලකා ගැනීම පිළිබඳ ශිෂ්‍යයන් මෙමගින් මෙහෙය වේ මාර්ගගත සහ රීය ප්‍රායෝගික ක්‍රමවේදයන් මගින් සියලු සිසුන් සඳහා තොරතුරු සහිත කැපවීමෙන් අත්පත් කරගත යුතු ශාරීරික අධ්‍යයන අංග පිළිබඳව මෙහි දී ප්‍රායෝගික අත්දැකීම් මගින් දැනුවත් වීම සිදුවේ

26.2.9 ක්‍රීඩා විද්‍යාව සහ අනාගතය පිළිබඳ වැඩමුළුව

2024 පෙබරවාරි මස 02 දින පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨයේ ව්‍යවහාරික පෝෂණ අධ්‍යයනාංශයේ තෙවන වසර සිසුන් සඳහා ක්‍රීඩා විද්‍යාව සහ අභ්‍යාස පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී ක්‍රීඩා සහ ශාරීරික යෝග්‍යතාව මෙන්ම අධ්‍යයන විශේෂේත්‍රය පිළිබඳවද දැනුම පුළුල් කර ගැනීම පිණිස එම වැඩමුළු මහඟු අවස්ථාවක් විය

26.2.10 ප්‍රාදේශීය සෞඛ්‍ය සංවර්ධනය සඳහා දායකත්වය

ප්‍රාදේශීය ක්‍රීඩා සංවර්ධන සඳහා සේවය සැපයීම අප විසින් සිදු කෙරෙන අතර ප්‍රධාන වශයෙන්සෞඛ්‍ය හා ක්‍රීඩා වැඩසටහන් පැවැත්වීම මෙන් ම උපකරණ හා පහසුකම් සැපයීම ද සිදු කෙරේ

දිනය	ආයතනය හෝ සමාගම	ඉසව්ව	කාලය
2024.03.22	එච් එස් එස් සිල්වා මයා	වොලිබෝල්	අර්ධ දින
2024.03.27	එච් එස් එස් සිල්වා මයා	වොලිබෝල්	අර්ධ දින
2024.10.21	ධම්මිස්සර ජාතික පාසල	වොලිබෝල්	අර්ධ දින
2024.10.22	ධම්මිස්සර ජාතික පාසල	වොලිබෝල්	අර්ධ දින
2024.10.23	ධම්මිස්සර ජාතික පාසල	වොලිබෝල්	අර්ධ දින
2024.10.25	ධම්මිස්සර ජාතික පාසල	වොලිබෝල්	අර්ධ දින
2024.10.28	ධම්මිස්සර ජාතික පාසල	වොලිබෝල්	අර්ධ දින
2024.10.29	ධම්මිස්සර ජාතික පාසල	වොලිබෝල්	අර්ධ දින
2024.10.30	ධම්මිස්සර ජාතික පාසල	වොලිබෝල්	අර්ධ දින
2024.11.01	ධම්මිස්සර ජාතික පාසල	වොලිබෝල්	අර්ධ දින

26.2.11 මූල්‍ය ප්‍රකාශය

අංක	විස්තරය	මුදල රු
01	ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමයේ සාමාජිකත්වය හා වාර්ෂික දායකත්වය	205,000.00
02	අන්තර් විශ්වවිද්‍යාල ක්‍රීඩා	862,818.09
03	ක්‍රීඩා තරංග සංවිධාන අන්තර් විශ්වවිද්‍යාල දැල්පන්දු ශූරතාව 2024	659,881.91
04	අන්තර්පීඨ නවක තරග	866.00
05	අන්තර්පීඨ තරග	887.00
06	ජතික තරඟ	4,4250.00

07	වෙනත් තරග	4,939.00
08	ජාතික සංගම් ගෙවීම්	24,000.00
09	ආරාධිත උපදේශක ගෙවීම්	641,811.00
10	පිහිනුම් තටාකය වෙන්කිරීම	104,000.00
11	සහතික පත්‍ර මුද්‍රණය	30,500.00
12	සුළු මුදල්	119,228.50
13	ක්‍රීඩා ඇඳුම් සඳහා ගෙවීම	1,306,000.00
14	ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම	2,334,340.00
15	වෙනත් උපකරණ	1,708,523.00
16	වාර්ෂික සමස්ත වියදම	5,240,591.50

වාර්ෂික සමස්ථ ආදායම

ගෘහස්ථ ක්‍රීඩාගාරය වෙන් කිරීම 90,000.00

සමස්ත වාර්ෂික ආදායම 90,000.00

26.2.12 යෝජනා

- අන්තර්පීඨ නවක ශූරතාව සහ අන්තර්පීඨ ශූරතාව සඳහා පහසුකම් සැපයෙන අන්දමින් සෑම වසරකම අධ්‍යයන කාලසටහන් සමගාමීව ක්‍රියාත්මක කිරීම
- විශ්වවිද්‍යාල ක්‍රීඩා තුළින් උසස් දස්කම් දක්වන සිසුන් සඳහා GPA අගයන් අමතරව එකතු කිරීමේ ක්‍රමයක් සැකසීමෙන් (විශ්වවිද්‍යාල වර්ණ විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගම් වර්ණ ජාතික විශ්වවිද්‍යාල ක්‍රීඩා නියෝජනය අන්තර්ජාතික නියෝජනය ආදිය සලකා බැලිය හැකියි)
- අවම වශයෙන්ම සවස හතරයි තිහ වන විට සිසුන් අධ්‍යයන කටයුතුවලින් නිදහස් කිරීම
- සිසුන්ගේ ක්‍රීඩා කටයුතු සඳහා සම්බන්ධ වීම දිරිමත් කිරීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහයෝගය වැඩි කිරීම. විශ්වවිද්‍යාල නියෝජනය කරමින් සිසුන් ක්‍රීඩා කටයුතු සඳහා සහභාගී වන විට දේශනවලින් නිදහස් කරලීම.

26.3 වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය 2003 ජනවාරි මස ස්ථාපනය කරන ලද්දකි. මෙය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මඟපෙන්වීම යටතේ පිහිටුවන ලද අතර විශ්වවිද්‍යාල සිසුන්ගේ වෘත්තීය හා මෘදු කුසලතා ඉහළ නැංවීමේ අභිලාශයෙන් පිහිටුවන ලදී. ඒ අනුව විශ්වවිද්‍යාලයීය සිසුන් හා ආයතන අතර යම් සබඳතාවක් මේ හරහා ගොඩ නැඟෙයි. ආරම්භයේ සිට වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය මගින් ඉහත පරමාර්ථය පදනම් කොටගත් නොයෙකුත් අවස්ථාවන් සංවිධානය කරනු ලැබ ඇත. මෙම අංශය උපකුලපති තුමා යටතේ සෘජුව පාලනය වෙයි.

තම අධ්‍යයන පසුබිමේ සිට වෘත්තීය ඉලක්කයන් කරා යොමුවීමට සිසුන්ට සාර්ථක දිරිගැන්වීමක් වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය මගින් සිදු කෙරේ. මේ අනුව වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය සමබර අන්දමින් සෘජු සේවා, අධ්‍යාපන වැඩසටහන් සහ සම්පත් දායකත්වය ආදිය සැපයීම සිදු කොට ඇත.

ඒ අනුව ශිෂ්‍යයන්ට

- අර්ථවත් රැකියා සොයාගැනීමට උපකාරී වීම
- පුහුණුව සඳහා ආයතන සොයාගැනීම
- ඔවුන්ගේ වෘත්තීය අභිලාශයන්ට සරිලන පරිදි අමතර අධ්‍යාපන සුදුසුකම් ලබාගැනීමට උපකාරී වීම

යන පහසුව ලැබෙයි.

ව්‍යාපෘති සඳහා සහභාගී වීමට සිදුවන උපාධි අපේක්ෂකයනට මෘදු කුසලතා පිළිබඳ වැඩමුළු සහ සම්මන්ත්‍රණ, ව්‍යවසායකත්ව සහ අනෙකුත් ක්ෂේත්‍රයන්හි පුද්ගල සංවර්ධන වැඩසටහන් ප්‍රයෝජනවත් වෙයි.

වෙළඳ ලෝකයේ පැවැත්ම සඳහා ඔවුන්ට මේවා අතිශයින්ම වැදගත් වෙයි. මෙම වැඩසටහන් සඳහා සහභාගි වන සිසුන් පමණක් පෞද්ගලික සම්මුඛ පරීක්ෂණ ස්වභාවයෙන් පවත්වනු ලබන වෘත්තීය වෙළඳපොළ (Job Fair) (පෞද්ගලික ආයතන සහ සිසුන්ගේ සහභාගීත්වයෙන් සිදු කෙරෙන) සඳහා සහභාගිවීමට සුදුසුකම් ලබති.

26.3.1 දැක්ම

තාක්ෂණික දියුණුව හා අනෙකුත් නවෝත්පාදන මෙන් ම දේශීය හා ගෝලීය මට්ටමින් භෞතික හා මාර්ගගත වැඩ වේදිකාවල යොදාගන්නා බැවින් බුද්ධිමය නම්‍යශීලීත්වයක් ඇති සේවා නියුක්තිකයන් සඳහා අනාගත ලෝකයේ වෙනස් වන ඉල්ලීමට සක්‍රීය ලෙස ප්‍රතිචාර දක්වනු ලබන ප්‍රශස්ත මධ්‍යස්ථානය බවට පත්වීම සඳහා වයඹ විශ්වවිද්‍යාලයීය වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය සියලු ප්‍රයත්න දරයි


26.3.2 මෙහෙවර

පුද්ගල වෘත්තීය සංවර්ධනය සඳහා වෘත්තීය ඉලක්ක වර්ධනය කර ගැනීම පලපුරුද්ද සමඟින් ඉගෙනුම් අවස්ථා ප්‍රවර්ධනය කිරීම රැකියා සපයා ගැනීම සහ වෘත්තීය ජීවිතයට පිවිසීම සඳහා සහාය ලබාදීම සහ බුද්ධිමය නම්‍යශීලීත්වය සහ රැකියා ජීවන සමතුලිතතාව සහිත ආයතනික පුරවැසියෙකු බවට පත්වීම සඳහා උපකාරී වන පුළුල් පරාසයන් වැඩසටහන් සංවිධානය කිරීමත් සේවා යෝජකයන් සමඟ හවුල්කාරීත්වය ගොඩනැගීම සහ පවත්වා ගැනීම ඇතුළු ජීවිත කාලය පුරාම සිදුවන ක්‍රියාවලියක් ලෙස වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය ක්‍රියාත්මක වේ

26.3.3 අරමුණු

- වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ අරමුණු පුළුල් පරාසයක පැතිරී පවතී
- සිසුන්හට වෘත්තීය මාර්ගෝපදේශනය ලබාදීම
- වෘත්තිය තොරතුරු සේවාව පවත්වාගෙන යාම
- සිසුන් ජාලකරණය පිළිබඳව මනා දැනුමෙන් සන්නද්ධ කිරීම
- රැකියා ස්ථානයේ අත්දැකීම් ලබාදීම
- කර්මාන්ත ආයතනවල ස්ථානගතවීම සඳහා සිසුන් හට සහායවීම
- වෘත්තීය මාර්ගෝපදේශන පාඨමාලා ඒකක විෂය මාලාව සමග ඒකාබද්ධ කිරීමත් සිසුන් හට මඟ පෙන්වීම සහ ඔවුන්ගේ වෘත්තීය කුසලතා වැඩිදියුණු කරලීම
- අරමුණු ළඟා කර ගැනීම සඳහා වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය විසින්ම කර්මාන්තායතන සමඟත් සහසම්බන්ධකම් ගොඩනඟා ගැනීම මගින් පුළුල් පරාසයක වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සංවිධානය කිරීම මගින් සිසුන්ට වැඩ ලෝකයට නිරාවරණය වීමට වැඩි අවස්ථා සපයනු ඇත. ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය මගින් සේවයෙහි යෙදවිය හැකි උපාධිධාරීන් නිර්මාණය කිරීමේ අවශ්‍ය ඒකකයක් බවට වෘද්ධිය මාර්ගෝපදේශනයක් පත්වනු ඇත
- ඔවුන් පෞද්ගලික රාජ්‍ය අංශවල මෙන්ම රාජ්‍ය නොවන සංවිධානවල ගෝලීය හා දේශීය ආයතනවල විශිෂ්ටයන් බවට පත්වනු ඇත

26.3.4 අපගේ සංවිධාන ව්‍යුහය



26.3.5 කාර්ය මණ්ඩල තොරතුරු

තනතුර	නම
වෘත්තීය මාර්ගෝපදේශන අධ්‍යක්ෂ	ආචාර්යයෙන් ඒ ජේ.පී වික්‍රමසිංහ මහතා
වෘත්තීය උපදේශක	ගාමිණී ජයසූරිය මහතා
කළමනාකරණ සහකාර	සංජීව ජනක සිරිමයා
වැඩ සහයක	පුරප්පාඩුව පවතී

මීට අමතරව පහත සඳහන් පරිදි එක් එක් පීඨයන් එක් එක් සම්බන්ධකාරකයකු බැගින් පීඨ හය සඳහා සම්බන්ධීකාරකවරුන් හය දෙනෙක් පත් කර ඇත

සම්බන්ධීකාරකවරයාගේ නම	**පීඨය**
ඩී ඩන්ස්ෆෝර්ඩ් මයා	කෘෂිකර්ම හා වැවිදි කළමනාකරණ පීඨය
ඒ ජෝතිරත්න මිය	ව්‍යවහාරිකවිද්‍යා පීඨය
ඒ ජයසංඛ මහතා	ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය
ඒ. එච්.එම්. යූ අධිකාරි මිය	පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය
ආචාර්ය යූ ලියනාරච්චි මයා	තාක්ෂණ පීඨය
වෛද්‍ය එච්.එම්.පී.ඩී හේරත් මිය	වෛද්‍ය පීඨය

26.3.6 පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන්

❖ ක්‍රියාකාරකම 01

ක්‍රියාකාරකම - 2023 දෙවන අධියර සහතිකපත්‍ර ප්‍රධානය
දිනය - 2024.01.29
විස්තරය - ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන අධිකාරියේ සහයෝගයෙන් සංවිධානය කරන ලදී.
සම්පත් දායකත්වය - ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන අධිකාරිය (NEDA)
විශ්වවිද්‍යාල ක්‍රියාකාරී සැලැස්මේ - අරමුණ වඩාත් සංවිධිත වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම
- පුද්ගල සංවර්ධනය සහ කුසලතා සංවර්ධනය
ඉලක්ක ක්ෂේත්‍රය - ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය
ඉලක්ක කණ්ඩායම - සිසුන් 50
ස්ථානය - මාකඳුර පරිශ්‍රය

❖ ක්‍රියාකාරකම 02

ක්‍රියාකාරකම - Literature Survey and Literature Review වැඩමුළුව
ව්‍යවහාරික විද්‍යා පීඨය
දිනය - 2024.02.15
විස්තරය - Literature Survey and Literature Review
සම්පත් දායකත්වය - කේ ජී අයි ජයවර්ධන මහතා ඒ පී එම් එම් ඩී බී දයානන්ද මහතා
විශ්වවිද්‍යාල ක්‍රියාකාරී සැලැස්මේ අරමුණ - 2.2.6 පුද්ගල සංවර්ධනයට කුසලතා සංවර්ධනයට අදාළ වැඩසටහන්
3.1.9 වෘත්තීය සංවර්ධන කටයුතු අඛණ්ඩව මෙහෙය වීම
ඉලක්ක ක්ෂේත්‍රය - ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය
ඉලක්ක කණ්ඩායම - ව්‍යවහාරිකවිද්‍යා පීඨයේ සිව්වන වසර සිසුන්
සහභාගි වූ පිරිස - සිසුන් 95
ස්ථානය - ව්‍යවහාරිකවිද්‍යා පීඨය

❖ **ක්‍රියාකාරකම 03**

ක්‍රියාකාරකම - වෛද්‍ය පීඨ උපාධි අපේක්ෂකයින් සඳහා රැකියා අවස්ථා තේරීම.
දිනය - 2024. 02.20
විස්තරය - මෙම වැඩසටහනේ සම්පත්දායකයා විසින් වෛද්‍ය උපාධිධාරීන් සඳහා වන රැකියා අවස්ථා පිළිබඳව විස්තර කරන ලදී. විවිධ රැකියා ඔස්සේ යොමු වීමේ වාසි අවාසි මෙහි දී පැහැදිලි කරන ලදී. අවසානයේ සම්පත් දායකයා විසින් ප්‍රශ්න සහ පිළිතුරු සැසියක් ද පවත්වන ලදී

සම්පත් දායකත්වය - වෛද්‍ය එච්.එම්.ටී.ඩී. හේරත් මහතා.
විශ්වවිද්‍යාල ක්‍රියාකාරී සැලැස්මේ අරමුණ - 2.2.6 පුද්ගල සංවර්ධනයට කුසලතා සංවර්ධනයට අදාළ වැඩසටහන්
3.1.9 වෘත්තීය සංවර්ධන කටයුතු අඛණ්ඩව මෙහෙය වීම
ඉලක්ක ක්ෂේත්‍රය - පාසලේ සිට විශ්වවිද්‍යාලය දක්වා තරුණ පුද්ගල පරිවර්තනය සඳහා පහසුකම් සැපයීම

ඉලක්ක කණ්ඩායම - වෛද්‍ය පීඨයේ ප්‍රථම වසර සිසුන්
සහභාගි වූ පිරිස - සිසුන් 150
ස්ථානය - ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයීය වෛද්‍ය පීඨය

❖ **<u>ක්‍රියාකාරකම 04</u>**
ක්‍රියාකාරකම - පර්යේෂණ ක්‍රම විද්‍යාව පිළිබඳව වැඩමුළුව ව්‍යාවහරිකවිද්‍යා පීඨය
දිනය - 2024.02.25
විස්තරය - පර්යේෂණ ක්‍රියාවලිය පිළිබඳව සිසුන් දැනුවත් කිරීම
සම්පත් දායකත්වය - ආචාර්ය බී.එස් හබරාගොඩ මෙය
විශ්වවිද්‍යාල ක්‍රියාකාරී සැලැස්මේ අරමුණ - 2.2.6 පුද්ගල සංවර්ධනයට කුසලතා සංවර්ධනයට අදාළ වැඩසටහන්
3.1.9 වෘත්තීය සංවර්ධන කටයුතු අඛණ්ඩව මෙහෙය වීම

ඉලක්ක ක්ෂේත්‍රය - පාසලේ සිටවිශ්වවිද්‍යාලය දක්වා තරුණ පුද්ගල පරිවර්තනය සඳහා පහසුකම් සැපයීම
ඉලක්ක කණ්ඩායම - ව්‍යවහාරිකවිද්‍යා පීඨයේ සිව්වන වසර සිසුන්
සහභාගි වූ පිරිස - සිසුන් 95
ස්ථානය - ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරිකවිද්‍යා පීඨය

❖ **<u>ක්‍රියාකාරකම 05</u>**
ක්‍රියාකාරකම - පර්යේෂණ ක්‍රම විද්‍යාව පිළිබඳ වැඩමුළුව II - ව්‍යවහාරිකවිද්‍යා පීඨය
දිනය - 2024.02.20
විස්තරය - පර්යේෂණ ක්‍රියාවලිය පිළිබඳව සිසුන් දැනුවත් කිරීම
සම්පත් දායකත්වය - ආචාර්ය බී එස් හබරාගොඩ මෙය
විශ්වවිද්‍යාල ක්‍රියාකාරී සැලැස්මේ අරමුණ - 2.2.6 පුද්ගල සංවර්ධනයට කුසලතා සංවර්ධනයට අදාළ වැඩසටහන්
3.1.9 වෘත්තීය සංවර්ධන කටයුතු අඛණ්ඩව මෙහෙය වීම
ඉලක්ක ක්ෂේත්‍රය - පාසලේ සිට විශ්වවිද්‍යාලය දක්වා තරුණ පුද්ගල පරිවර්තනය සඳහා පහසුකම් සැපයීම
ඉලක්ක කණ්ඩායම - ව්‍යවහාරිකවිද්‍යා පීඨයේ සිව්වන වසර සිසුන්
සහභාගි වූ සංඛ්‍යාව - සිසුන් 95
ස්ථානය - ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරිකවිද්‍යා පීඨය

❖ **<u>ක්‍රියාකාරකම 06</u>**
ක්‍රියාකාරකම - තාක්ෂණ පීඨ සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය හඳුන්වා දීම
දිනය - 2024 03 06
විස්තරය - ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ කාර්යභාරය හා සේවාවන් පිළිබඳව තොරතුරු දැනුවත් කිරීම සඳහා මෙහෙයවන ලද වැඩ මුළුවකි
සම්පත් දායකත්වය - වෘත්තීය මාර්ගෝපදේශක ගාමිණී ජයසූරිය මහතා

විශ්වවිද්‍යාල ක්‍රියාකාරී සැලැස්මේ අරමණු - 2.2.6 පුද්ගල සංවර්ධනයට කුසලතා සංවර්ධනයට අදාළ වැඩසටහන්
3.1.9 වෘත්තීය සංවර්ධන කටයුතු අඛණ්ඩව මෙහෙය වීම

ඉලක්ක ක්ෂේත්‍රය - පාසලේ සිට විශ්වවිද්‍යාලය දක්වා තරුණ පුද්ගල පරිවර්තනය සඳහා පහසුකම් සැපයීම
ඉලක්ක කණ්ඩායම - තාක්ෂණ පීඨයේ ප්‍රථම වසර උපාධි අපේක්ෂකයන්
සහභාගි වූ සංඛ්‍යාව - සිසුන් 80
ස්ථානය - ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය

❖ **<u>ක්‍රියාකාරකම 07</u>**

ක්‍රියාකාරකම - තාක්ෂණ පීඨයේ සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන වැඩමුළුව
දිනය - 2024.03.18
විස්තරය - අනාගත වැඩ ලෝකය සහ වෘත්තීය පිළිබඳව උපාධි අපේක්ෂක සිසුන් දැනුවත් කිරීම
සම්පත් දායකත්වය - වෘත්තීය මාර්ගෝපදේශක S D ගාමිණී ජයසූරිය මහතා
විශ්වවිද්‍යාල ක්‍රියාකාරී සැලැස්මේ අරමුණු - 2.2.6 පුද්ගල සංවර්ධනයට කුසලතා සංවර්ධනයට අදාළ වැඩසටහන්
3.1.9 වෘත්තීය සංවර්ධන කටයුතු අඛණ්ඩව මෙහෙය වීම
ඉලක්ක ක්ෂේත්‍රය - වෘත්තිය පිළිබඳ උපදේශනය සහ උපදේශන සේවා වෘත්තීය තොරතුරු සම්පාදනය
ඉලක්ක කණ්ඩායම - තාක්ෂණ පීඨයේ ප්‍රථම වසර උපාධි අපේක්ෂකයන්
සහභාගි වූ සංඛ්‍යාව - සිසුන් 150
ස්ථානය - ශ්‍රවණාගාරය නව නැනෝ විද්‍යා ගොඩනැගිල්ල

❖ **<u>ක්‍රියාකාරකම 08</u>**

ක්‍රියාකාරකම - කණ්ඩායම් නිර්මාණය පිළිබඳ වැඩමුළුව - තාක්ෂණ පීඨය
දිනය - 2024.03.25
විස්තරය - කණ්ඩායම් ගොඩනැගීම පිළිබඳ උපාධි අපේක්ෂකයන් දැනුවත් කිරීම
සම්පත් දායකත්වය - සංජීව ජනකසිරි මහතා
විශ්වවිද්‍යාල ක්‍රියාකාරී සැලැස්මේ අරමුණු - 2.2.6 පුද්ගල සංවර්ධනයට කුසලතා සංවර්ධනයට අදාළ වැඩසටහන්
3.1.9 වෘත්තීය සංවර්ධන කටයුතු අඛණ්ඩව මෙහෙය වීම
ඉලක්ක ක්ෂේත්‍රය - වෘත්තීය පිළිබඳව උපදේශනය සහ ප්‍රචාරණය කෘතීන්වලට අදාළ තොරතුරු සැපයීම
ඉලක්ක කණ්ඩායම - තාක්ෂණ පීඨයේ ප්‍රථම වසර උපාධි අපේක්ෂකයන්
සහභාගි වූ සංඛ්‍යාව - සිසුන් 150
ස්ථානය - නව නැනෝවිද්‍යා ගොඩනැගිලි ශ්‍රවණාගාරය

❖ **<u>ක්‍රියාකාරකම් 09</u>**

ක්‍රියාකාරකම - රැකියා සංවර්ධනය උදෙසා ධනාත්මක චින්තනය සහ තාක්ෂණය තුන්වන සැසිය
දිනය - 2024.05.10
විස්තරය - තාක්ෂණය සමඟ ධනාත්මක චින්තනය සම්බන්ධ කිරීම රැකියා සංවර්ධනය උදෙසා දුෂ්කර කටයුත්තකි මෙමගින් විශ්වාසය නිර්මාණාත්මකතාව ප්‍රශ්න විසඳීම අඛණ්ඩ අධ්‍යාපනය තාක්ෂණික මෙවලම් භාවිතයෙන් කුසලතා සංවර්ධනය සහ වෘත්තිය ජාලකරණය ආදිය පිළිබඳව දැනුවත් කෙරේ.
පරමාර්ථය - විශ්වවිද්‍යාල උසස් තත්ත්වයට පමුණුවාලීම

සම්පත් දායකයින් - ආචාර්ය එච් කේ ජේ වික්‍රමසිංහ අධ්‍යක්ෂ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
එස්.ඩී.ගාමිණී ජයසූරිය මහතා - වෘත්තීය මාර්ගෝපදේශක
සංජීව ජනකසිරි මහතා
ඉලක්ක ක්ෂේත්‍රය - ක්ෂේත්‍රයේ ජාලකරණය
ඉලක්ක කණ්ඩායම - මීගමුව අධ්‍යාපන කලාපයේ අලුතින් බඳවා ගන්නා ලද පාසල් ගුරුවරු
සහභාගි වූ පිරිස - ගුරුවරු 80
ස්ථානය - පඤ්ඤානන්ද ප්‍රාථමික පාසල, රද්දොළුගම

❖ **<u>ක්‍රියාකාරකම 10</u>**

ක්‍රියාකාරකම - ධනාත්මක චින්තනය හා තාක්ෂණය වෘත්තීය සංවර්ධනය උදෙසා යොදා ගැනීම (දෙවන සැසිය)
දිනය - 2024 5.11
විස්තරය - තාක්ෂණය සමඟ ධනාත්මක චින්තනය සම්බන්ධ කිරීම, රැකියා සංවර්ධනය උදෙසා දුෂ්කර කටයුත්තකි. මෙමගින් විශ්වාසය නිර්මාණාත්මකතාව, ප්‍රශ්න විසඳීම අඛණ්ඩ අධ්‍යාපනය, තාක්ෂණික මෙවලම් භාවිතයෙන් කුසලතා සංවර්ධනය සහ වෘත්තිය ජාලකරණය ආදිය පිළිබඳව දැනුවත් කෙරේ.
පරමාර්ථය - විශ්වවිද්‍යාල උසස් තත්ත්වයට පමුණුවාලීම
සම්පත් දායකයින් - ආචාර්ය එච් කේ ජේ වික්‍රමසිංහ අධ්‍යක්ෂ
එස්.ඩී.ගාමිණී ජයසූරිය මහතා - වෘත්තීය මාර්ගෝපදේශක
සංජීව ජනකසිරි මහතා
ඉලක්ක ක්ෂේත්‍රය - ක්ෂේත්‍රයේ ජාලකරණය
ඉලක්ක කණ්ඩායම - මීගමුව අධ්‍යාපන කලාපයේ අලුතින් බඳවා ගන්නා ලද පාසල් ගුරුවරු
සහභාගි වූ පිරිස - ගුරුවරු 80
ස්ථානය - මීගමුව

❖ **<u>ක්‍රියාකාරකම 11</u>**

ක්‍රියාකාරකම - ජීවදත්ත පත්‍රිකා පිළියෙළ කිරීම
දිනය - 2024.05.14
විස්තරය - උපාධි අපේක්ෂකයන් ජීවදත්ත පත්‍රිකා පිළියෙළ කිරීම සහ රැකියා සඳහා පෙනී සිටම පිළිබඳව දැනුවත් කිරීම
සම්පත් දායකත්වය - අනෝජා ජෝතිරත්න මිය, පීඨ සම්බන්ධීකාරක වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය ව්‍යවහාරිකවිද්‍යා පීඨය
විශ්වවිද්‍යාල ක්‍රියාකාරී සැලැස්මේ අරමුණු - 2.2.6 පුද්ගල සංවර්ධනයට කුසලතා සංවර්ධනයට අදාළ වැඩසටහන්
3.1.9 වෘත්තීය සංවර්ධන කටයුතු අඛණ්ඩව මෙහෙය වීම
ඉලක්ක ක්ෂේත්‍රය - මාර්ගෝපදේශනය සහ වෘත්තීන් පිළිබඳව තොරතුරු සැපයීම
ඉලක්ක කණ්ඩායම - ව්‍යවහාරිකවිද්‍යා පීඨයේ සිව්වන වසර සිසුන්
සහභාගි වූ පිරිස - සිසුන් 30
ස්ථානය - මාර්ගගත

❖ **<u>ක්‍රියාකාරකම 12</u>**

ක්‍රියාකාරකම - සේවා නියුක්තිය තහවුරු කරන පොදු කුසලතා සංවර්ධනය සහ වැඩ ලෝකය හා සම්බන්ධ වීම හා අවබෝධ කරගැනීම සැසිය එක
දිනය - 2024.06.03
විස්තරය - වැඩ ලෝකය තුළ අඛණ්ඩව නොසැලී ඉදිරියට ගමන් කිරීම, නිවේදන කුසලතා ආදී අත්‍යවශ්‍ය හැකියා දියුණු කිරීම, ප්‍රශ්න විසඳීම සහ හුරුපුරුදු වීම ආදී ප්‍රමුඛතම

සාධක මගින් සේවා නියුක්ති සහ ශක්ති සම්පන්න පිරිසක් ලෙස අද රැකියා වෙළඳපොළට පිවිසීම

පරමාර්ථය -විශ්වවිද්‍යාලය උසස් තත්ත්වයකට පමුණුවාලීම
සම්පත් දායකත්වය - ආචාර්ය එච්.කේ ජේ.පී. වික්‍රමසිංහ මහතා, සංජීව ජනකසිරි මහතා
ඉලක්ක ක්ෂේත්‍රය - කර්මාන්ත ක්ෂේත්‍රයේ ජාලකරණය
ඉලක්ක කණ්ඩායම - මීගමුව අධ්‍යාපන කලාපයේ අලුතින් බඳවා ගන්නා ලද පාසල් ගුරුවරු
සහභාගි වූ පිරිස - ගුරුවරු 80
ස්ථානය - මීගමුව ගුරු පුහුණු ස්ථානය

❖ **<u>ක්‍රියාකාරකම 13</u>**

ක්‍රියාකාරකම - සේවා නියුක්තිය තහවුරු කරන පොදු කුසලතා සංවර්ධනය සහ වැඩ ලෝකය හා සම්බන්ධ වීම හා අවබෝධ කරගැනීම (සැසිය 2)
දිනය - 2024 .06.07
විස්තරය - වැඩ ලෝකය තුළ අඛණ්ඩව නොසැලී ඉදිරියට ගමන් කිරීම නිවේදන කුසලතා ආදී අත්‍යවශ්‍ය හැකියා දියුණු කිරීම ප්‍රශ්න විසඳීම සහ නුරුපුරුදු වීම ආදී ප්‍රමුඛතම සාධක මගින් සේවා නියුක්ති සහ ශක්ති සම්පන්න පිරිසක් ලෙස අද රැකියා වෙළඳපොළට පිවිසීම
පරමාර්ථය -විශ්වවිද්‍යාලය උසස් තත්ත්වයකට පමුණුවාලීම
සම්පත් දායකත්වය - ආචාර්ය එච්.කේ ජේ.පී. වික්‍රමසිංහ මහතා සංජීවජනක සිරි මහතා
සහභාගි වූ පිරිස - ගුරුවරු අසූවයි
ස්ථානය - පඤ්ඤානන්ද කනිෂ්ඨ විද්‍යාලය, රද්දොළුගම

❖ **<u>ක්‍රියාකාරකම 14</u>**

ක්‍රියාකාරකම - වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය පිළිබඳව දැනුවත් කිරීම කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ අධ්‍යයනාංශය
දිනය - 2024.08.16
විස්තරය - ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය මගින් සපයනු ලබන සේවාවන් පිළිබඳව තොරතුරු ඉදිරිපත් කිරීමේ සැසිය
සම්පත් දායකත්වය - එස්.ඩී ගාමිණී ජයසූරිය මයා
සංජීව ජනකසිරි මහතා
විශ්වවිද්‍යාල ක්‍රියාකාරී සැලැස්මේ අරමුණු - 2.2.6 පුද්ගල සංවර්ධනයට කුසලතා සංවර්ධනයට අදාළ වැඩසටහන්
3.1.9 වෘත්තීය සංවර්ධන කටයුතු අඛණ්ඩව මෙහෙය වීම
ඉලක්ක ක්ෂේත්‍රය - පාසලේ සිට විශ්වවිද්‍යාලය දක්වා තරුණ පුද්ගල පරිවර්තනයට පහසුකම් සැපයීම
ඉලක්ක කණ්ඩායම - කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ පළමු වසර උපාධි අපේක්ෂකයන්
සහභාගි වූ සංඛ්‍යාව - සිසුන් 200
ස්ථානය - මාර්ගගත

❖ **<u>ක්‍රියාකාරකම 15</u>**

ක්‍රියාකාරකම - වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය පිළිබඳ දැනුවත් කිරීමේ සැසිය I
දිනය - 2024.08.23
විස්තරය - ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ සේවාවන් සහ වැඩකටයුතු පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනකි
සම්පත් දායකත්වය - එච්.කේ ජේ.පී වික්‍රමසිංහ මහතා, අධ්‍යක්ෂ - වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය
විශ්වවිද්‍යාල ක්‍රියාකාරී සැලැස්මේ අරමුණු - 2.2.6 පුද්ගල සංවර්ධනයට කුසලතා සංවර්ධනයට අදාළ වැඩසටහන්
3.1.9 වෘත්තීය සංවර්ධන කටයුතු අඛණ්ඩව මෙහෙය වීම

ඉලක්ක ක්ෂේත්‍රය - පාසලේ සිට විශ්වවිද්‍යාලය දක්වා තරුණ පුද්ගල පරිවර්තනයට පහසුකම් සැපයීම
ඉලක්ක කණ්ඩායම - ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයේ ප්‍රථම වසර උපාධි අපේක්ෂකයන්
සහභාගි වූ පිරිස - සිසුන් 300
ස්ථානය - මාර්ගගත

❖ **<u>ක්‍රියාකාරකම 16</u>**

ක්‍රියාකාරකම - වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය පිළිබඳ දැනුවත් කිරීමේ සැසිය II ව්‍යාපාර අධ්‍යනය හා මූල්‍ය පීඨය
දිනය - 2024.08.23
විස්තරය - ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ සේවාවන් සහ වැඩකටයුතු පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනකි
සම්පත් දායකත්වය - එච්.කේ ජේ.පී වික්‍රමසිංහ මහතා අධ්‍යක්ෂ - වෘත්තිය මාර්ගෝපදේශන ඒකකය
විශ්වවිද්‍යාල ක්‍රියාකාරී සැලැස්මේ අරමුණු - 2.2.6 පුද්ගල සංවර්ධනයට කුසලතා සංවර්ධනයට අදාළ වැඩසටහන්
3.1.9 වෘත්තීය සංවර්ධන කටයුතු අඛණ්ඩව මෙහෙය වීම
ඉලක්ක ක්ෂේත්‍රය - පාසලේ සිටවිශ්වවිද්‍යාලය දක්වා තරුණ පුද්ගල පරිවර්තනයට පහසුකම් සැපයීම
ඉලක්ක කණ්ඩායම - ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයේ ප්‍රථම වසර උපාධි අපේක්ෂකයන්
සහභාගි වූ පිරිස - සිසුන් 300
ස්ථානය - මාර්ගගත

❖ **<u>ක්‍රියාකාරකම 17</u>**

ක්‍රියාකාරකම - වයඹ බාල දක්ෂ සංගමය හඳුන්වාදීමේ වැඩසටහන (සියලු පීඨ)
දිනය - 2024.10.16
විස්තරය - මෙම වැඩසටහන මගින් ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය නායකත්ව සංවර්ධන, මහජන සේවා, බාහිර ක්‍රියාකාරකම්, ගෝලීය ජාලකරණ සහ සංස්කෘතික හුවමාරු, වෘත්තිය සංවර්ධන, පරිසර සංරක්ෂණය සහ නිරෝගී බව මෙන්ම අධ්‍යාපනික වැඩසටහන් සම්මන්ත්‍රණ යනාදී ක්ෂේත්‍රයන් පිළිබඳව උපාධි අපේක්ෂකයන් දැනුවත් කිරීම
සම්පත් දායකත්වය - ශ්‍රී ලංකා බාල දක්ෂ සංගමය
විශ්වවිද්‍යාල ක්‍රියාකාරී සැලැස්මේ අරමුණු - 2.2.6 පුද්ගල සංවර්ධනයට කුසලතා සංවර්ධනයට අදාළ වැඩසටහන්
3.1.9 වෘත්තීය සංවර්ධන කටයුතු අඛණ්ඩව මෙහෙය වීම
ඉලක්ක ක්ෂේත්‍රය - සේවා නියුක්ත කුසලතා වර්ධනය ක්ෂේත්‍රයට අදාළ ජාලකරණ කටයුතු
අපේක්ෂිත කණ්ඩායම - විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක සිසුන්
සහභාගි වූ පිරිස - සිසුන් 60
ස්ථානය - කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ ශ්‍රවණාගාරය

❖ **<u>ක්‍රියාකාරකම 18</u>**

ක්‍රියාකාරකම - මෘදුකුසලතා සංවර්ධනය වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන
දිනය - 2024.10.18
විස්තරය - මෙම වැඩසටහන මගින් වෘත්තීය මාර්ගෝපදේශනය සහ පෞද්ගලික ඉලක්ක කරා යොමුවීම පිළිබඳව සිසුන් දැනුවත් කෙරිණි
සම්පත් දායකත්වය - සංජීව ජනකසිරි මහතා
විශ්වවිද්‍යාල ක්‍රියාකාරී සැලැස්මේ අරමුණු - 2.2.6පුද්ගල සංවර්ධන කුසලතා සංවර්ධනය සහ අධ්‍යයන කුසලතා පිළිබඳව වෘත්තීය මාර්ගෝපදේශන සාර්ථක වැඩසටහන් මෙහෙයවීම
3.1.9 වෘත්තීය වැඩසටහන් මෙහෙයවීම අඛණ්ඩව පැවැත්වීම
ඉලක්ක ක්ෂේත්‍රය - ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය

(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 934)

ඉලක්ක කණ්ඩායම - කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ සිව්වන වසර උපාධි අපේක්ෂකයන්

සහභාගි වූ සංඛ්‍යාව - සිසුන් 80

ස්ථානය - ප්‍රධාන ශ්‍රවණාගාරය කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය

❖ **<u>ක්‍රියාකාරකම 19</u>**

ක්‍රියාකාරකම - 2024 ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන ප්‍රාග්ධන වෙළඳපළ පිළිබඳව සිසුන් දැනුවත් කිරීම සඳහා සංවිධානය කෙරිණි

සම්පදායකත්වය - කොළඹ කොටස් වෙළඳපළ, ශ්‍රී ලංකා විනිමය හුවමාරු කොමිෂන් සභාව

විශ්වවිද්‍යාල ක්‍රියාකාරී සැලැස්මේ අරමුණ - 2.2.6පුද්ගල සංවර්ධන කුසලතා සංවර්ධනය සහ අධ්‍යයන කුසලතා පිළිබඳව වෘත්තීය මාර්ගෝපදේශන සාර්ථක වැඩසටහන් මෙහෙයවීම

3.1.9 වෘත්තීය වැඩසටහන් මෙහෙයවීම අඛණ්ඩව පැවැත්වීම

ඉලක්ක ක්ෂේත්‍රය - ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 934 සේවා නියුක්ත කුසලතා වර්ධනය

ඉලක්ක කණ්ඩායම - විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයන්

සහභාගි වූ පිරිස - සිසුන් හැට හතරයි

ස්ථානය - ශ්‍රී ලංකා රජරටවිශ්වවිද්‍යාලය

❖ **<u>ක්‍රියාකාරකම් 20</u>**

ක්‍රියාකාරකම - විභාග පටිපාටිය උපාධි අපේක්ෂක විභාග සඳහා සාර්ථකව මුහුණ දීම

දිනය - 2024.10.23

විස්තරය - මෙම වැඩසටහන මගින් විශ්වවිද්‍යාල විභාග පටිපාටිය පිළිබඳව උපාධි අපේක්ෂකයන් දැනුවත් කිරීම

සම්පත් දායකත්වය - වැවිලි කළමනාකරණ අධ්‍යයන අංශයේ මහාචාර්ය ඩී .සී. අබේසිංහ මහත්මා

විශ්වවිද්‍යාල ක්‍රියාකාරී සැලැස්මේ අරමුණු - 2.2.6පුද්ගල සංවර්ධන කුසලතා සංවර්ධනය සහ ය අධ්‍යයන කුසලතා පිළිබඳව වෘත්තීය මාර්ගෝපදේශන සාර්ථක වැඩසටහන් මෙහෙයවීම

3.1.9 වෘත්තීය වැඩසටහන් මෙහෙයවීම අඛණ්ඩව පැවැත්වීම

ඉලක්ක ක්ෂේත්‍රය - තරුණයන් පාසලින් විශ්වවිද්‍යාලය වෙත පරිවර්තනය වීම සඳහා පහසුකම් සැපයීම

(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 934)

ඉලක්ක කණ්ඩායම - කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ පළමු වසර උපාධි අපේක්ෂකයින්

සහභාගි වූ පිරිස - සිසුන් 200

ස්ථානය - කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ ප්‍රධාන ශ්‍රවණාගාරය

❖ **<u>ක්‍රියාකාරකම 21</u>**

ක්‍රියාකාරකම - කුසලතා සංවර්ධනය වෘත්තිය මාර්ගෝපදේශන වැඩසටහන

දිනය - 2024.10.23

විස්තරය - මෙම වැඩසටහන මගින් වෘත්තීය මාර්ගෝපදේශන සහ පෞද්ගලික ඉලක්ක කරා යොමු වීම පිළිබඳව සිසුන් දැනුවත් කෙරිණි

සම්පදායකත්වය - විජිත කුරුප්පු මහතා කෘෂිකර්ම පීඨය, කෘෂිව්‍යාපාර කළමනාකරණ අධ්‍යන අංශය

විශ්වවිද්‍යාල ක්‍රියාකාරී සැලැස්මේ අරමුණ - 2.2.6 පුද්ගල සංවර්ධන කුසලතා සංවර්ධනය සහ අධ්‍යයන කුසලතා පිළිබඳව වෘත්තීය මාර්ගෝපදේශන සාර්ථක වැඩසටහන් මෙහෙය වීම
3.1.9 වෘත්තීය වැඩසටහන් මෙහෙයවීම අඛණ්ඩව පැවැත්වීම

ඉලක්ක ක්ෂේත්‍රය - ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය
ඉලක්ක කණ්ඩායම - කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ දෙවන වසර උපාධි අපේක්ෂකයින්
සහභාගි වූ සංඛ්‍යාව - සිසුන් 150
ස්ථානය - කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨ ප්‍රධාන ශ්‍රවණාගාරය

❖ **ක්‍රියාකාරකම 22**

ක්‍රියාකාරකම - උපාධිධාරී ව්‍යවසාය උදානය 2024
දිනය - 2024 ඔක්තෝබර් මස 20, 29 සහ 30 දින
විස්තරය - ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාල විසින් ජාතික ව්‍යාපාර සංවර්ධන අධිකාරිය (NEDA) හි සහයෝගයෙන් වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය මගින් විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයන් සඳහා මෙය සංවිධානය කරන ලදී NEDA ආයතනය මගින් සාර්ථක ව්‍යාපාර සැලසුමක් සැකසීම පිළිබඳව පහසුකම් සපයන ලද අතර රුපියල් දෙලක්ෂ පනස්දාහක මුදලක් තෝරාගත් ව්‍යාපාර සැලසුම් සඳහා ලබාදෙන ලදී.
සම්පත් දායකත්වය - ජාතික ව්‍යාපාර සංවර්ධන ආයතනය (NEDA)
විශ්වවිද්‍යාල ක්‍රියාකාරී සැලැස්මේ අරමුණු - 2.2.6පුද්ගල සංවර්ධන කුසලතා සංවර්ධනය සහ අධ්‍යයන කුසලතා පිළිබඳව වෘත්තීය මාර්ගෝපදේශන සාර්ථක වැඩසටහන් මෙහෙයවීම
3.1.9 වෘත්තීය වැඩසටහන් මෙහෙයවීම අඛණ්ඩව පැවැත්වීම

ඉලක්ක ක්ෂේත්‍රය - ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය
(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ නවසිය තිස් හතර)
ඉලක්ක කණ්ඩායම - විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයන්
සහභාගි වූ සංඛ්‍යාව - සිසුන් 120
ස්ථානය - ව්‍යවහාරිකවිද්‍යා පීඨයේ Mini Auditorium ශ්‍රවණාගාරය

❖ **ක්‍රියාකාරකම් 23**

ක්‍රියාකාරකම - වෘත්තීය මාර්ගෝපදේශන අංශය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන ව්‍යවහාරිකවිද්‍යා පීඨය
දිනය - 2024 නොවැම්බර් මස 07 වන දින
විස්තරය - වයඹ විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ කාර්යයන් පිළිබඳව දැනුවත් කිරීම සඳහා පවත්වන ලද විස්තරාත්මක වැඩසටහනකි
සම්පත් දායකත්වය - ආචාර්ය එච්.කේජේ.පී වික්‍රමසිංහ මහතා, අධ්‍යක්ෂ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය
විශ්වවිද්‍යාල ක්‍රියාකාරී සැලැස්මේ අරමුණු - 2.2.6 පුද්ගල සංවර්ධන කුසලතා සංවර්ධනය සහ අධ්‍යයන කුසලතා පිළිබඳව වෘත්තීය මාර්ගෝපදේශන සාර්ථක වැඩසටහන් මෙහෙයවීම

3.1.9 වෘත්තීය වැඩසටහන් මෙහෙයවීම අඛණ්ඩව පැවැත්වීම

ඉලක්ක ක්ෂේත්‍රය - පාසලේ සිට විශ්වවිද්‍යාලය දක්වා තරුණයින් පරිවර්තනය කිරීම සඳහා පහසුකම් සැලසීම

ඉලක්ක කණ්ඩායම - ව්‍යවහාරිකවිද්‍යා පීඨයේ ප්‍රථම වසර උපාධි අපේක්ෂකයින්

සහභාගි වූ සංඛ්‍යාව - සිසුන් 160

ස්ථානය - මාර්ගගත

❖ **<u>ක්‍රියාකාරකම 24</u>**

ක්‍රියාකාරකම - කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ සිසුන් සඳහා වෘත්තීය කුසලතා සංවර්ධන පුහුණු වැඩමුළුව

දිනය - 2024.11.08

විස්තරය - කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ සිවිවන වසර උපාධි අපේක්ෂකයින් සඳහා වෘත්තීය කුසලතා සංවර්ධනය උදෙසා විශ්ව විද්‍යාලයීය වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය මගින් සංවිධානය කරන ලදී

සම්පත් දායකත්වය - ඒ. පූජානී මිය, ඒකාබද්ධ පුහුණුකරු ගුවන්තොටුපළ හා ගුවන් සේවා අමාත්‍යාංශය

විශ්වවිද්‍යාල ක්‍රියාකාරී සැලැස්මේ අරමුණු - 2.2.6පුද්ගල සංවර්ධන කුසලතා සංවර්ධනය සහ අධ්‍යයන කුසලතා පිළිබඳව වෘත්තීය මාර්ගෝපදේශන සාර්ථක වැඩසටහන් මෙහෙයවීම
3.1.9 වෘත්තීය වැඩසටහන් මෙහෙයවීම අඛණ්ඩව පැවැත්වීම

ඉලක්ක ක්ෂේත්‍රය - ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය
(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 934)

ඉලක්ක කණ්ඩායම - කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ සිවිවන වසර උපාධි අපේක්ෂකයින්

සහභාගි වූ පිරිස - සිසුන් 200

ස්ථානය - කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ ශ්‍රවණාගාරය

❖ **<u>ක්‍රියාකාරකම් 25</u>**

ක්‍රියාකාරකම - විශ්වවිද්‍යාලයේ රෝවර් ස්කවුට් (Rover Scout) කණ්ඩායම සඳහා පුහුණුව හා දැනුවත් කිරීමේ වැඩසටහන

දිනය - 2024.11.24

විස්තරය - මෙම වැඩසටහන මගින් ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය නායකත්ව සංවර්ධන, මහජන සේවා, බාහිර ක්‍රියාකාරකම් ගෝලීය ජාලකරණය, සංස්කෘතික හුවමාරුව, වෘත්තීය සංවර්ධනය පරිසර සංරක්ෂණය සෞඛ්‍ය හා සමබරතා සහ අධ්‍යාපනික වැඩසටහන් සහ සම්මන්ත්‍රණ උපාධි අපේක්ෂකයන් සඳහා පවත්වනු ලැබීය

සම්පත් දායකත්වය - ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය

විශ්වවිද්‍යාල ක්‍රියාකාරී සැලැස්මේ අරමුණු - 2.2.6පුද්ගල සංවර්ධන කුසලතා සංවර්ධනය සහ අධ්‍යයන කුසලතා පිළිබඳව වෘත්තීය මාර්ගෝපදේශන සාර්ථක වැඩසටහන් මෙහෙයවීම
3.1.9 වෘත්තීය වැඩසටහන් මෙහෙයවීම අඛණ්ඩව පැවැත්වීම

ඉලක්ක ක්ෂේත්‍රය - සේවා නියුක්ත කුසලතා සංවර්ධනය කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳ ජාලකරණය
(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 934)

ඉලක්ක කණ්ඩායම - විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයින්

සහභාගි වූ පිරිස - සිසුන් 20

ස්ථානය - වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය කාර්යාලයේ මාකඳුර පරිශ්‍රය

❖ **<u>ක්‍රියාකාරකම 26</u>**

ක්‍රියාකාරකම - රැකියා වෙළඳපළ නොමිලේ වැඩමුළුව නොමිලේ නෙස්ලේ ලංකා සමාගම

දිනය - 2024.12.03

විස්තරය - ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයීය වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය නෙස්ලේ ලංකා සමාගම සමග ඒකාබද්ධව රැකියා අයඳුම්පත් සැකසීම, සම්මුඛ පරීක්ෂණ සඳහා පෙනී සිටීම සහ රැකියා වෙළඳපොළ හඳුන්වාදීම පිළිබඳව මෙම වැඩසටහන මෙහෙය විණි.

සම්පත් දායකත්වය - නෙස්ලේ ලංකා සමාගම

විශ්වවිද්‍යාල ක්‍රියාකාරී සැලැස්මේ අරමුණු - 2.2.6පුද්ගල සංවර්ධන කුසලතා සංවර්ධනය සහ ය අධ්‍යයන කුසලතා පිළිබඳව වෘත්තීය මාර්ගෝපදේශන සාර්ථක වැඩසටහන් මෙහෙයවීම
3.1.9 වෘත්තීය වැඩසටහන් මෙහෙයවීම අඛණ්ඩව පැවැත්වීම

ඉලක්ක ක්ෂේත්‍රය - උපදේශනය සහ වෘත්තීය පිළිබඳ වෘත්තීයමය තොරතුරු සැපයීම
(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛන 934)

ඉලක්ක කණ්ඩායම - විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයින්

සහභාගි වූ පිරිස - සිසුන් 100

ස්ථානය - මාකඳුර පරිශ්‍රය

❖ **<u>ක්‍රියාකාරකම් 27</u>**

ක්‍රියාකාරකම - 2024 වයඹ රැකියා පොළ

දිනය - 2024 දෙසැම්බර් පස් වන දින

විස්තරය - ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ මාර්ගෝපදේශන ඒකකය මගින් පෞද්ගලික ව්‍යවසායක ආයතන විසි දෙකක සහභාගිත්වයෙන් විශ්වවිද්‍යාලයේ තෙවන හා සිව්වන වසර සිසුන් සඳහා ආයතනික පුහුණුව සහ රැකියාව අවස්ථා සොයා ගැනීමට උපකාරී වන අන්දමින් විශ්වවිද්‍යාලයීය රැකියා පොළ සංවිධානය කෙරිණි

සම්පදායකත්වය - පෞද්ගලික අංශයේ ආයතන

විශ්වවිද්‍යාල ක්‍රියාකාරී සැලැස්මේ අරමුණු - 2.2.6පුද්ගල සංවර්ධන කුසලතා සංවර්ධනය සහ අධ්‍යයන කුසලතා පිළිබඳව වෘත්තීය මාර්ගෝපදේශන සාර්ථක වැඩසටහන් මෙහෙයවීම
3.1.9 වෘත්තීය වැඩසටහන් මෙහෙයවීම අඛණ්ඩව පැවැත්වීම
2.2.12 රැකියාපොළ සංවිධානය ආයතන සමඟ ආදර්ශ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම

ඉලක්ක ක්ෂේත්‍රය - රැකියා නියුක්ත කුසලතා සංවර්ධනය රැකියා සම්බන්ධ තොරතුරු සැපයීම කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳ ජාලකරණය

(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛණ 934)

ඉලක්ක කණ්ඩායම - විශ්වවිද්‍යාලයේ උපාධි, අපේක්ෂකයන් සහ උපාධිධාරින්

සහභාගි වූ පිරිස - සිසුන් 590

ස්ථානය - ශිෂ්‍ය මධ්‍යස්ථානය කුලියාපිටිය පරිශ්‍රය

❖ **<u>ක්‍රියාකාරකම 28</u>**

ක්‍රියාකාරකම - Varsity Battles ප්‍රශ්න විචාරාත්ම කරගය ජාතික මට්ටමේ අවසන් වටය ((2024)

දිනය - 2024 දෙසැම්බර්

විස්තරය - කොටස් වෙළඳපොළ සම්බන්ධ විශ්ව විද්‍යාල සිසුන් දැනුවත් කිරීම සඳහා මෙම ප්‍රශ්න විචාරාත්මක වෙනසට අහන අරමුණු කෙරිණි

සම්පදායකත්වය - කොළඹ කොටස් වෙළඳපළ සහ විනිශ්චය හුවමාරු කොමිෂන් සභාව

විශ්ව විද්‍යාල ක්‍රියාකාරී සැලැස්මේ අරමුණු - 2.2.6පුද්ගල සංවර්ධන කුසලතා සංවර්ධනය සහ අධ්‍යයන කුසලතා පිළිබඳව වෘත්තීය මාර්ගෝපදේශන සාර්ථක වැඩසටහන් මෙහෙයවීම
3.1.9 වෘත්තීය වැඩසටහන් මෙහෙයවීම අඛණ්ඩව පැවැත්වීම

ඉලක්ක ක්ෂේත්‍රය - ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය

සේවා නියුක්ත කුසලතා වර්ධනය

කර්මාන්ත ක්ෂේත්‍රය සමඟ ජාලගත වීම

(විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 934)

ඉලක්ක කණ්ඩායම - විශ්ව විද්‍යාලයේ උපාධිඅපේක්ෂකයන්

සහභාගි වූ පිරිස - සිසුන් 16

ස්ථානය - EPITOM Hotel කුරුණෑගල

❖ **<u>ක්‍රියාකාරකම 29</u>**

ක්‍රියාකාරකම - Rover Scouting Badge Awarding Ceromany

දිනය - 2024.12.11

විස්තරය - මෙම වැඩසටහන මගින් ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය නායකත්වය සංවර්ධනය මහජන සේවා විශ්මය ජනක බාහිර ක්‍රියාකාරකම් ගෝලීය ජාලකරන සහ සංස්කෘතික හුවමාරු වෘත්තීය සංවර්ධන පරිසර සංරක්ෂණ සෞඛ්‍ය සහ අධ්‍යාපනික වැඩමුළු සහ සම්මන්ත්‍රණ බොහෝමයක් උපාධි අපේක්ෂකයන් සඳහා පවත්වන ලදී

සම්පත් දායකත්වය - ශ්‍රී ලංකා බාල දක්ෂ සංගමය

විශ්ව විද්‍යාල ක්‍රියාකාරී සැලැස්මේ අරමුණු - 2.2.6පුද්ගල සංවර්ධන කුසලතා සංවර්ධනය සහ අධ්‍යයන කුසලතා පිළිබඳව වෘත්තීය මාර්ගෝපදේශන සාර්ථක වැඩසටහන් මෙහෙයවීම
3.1.9 වෘත්තීය වැඩසටහන් මෙහෙයවීම අඛණ්ඩව පැවැත්වීම

ඉලක්ක ක්ෂේත්‍රය - සේවා නියුක්ත කුසලතා සංවර්ධනය ආයතනිකරමින් ක්ෂේත්‍රයේ ජාලගත වීම

ඉලක්ක කණ්ඩායම - විශ්ව විද්‍යාලයේ උපාධිය අපේක්ෂකයන්

සහභාගි වූ පිරිස - සිසුන් 20

ස්ථානය - වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය මාකඳුර පරිශ්‍රය

❖ **<u>ක්‍රියාකාරකම 30</u>**

ක්‍රියාකාරකම - Rover Scouting Meet Veyangoda

දිනය - 2024.12.14

විස්තරය - මෙම වැඩසටහන මගින් ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය නායකත්වය සංවර්ධනය මහජන සේවා විශ්මය ජනක බාහිර ක්‍රියාකාරකම් ගෝලීය ජාල කරන සහ සංස්කෘතික හුවමාරු වෘත්තීය සංවර්ධන පරිසර සංරක්ෂණ සෞඛ්‍ය සහ අධ්‍යාපනික වැඩමුළු සහ සම්මන්ත්‍රණ බොහෝමයක් උපාධි අපේක්ෂකයන් සඳහා පවත්වන ලදී

සම්පත් දායකත්වය - ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය

විශ්ව විද්‍යාල ක්‍රියාකාරී සැලැස්මේ අරමුණු - 2.2.6පුද්ගල සංවර්ධන කුසලතා සංවර්ධනය සහ අධ්‍යයන කුසලතා පිළිබඳව වෘත්තීය මාර්ගෝපදේශන සාර්ථක වැඩසටහන් මෙහෙයවීම
3.1.9 වෘත්තීය වැඩසටහන් මෙහෙයවීම අඛණ්ඩව පැවැත්වීම

ඉලක්ක ක්ෂේත්‍රය - සේවා නියුක්ති කුසලතා සංවර්ධනය ආයතනික ක්ෂේත්‍රයේ ජාලගත වීම

ඉලක්ක කණ්ඩායම -විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂකයන්

සහභාගි වූ පිරිස - සිසුන් 30.

ස්ථානය - වේයන්ගොඩගුරු පුහුණු මධ්‍යස්ථානය

❖ **ක්‍රියාකාරකම 31**

ක්‍රියාකාරකම - ක්‍රියාකාරකම් පාදක කොටගත් වෘත්තීය කුසලතා සංවර්ධන පුහුණුව ව්‍යවහාරික විද්‍යා පීඨය

දිනය - 2024.12.02

විස්තරය - මෙම වැඩසටහන මගින්සම්පත් දායකයන් කණ්ඩායම් ක්‍රියාකාරකම් බොහෝමයක් හඳුන්වා දෙන ලදී. එමගින් කණ්ඩායම් ගොඩනැගීම ක්‍රියාකාරී සවන් දීම ගැටලු විසඳීම තීරණගැනීම නායකත්ව ගුණාංග සන්නිවේදන හා කාල කළමනාකරණය ආදී වෘත්තීය කුසලතාවයන් වර්ධනය කර ගැනීමට ඉවහල් වියදම

සම්පත් දායකත්වය - සම්පත් දායකත්වය ආචාර්ය එච් කේ ජේ.පී වික්‍රමසිංහ මහතා අධ්‍යක්ෂ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය
ගාමිණී ජයසූරිය මහතා
සංජීව ජනකසිරි මහතා

විශ්ව විද්‍යාල ක්‍රියාකාරී සැලැස්මේ අරමුණු - 2.2.6පුද්ගල සංවර්ධන කුසලතා සංවර්ධනය සහ අධ්‍යයන කුසලතා පිළිබඳව වෘත්තීය මාර්ගෝපදේශන සාර්ථක වැඩසටහන් මෙහෙයවීම
3.1.9 වෘත්තීය වැඩසටහන් මෙහෙයවීම අඛණ්ඩව පැවැත්වීම

ඉලක්ක ක්ෂේත්‍රය - තරුණ ප්‍රජාවට පාසලින් තරුණ ප්‍රජාවට පාසලින් විශ්වවිද්‍යාලය වෙත අනුගත වීම සඳහා පහසුකම් සැපයීම සේවා නියුක්ත කුසලතා සංවර්ධනය වෘත්තීන් පිළිබඳ උපදේශනය සහ මග පෙන්වීම

(විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව චක්‍ර ලේඛ 934)

ඉලක්ක කණ්ඩායම - ව්‍යවහාරික විද්‍යා පීඨයේ ප්‍රථම වසර උපාධි අපේක්ෂකයන්

සහභාගි වූ පිරිස - සිසුන් 20

ස්ථානය - කුලියාපිටිය පරිශ්‍රය

26.3.7 වසරේ වැඩසටහන් සාරාංශය

දෙදහස් (2024) වර්ෂය තුළදී විශ්ව විද්‍යාලයේ පීඨ හයක සිසුන් සඳහා ක්‍රියාකාරකම් තිස් එකක් (31) සංවිධානය කිරීමට වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයට හැකි විය

පීඨයේ නම	ක්‍රියාකාරකම් ගණන
කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ	05
ව්‍යයවහාරිකවිද්‍යා පීඨය	06
ව්‍යාපාර අධ්‍යන හා මූල්‍ය පීඨය	02
පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය	00
තාක්ෂණ පීඨය	03
වෛද්‍ය පීඨය	01
විශ්ව විද්‍යාලීය පීඨ හතර	10
බාහිර ආයතන සමඟ සම්බන්ධ වී සංවිධානය කරන ලද වැඩසටහන්	04
එකතුව	**31**

26.3.8 2024 වර්ෂයේදී අපගේ වැඩසටහන් සඳහා සහභාගී වූ සිසුන්ට ලැබුණු වාසි සහ අවස්ථාවන්

2024 වර්ෂයේදී අපගේ වැඩසටහන් සඳහා සහභාගී වූ සිසුන්ට ලැබුණු වාසි සහ අවස්ථාවන්.

- නායකත්ව සංවර්ධනය,
- මෘදුකුසලතා සහ වෘත්තීය කුසලතා සංවර්ධනය,
- කර්මාන්තමය පුහුණු අවස්ථා,
- රැකියා සඳහා ස්ථානගත වීම,
- වෘත්තීය ජීවදත්ත පත්‍රිකා නිර්මාණය,
- පුද්ගල උපදේශන අවස්ථා,
- ශිෂ්‍ය තොරතුරු පද්ධතියක්,
- පෞරුෂ ආකල්ප සංවර්ධනය

26.3.9 2024 වර්ෂයේ විශේෂ ජයග්‍රහණයන්

- මෙම වර්ෂය තුළ සියලු පීඨ සඳහා වැඩසටහන් තිස් එකක් ක්‍රියාත්මක කිරීම
- අඩු වියදම් ඵලදායී වෘත්තීය කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම හයිබ්‍රිඩ් මෝඩ් වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම
- NEDA ආයතනය සමඟ එක්ව ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම

26.3.10 2024 වර්ෂය තුළ පවත්වන ලද සියලු වැඩසටහන් සඳහා සියලු වියදම

අංකය	වැඩසටහනේ නම	වියදම
01	වයඹ බාලදක්ෂ සංගමය හඳුන්වා දීමේ වැඩසටහන	11,840.00
02	උපාධිධාරී වැඩසටහන් ව්‍යවසාය උදානය 2024	13,750.00
03	වෘත්තීය කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය	7,920.00
04	නොමිලේ රැකියා වෙළඳපොළසමාගමේ අරමුණු නෙස්ලේ ලංකා සමාගම	5,900.00

05	2024 වයඹ රැකියාපොළ	249,420.00
06	රෝවර්බාල දක්ෂ නිල ලාංඡන පැළඳවීමේ උත්සවය	9,945.00
07	ක්‍රියාකාරකම් පාදක වෘත්තීය කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන ව්‍යවහාරික විද්‍යා පීඨය	25,800.00
	එකතුව	324,575.00

26.3.11 2025 වර්ෂය සඳහා වැඩසටහන් සංවර්ධනය කිරීම

- වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ කාර්යය මණ්ඩලයේ සඳහා මානව සම්පත්සංවර්ධනය
- මහජන කාර්මික පාදක පර්යේෂණ කටයුතු සඳහා සම්බන්ධ වීම
- උසස් අධ්‍යාපන හා ක්ෂේත්‍ර චාරිකා සඳහා සම්බන්ධ වීම
- අනුමත තනතුරු වැඩි කරවා ගැනීම
- අභ්‍යන්තර පුහුණු සහය

26.3.12 භෞතික සම්පත් සංවර්ධනය

01. පොත් රාක්ක	02
02. වානේ අල්මාරි	02
03. අභ්‍යන්තර ක්‍රියාකාරකම් පාදක පුහුණු ස්ථානය කුලියාපිටිය පරිශ්‍ර	01
04. අභ්‍යන්තර පුහුණු මෙවලම්	02

26.3.13 සමාප්තිය

2024 වර්ෂය තුළ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය වැඩසටහන් 31ක් ක්‍රියාත්මක කොට ඇත මෙම වැඩසටහන් මගින් අපගේ ශිෂ්‍යයන්ට පහත සඳහන් පුද්ගල කුසලතා වර්ධනය කර ගැනීමට හැකියාව ලැබුණි

- ✓ ධනාත්මක ආකල්පය
- ✓ ස්වයං අභිප්‍රේරණය
- ✓ නවෝත්පාදනය
- ✓ උපක්‍රමශීලී බව
- ✓ උද්‍යෝගිමත් බව
- ✓ වගකීමෙන් යුක්ත බව
- ✓ නිර්මාණශීලීත්වය
- ✓ ව්‍යවසායකත්වය
- ✓ නම්‍යශීලී බව
- ✓ පරිකල්පන හැකියාව
- ✓ දුෂ්කරතා ජයගැනීමේ හැකියාවක්
- ✓ විනයගරුක බව
- ✓ ශක්ති සම්පන්න බව
- ✓ ශක්තිමත් රැකියා ආචාරධර්ම
- ✓ ශක්‍යතාවයන්ගෙන් යුක්ත බව
- ✓ අවංක භාවය
- ✓ හාස්‍ය රසය පිළිබඳව හැඟීම

26.4 තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය - කුලියාපිටිය පරිශ්‍රය

26.4.1 හැඳින්වීම

කුලියාපිටිය පරිශ්‍රයේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය මඟින් කුලියාපිටිය පරිශ්‍රයේ විශ්වවිද්‍යාල ප්‍රජාව සඳහා තොරතුරු තාක්ෂණික සේවාව සහ තොරතුරු තාක්ෂණ පුහුණු වැඩසටහන් සැපයේ. මේ මඟින් සිසුන් සඳහා තොරතුරු තාක්ෂණ පුහුණුවල කාර්ය මණ්ඩලය සහ බාහිර වෘත්තිකයන්ගේ තොරතුරු තාක්ෂණ පුහුණුව සඳහා සේවය ලබාදෙයි. මෙම අංශය මඟින් අධ්‍යයන කටයුතු සඳහා නොමඳ දායකත්වයක් ලබාදෙයි. එමගින් තොරතුරු තාක්ෂණ සක්‍යතාවල සුදුසු පරිසරාත්මක පසුබිමක් ඔස්සේ ලබාදෙන අතර අධ්‍යාපන හා පර්යේෂණ වැඩසටහන් සඳහා පරිගණක පහසුව සැපයේ.ඒ අනුව තොරතුරු තාක්ෂණයේ නවතම උපාංග භාවිතයෙන් සේවය සැපයීම සිදුකෙරේ. මෙම සේවාවන්ට විද්‍යුත් තැපෑල, අන්තර්ජාල පහසුකම්, ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය, අන්තර්ජාල නඩත්තුව ආදිය ඇතුලත් වේ. තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් විද්‍යුත් අධ්‍යයන ඇරඹුම් (ඉගෙනුම් ආධාරක පරිගණක ගත කිරීම, ඉගෙනුම් කළමනාකරණ පද්ධති) මෙමගින් සැපයේ. අධ්‍යයනාංශ සහ ඒකක සඳහා ඔවුන්ගේ තොරතුරු මාර්ගගත (Online) පද්ධතිය හරහා සැපයීම සිදු කෙරේ.

26.4.2 පුහුණු දැනුවත් කිරීමේ වැඩසටහන්

- ව්‍යවහාරිකවිද්‍යා හා ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීටේ අභ්‍යන්තර සිසුන් සඳහා ඩිප්ලෝමා වැඩසටහන
- බාහිර සිසුන් සඳහා තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව මුදල් අය කෙරේ
- රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන සඳහා කෙටිකාලීනන පුහුණු
- කාර්ය මණ්ඩලය සඳහා කෙටි කාලීන පුහුණු
- (LMS) දැනුවත් කිරීමේ වැඩසටහන්
- ව්‍යවහාරිකවිද්‍යා, ව්‍යාපාර අධ්‍යාන හා මූල්‍ය, තාක්ෂණ සහ වෛද්‍ය පීඨ අභ්‍යන් අභ්‍යන්තර සිසුන් සඳහා විෂයානු බද්ධ වැඩමුළු

26.4.3 කුලියාපිටිය පරිශ්‍රයේ පීඨ සියල්ල සඳහා පරිගණක විද්‍යාගාර පහසුකම්

පරිගණක අංශය සතුව විද්‍යාගාර තුනක් ඇති අතර එය නව ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම සඳහා කඩා ඉවත් කෙරිණි පරිගණක සීයකින් සමන්විත නව පරිගණක විද්‍යාගාර දෙකක් ඉදි වෙමින් පවතී

26.4.4 කාර්ය මණ්ඩලය

පද්ධති ඉන්ජිනේරු	01
උපදේශක පරිගණක තාක්ෂණ	01
කථිකාචාර්ය පරිගණක තාක්ෂණ	01
තාක්ෂණ නිලධාරී	02
කළමනාකරණ සහකාර	02
විද්‍යාගාර සහයක	02
කම්කරු	01

26.4.5 ගත වූ වසර තුළ ප්‍රගතිය

- විශ්වවිද්‍යාල වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම සහ පවත්වාගෙන යාම
- සජීව වැඩසටහන් සඳහා තාක්ෂණික සහාය ලබා දීම
- ගම්පහ වික්‍රමාරච්චි විශ්වවිද්‍යාලයේ උපාධි ප්‍රධානෝත්සවයේ ඡායාරූපකරණය වීඩියෝ කරනය සහ සජීවී වැඩසටහන් සඳහා තාක්ෂණික සහාය ලබා දීම
- e mail ගිණුම් සැකසීම LMS කටයුතු මාර්ගගත සම්මුඛ පරීක්ෂණ රැස්වීම් සහ පරිපාලනමය රැස්වීම කටයුතු සඳහා පහසුකම් සැපයීම
- බාහිර සිසුන් සඳහා සාර්ථකව ඩිප්ලෝමා පාඨමාලාව පවත්වාගෙන යාම
- රැහැන් රහිත අන්තර්ජාල පහසුකම් සහ අභ්‍යන්තර දුරකථන පහසුකම් පුළුල් කිරීම
- විශේෂ උත්සව අවස්ථා සහ කාර්යයන් සඳහා Web Sites සහ (applications) සැකසීම
- සියලු අධ්‍යනාංශයන්හි මාර්ගගත විභාග කටයුතු සඳහා LMS පහසුකම් සැපයීම

26.4.6 බාධාවන්

- කාර්ය මණ්ඩලය සඳහා යටිතල පහසුකම් සැපයීමට ප්‍රතිපාදන හිඟ වීම
- වැඩිවන ශිෂ්‍ය සංඛ්‍යාවට සාපේක්ෂව පරිගණක විද්‍යාගාර පුළුල් කිරීම සඳහා ඉඩකඩ ප්‍රමාණවත් නොවීම
- මෙම මධ්‍යස්ථානය ස්ථාපිතව ඇත්තේ පරිගණක මධ්‍යස්ථානයකට සුදුසු නොවන ඉතා පැරණි ගොඩනැඟිල්ලකය
- මෙම ගොඩනැඟිල්ල ප්‍රතිසංස්කරණය කළ නොහැකි මට්ටමක පවතින හෙයින් සේවා අවශ්‍යතා සඳහා පුළුල් කිරීම් කළ නොහැකි අතර කාර්යමණ්ඩලයේ කටයුතු සඳහා ද ආරක්ෂාව සඳහා ද මහත් බාධාවක්ව පවතී.

26.4.7 වැඩිදුර සංවර්ධනය සඳහා යෝජනා

- මෙම ගොඩනැඟිල්ල ඉතා පැරණි සහ පරිගණක මධ්‍යස්ථානයකට සුදුසු නොවන හෙයින් කුලියාපිටිය පරිශ්‍රයේ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය සඳහා නව ගොඩනැඟිල්ලක් අවශ්‍ය කෙරේ
- බාහිර පුද්ගලයන් සඳහා වැඩමුළු පැවැත්වීම
- රැහැන් රහිත ජාලය පුළුල් කිරීම
- අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා නව බඳවා ගැනීම් සිදු කිරීම.
- සාමාන්‍ය තොරතුරු තාක්ෂණ සහතිකපත්‍ර පරීක්ෂණ සඳහා සිසුන් පුහුණු කිරීම
- මෘදුකාංග සංවර්ධන / පරිගණක ජාල ගත කිරීම සහ තොරතුරු පද්ධති සංවර්ධනය සඳහා වන බාහිර ව්‍යාපෘති සිදු කරන ශිෂ්‍ය පාදක ඒකකයන් ගොඩ නැඟීම
- පවත්නා ඉල්ලුමට සාපේක්ෂව අභ්‍යන්තර හා බාහිර සිසුන්ගේ දැනුම පුළුල් කළ හැකි සේවා සැපයීම සඳහා වන පහසුකම් වැඩි කිරීම

26.4.8 වෙනත් අදාළ තොරතුරු

තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳව සහ සේවා පිළිබඳව අවස්ථා විශාල සංඛ්‍යාවක් පවත්නා හෙයින් තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ සහ පොදු මහජනතාවගේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ දැනුම සහ සේවා මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කිරීම සඳහා කටයුතු කළ යුතුය. තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය මහජන සම්බන්ධතා පවත්වන ප්‍රධාන අංගයක් සහ මහජනතාව වෙත අධ්‍යාපන අවස්ථා සලසා දෙන අංශයකි. මෙම පහසුකම් වැඩිකරලීම සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය නව ගොඩනැගිල්ලක ස්ථාපිත කිරීම ඒකමතිකව අනුමත කෙරේ. එමගින් සේවා පුළුල් කිරීම, ජන සහභාගීත්වය වැඩිකිරීම, මෙන්ම උපකරණ හා උපාංග ආරක්ෂා වීම ද සිදු වනු ඇත.

26.5 තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය - මාකඳුර පරිශ්‍රය

26.5.1 හැඳින්වීම

සිසුන්ගේ ශීඝ්‍රයෙන් දියුණුවන විෂය ක්ෂේත්‍රවලට අදාළ තොරතුරු තාක්ෂණ අභියෝගයන්ට මුහුණ දීමට හැකි සේවාවක් සැපයීම සඳහා මාකඳුර තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය පිහිටුවා ඇත. එමෙන්ම මේ නිසා ඔවුන්ට පරිගණක සාක්ෂරතාව මෙන්ම ඉහළ වෘත්තීය කාර්ය සාධනයක් ලබා ගැනීමට පහසුකම් සැලසී ඇත.

මෙම ඒකකය මඟින් කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය සඳහා තොරතුරු තාක්ෂණ හා උසස් පරිගණක භාවිතය පිළිබඳ පාඨමාලා ඉදිරිපත් කරන අතර පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය සඳහා පරිගණක තාක්ෂණ පාඨමාලාව පවත්වනු ලැබේ. එමෙන්ම අධ්‍යයනාංශ මඟින් පවත්වන සංඛ්‍යානය ආශ්‍රිත පාඨමාලා සඳහා විශේෂයෙන්ම ප්‍රායෝගික පරීක්ෂණවල දී මෙම ඒකකය මඟින් සේවාව සැපයේ. ඊට අමතරව විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ බාහිර උපාධි පාඨමාලාව හදාරන සිසුන්ට පරිගණක තාක්ෂණය සහ විද්‍යුත් වාණිජ්‍ය හා තොරතුරු කළමනාකරණ පද්ධති යන පාඨමාලා පවත්වනු ලැබේ. එමෙන්ම පළාතේ බාහිර ප්‍රජාවට ප්‍රයෝජනවත් වන පරිගණක තාක්ෂණයට සම්බන්ධ පාඨමාලා කීපයක්ම පවත්වමින් තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය මඟින් වඩාත් පුළුල් සේවාවක් සැපයේ.

මෙම මධ්‍යස්ථානය සතියේ දිනවල පෙරවරු 8.00 සිට පස්වරු 8.00 දක්වාත්, සෙනසුරාදා දිනවල පෙරවරු 8.00 සිට පස්වරු 5.00 දක්වාත්, විභාග කාලය තුළ දී සතියේ දිනවල පෙරවරු 8.00 සිට පස්වරු 10.00 දක්වාත් විවෘතව පවතී.

26.5.2 පුහුණුවීම් දැනුවත් කිරීමේ වැඩසටහන්

කෘෂිකර්ම හා වැවිලි කළමනාකරන්න පීඨය සහ පසු සම්පත් ධීවර හා පෝෂණ පීඨය සඳහා මූල් පුහුණු සැසි අයි සීටීඊ මධ්‍යස්ථානයේ පැවැත්විණ

26.5.3 වසර තුළ ලැබූ ප්‍රගතියන්

- ආචාර්ය එච්.ඒ.සී. කේ ජයතිලක මහතා විසින් සියලු පීඨ සහ අංශයන්හි වෙබ් සයිට්ස් නඩත්තු කරන ලදී
- ICT මධ්‍යස්ථානය මඟින්මෙහෙයවන ප්‍රායෝගික පුහුණු සහ දේශන සඳහා එල්.එම්.එස් කටයුතු සඳහා වැඩිදියුණු කිරීම් සිදුකිරීම
- Moodle (3.8) සඳහා නව LMS වැඩිදියුණු කිරීම
- Identity proider (idp) ස්ථාපිත කරන ලද LEARN identity access Federation LIAF යටතේ විනිවිදභාව සහිත කරන ලද සේවාව EDU GAIN ජාත්‍යන්තර අන්තර් ෆෙඩරේශන් සාමාජිකයෙකි
- මාකඳුර පරිශ්‍රයේ ප්‍රධාන ආපනශාලා ගොඩනැගිල්ලට පහසුකම් සැපයීම සඳහා වයිෆයි ආවරණය පුළුල් කරන ලදී
- මාකඳුර පරිශ්‍රයේ සූම් තාක්ෂණ පහසුකම් ක්‍රියාත්මක කරන ලදී
- පරිශ්‍රයේ සිසුන් සහ කාර්ය මණ්ඩලය සඳහා ඔෆිස් (365) පිරිනැමිණි
- පශුසම්පත් ධීවර හා පෝෂණ පීඨය සඳහා ජාල අදියර තුන සම්පූර්ණ කරන ලදී
- කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ නව පීඨාධිපති කාමරයට වයි ෆයි පහසුකම් සැපයීණි

26.7 වෛද්‍ය මධ්‍යස්ථානය



වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය මධ්‍යස්ථාන දෙකක් ක්‍රියාත්මක වේ. එයින් එකක් කුලියාපිටිය පරිශ්‍රයේ ස්ථාපිත වී ඇති අතර අනෙක මාකඳුර පරිශ්‍රයේ ස්ථාපනය කර ඇත. මෙමගින් 2021 වර්ෂය තුළ දී සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කෙරිණි. 2020 වර්ෂයේ මෙන්ම 2021 වර්ෂයේ දී ද කුලියාපිටිය පරිශ්‍රයේ කාර්ය මණ්ඩලය සාත්තු සේවකයකු, මහජන සෞඛය පරීක්ෂකවරයකු, ඖෂධවේදියෙකු, ලඝු ලේඛිකාවක සහ කම්කරුවෙකු යන අයගෙන් සමන්විත විය. මාකඳුර පරිශ්‍රයේ ද ලඝු ලේඛිකා තනතුර හැර අනෙකුත් තනතුරු සමානව ඇත

2020/ 2021 වර්ෂවල අලුතින් පත්වීම් ලද විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලයේ සහ අලුතින් පළමු වසරට අතුළත් වූ සිසුන් සඳහා වෛද්‍ය සහතික වෛද්‍ය නිලධාරී විසින් අනුමත කරන ලදී. ක්‍රීඩා කටයුතු සඳහා තෝරා ගන්නා ලද සිසුන්ගෙන් සහ ආපනශාලා සේවකයන්ගේ වෛද්‍ය පරීක්ෂණ (Medical Examinations) සිදු කරන ලදී.

විශ්වවිද්‍යාලයීය සිසුන්ගෙන් සහ කාර්ය මණ්ඩලයේ සුළු ප්‍රතිකාර කටයුතුවලට අමතරව රෝග නිවාරණ වැඩසටහන් හා විශ්වවිද්‍යාල සිසුන්ගේ සෞඛ්‍ය අධ්‍යාපනය සඳහා වෛද්‍ය මධ්‍යස්ථානය සුවිශේෂී කාර්යභාරයක් ඉටු කළේය. 2021 වර්ෂය තුළ දී සෞඛ්‍ය අභිවෘද්ධි වැඩසටහන් ගණනාවක් සිදු කර ඇත.

1. තැලසීමියා සඳහා ජනතාව පරීක්ෂා කිරීමේ වැඩසටහන
2. ප්‍රජා සෞඛ්‍ය සහ ලිංගිකව බෝවන රෝග පිළිබඳව සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් මෙහෙයවීම.
3. අයාලේ යන සුනඛයන් හා බළලුන් වඳභාවයට පත් කිරීමේ වැඩසටහන
4. ජලභීතිකා එන්නත් කිරීමේ වැඩසටහන
5. බරවා රෝග පරීක්ෂණ
6. වාර්ෂික ආහාර හා ජල සාම්පල පරීක්ෂා කිරීමේ වැඩසටහන
7. කෘමීන් හා මදුරුවන් සඳහා ධූමායනය කිරීමේ වැඩසටහන යටතේ සියලු කාර්යමණ්ඩල සහ ශිෂ්‍ය නේවාසිකාගාර පරිශ්‍රයන් සඳහා රසායනික ධූමායනය යොදන ලදී
8. වර්ධිත මදුරු පාලන ක්‍රියාමාර්ගයක් ලෙස මැඩියන් යෙදීමේ වැඩසටහන සිදු කෙරිණි
9. කොවිඩ්19 රෝගය වැළැක්වීමේ ක්‍රියාමාර්ගවලට අදාළ සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් මෙහෙය වන ලදී.
10. කොවිඩ් 19 වැළැක්වීමට අදාලව සනීපාරක්ෂක පහසුකම් සපයන ලදී

සාමාන්‍යයෙන් ගත් කල වෛද්‍ය මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය කණ්ඩායමක් ලෙස කුලියාපිටිය සහ මාකඳුර පරිශ්‍රයේ විශ්වවිද්‍යාල ප්‍රජාව සඳහා උපකාර කිරීමට සමත් විය.

27. මූල්‍ය තොරතුරු – 2024

27.1 පුනරාවතර්න වියදම් පිළිබඳ තොරතුරු

27.2 ප්‍රාග්ධන වියදම් පිළිබඳ තොරතුරු

27.3 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු (වියදම)

27.4 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු (ඉපැයූ ආදායම)

27.5 මූල්‍ය කායර්සාධනය විශ්ලේෂණය – 2024

27.6 පීඨය මගින් සිසුවකුට වැය වන පිරිවැය 2020 - 2024

27.1 පුනරාවර්තන වියදම් පිළිබඳ තොරතුරු

විෂය	2023 රු.	2024 රු.
අ. පෞද්ගලික පඩි නඩි	2023 Rs.	2024 Rs.
ආ. ගමන් වියදම්	1,713,774,403	2,008,944,219
ඇ. සැපයුම්	479,062	428,715
ඈ. නඩත්තු	80,736,128	59,060,110
ඉ. කොන්ත්‍රාත්තු සේවා	35,859,375	40,667,455
ඊ. වෙනත්	307,184,124	271,601,081
එකතුව	48,772,985	41,081,841

27.2 ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර

විෂය	2023 රු.	2024 රු.
අ. පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීම	2023 Rs.	2024 Rs.
ආ. වත්කම් අත් කර ගැනීම	42,076,363.81	12,151,418.40
ඇ. ඉදිකිරීම් ව්‍යාපෘති	42,642,669.45	91,459,702.24
ඈ. වෙනත් ප්‍රාග්ධන ලැබීම්	536,577,841.02	548,319,719.71
එකතුව	4,792,341.15	5,301,138.10

27.3 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු (වියදම්)

විෂය	2024 වෂර්යේ ලබා දුන් ප්‍රතිපාදන රු.	2024 වෂර්යේ වියදම රු.	ඉතුරුම් /අතිරික්ත රු.
අ. ව්‍යාපෘතිය හැර පුනරාවර්තන	2,374,742,290.00	2,421,783,421.00	(47,041,131.00)
ආ. ව්‍යාපෘතිය හැර ප්‍රාග්ධන	599,671,382.83	657,231,978.45	(57,560,595.62)
එකතුව	**2,974,413,672.83**	**3,079,015,399.45**	**(104,601,726.62)**

27.4 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු (ඉපැයූ ආදායම)

ආදායම් මූලාශ්‍රය	2024 වෂර්යේ එකතුව රු.
අ. උපාධි අධ්‍යයන	89,500,910
ආ. පශ්චාත් උපාධි අධ්‍යයන	20,484,125
ඇ. උපදේශන	-
ඈ. වෙනත්	103,521,012
එකතුව	**213,506,047**

27.5 මූල්‍ය කායර් සාධනය විශ්ලේෂණය – 2024

විෂය	සූත්‍රය	එක් ශිෂ්‍යයකු සඳහා වියදම රු.
අ. එක් ශිෂ්‍යයකු සඳහා පුනරාවතර්න වියදම (පු.වි.)	පු.වි./ ශිෂ්‍ය සංඛ්‍යාව	365,059.30
ආ. එක් ශිෂ්‍යයකු සඳහා ප්‍රාග්ධන වියදම (ප්‍රා.වි.)	ප්‍රා.වි./ ශිෂ්‍ය සංඛ්‍යාව	99,070.24
එකතුව		**457,828.01**

24.6 පීඨ අනුව එක් ශිෂ්‍යයකු සඳහා වැය වන පිරිවැය 2019 - 2023
(මහපොළ හා ශිෂ්‍යාධාර ගෙවීම් සමග)

පීඨය	ශිෂ්‍යයකු සඳහා පිරිවැය (රු.)				
	2020	2021	2022	2023	2024
කෘෂිකමර්ය සහ වැවිලි කළමනාකරණය	467,031	482,893	373,392	513,246	530,591
ව්‍යවහාරික විද්‍යාව	650,759	631,730	678,612	695,363	734,541
ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය	330,071	336,486	508,278	401,790	418,120
පශු සම්පත්, සීවර හා පෝෂණ	641,215	561,895	615,406	627,553	665,841
තාක්ෂණය	398,676	392,226	431,394	452,902	460,585
වෛද්‍ය විද්‍යා	620,205	590,721	553,546	535,176	500,944

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශය - 2024

1971 අංක 38 දරණ මුදල් පනතේ 13(6) ජේදයේ ප්‍රකාර ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික ගිණුම් ප්‍රකාශන පිළිබඳ ව්‍යවස්ථාපිත වාර්තාව

1. මෙම මූල්‍ය ප්‍රකාශය 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 106(1) සහ 107(බී) ජේදයන්ට හා කලින් කල නීතිගත කරන ලද සංශෝධනවලට හා 1971 අංක 38 දරණ මුදල් පනතට අනුව පිළියෙල කොට
ඉදිරිපත් කරනු ලැබේ.

(i) ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීම හා අර්ථ නිරූපණය කිරීම සංගතතාවක් පවත්වා ගනිමින් හා රාජ්‍ය අංශයේ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත හා විශ්වවිද්‍යාලයේ වාර්ෂික ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමේ දී සාමාන්‍යයෙන් පිළිපදිනු ලබන පොදුවේ පිළිගත් පරිචයන්ට අනුකූලව මෙම ගිණුම් අර්ථ නිරූපණය හා ඉදිරිපත් කිරීම සිදු කොට ඇත.

මූල්‍ය විශේෂතා

i. රජයේ ප්‍රදාන

	2024	2023
පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රතිපාදන (මහා භාණ්ඩාගාරයෙන්)	2,295,500,000	2,042,000,000
ශිෂ්‍යාධාර ගෙවීම් සඳහා රජයේ ප්‍රතිපාදන	55,604,000	49,455,000
මූලධන 101 - පුනරුත්තාපන වැඩසටහන	25,000,000	43,500,000
මූලධන 102 වත්කම් අත්පත් කර ගැනීම	52,500,000	51,800,000
මූලධන 103 ඉදිකිරීම් ව්‍යාපෘති	69,700,000	93,000,000
වෙනත් මූලධන ප්‍රතිපාදන (මහා භාණ්ඩාගාරය)	3,000,000	11,700,000
වෙනත් විශේෂ ප්‍රතිපාදන (වි.වි.ප්‍ර.කොා.ස)	397,850,000	380,000,000
වෙනත් විශේෂ ප්‍රතිපාදන (AHEAD)	31,322,460	220,203,105
එකතුව	**2,328,044,664**	**2,343,687,332**

බාහිර පාඨමාලා සහ වෙනත් ප්‍රතිපාදන

පශ්චාද් උපාධි පාඨමාලා		**2024**	**2023**
ව්‍යාපාර පරිපාලනපති පාඨමාලාව – ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය	**රු.**	3,870,000	13,912,644
පශ්චාද් උපාධි ඩිප්ලෝමා - ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය	**රු.**	5,222,500	13,536,450
කෘෂි ව්‍යාපාර හා තාක්ෂණ කළමනාකරණ විද්‍යාපති උපාධිය	**රු**	2,211,250	12,072,350
පෝෂණවේදී පශ්චාද් උපාධි පාඨමාලා		9,180,375	-
බාහිර උපාධි පාඨමාලා			
වැවිලි කළමනාකරණ පශ්චාද් උපාධි පාඨමාලාව – මාකඳුර	**රු.**	52,511,710	46,193,875
අහාර තත්ව කළමනාකරණ භාහිර උපධි පාඨමාලාව	**රු**	26,337,200	-
අහාර ව්‍යාපාර හා අලෙවිකරණය භාහිර උපධි පාඨමාලාව		10,652,000	-
ඩිප්ලෝමා පාඨමාලා			
ඉංග්‍රීසි ඩිප්ලෝමාව	**රු.**	16,000,000	17,654,500
අවදානම් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව		422,000	730,000
තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව	**රු.**	8,920,240	13,800,000
මෘදුකාංග ඉංජිනේරු ඩිප්ලෝමාව	**රු**	243,800	4,918,600
අහාර ව්‍යාපාර හා අලෙවිකරණය පිළිබඳ ඩිප්ලෝමාව	**රු.**	3,576,000	2,384,500
ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව	**රු.**	209,140	2,085,000
තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව	**රු.**	12,224,500	14,164,000
මෘදුකාංග පිළිබඳ උසස් ඩිප්ලෝමාව	**රු.**	137,600	8,322,600
කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව	**රු**	12,949,400	16,529,800
බැංකු සහ මූල්‍ය අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමාව	**රු**	36,000	350,000
අවදානම් කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව	**රු**	13,000	-
ඉදිකිරීම්, කම්කරු ඵලදායිතාව සහ කාර්යසාධන කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව	**රු**	208,125	1,445,500
නූතන කෘෂි තාක්ෂන ඩිප්ලෝමාව	**රු**	4,080,500	4,976,500
සත්ත්ව පාලනය පිළිබඳ ඩිප්ලෝමාව	**රු.**	23,000	-
ගිණුම්කරණ තොරතුරු පද්ධති ඩිප්ලෝමාව	**රු.**	-	485,000
ඉදිකිරීම්, කම්කරු ඵලදායිතාව සහ කාර්යසාධන කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව	**රු**	9,573,000	-
සහතික පත්‍ර පාඨමාලා			
පරිගණක සහතික පත්‍ර පාඨමාලා – මාකඳුර	**රු.**	49,000	306,000
කාර්යමණ්ඩල සංවර්ධන සහතිකපත්‍ර පාඨමාලාව	**රු.**	45,000	157,500
පටක තාක්ෂණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව	**රු.**	966,000	927,500

මූල්‍ය සේවා කළමනාකරණ උසස් සහතිකපත්‍ර පාඨමාලාව	**රු.**	-	8893,000
පර්යේෂණ ප්‍රතිපාදන			
ACIAR	රු	7,507,507	55,458,361
SANDEE m%odk	රු	-	2,406,635
එකතුව	**රු.**	**213,506,047**	**263,816,115**

2. 2024 වර්ෂයේ වියදම මත ආදායම් අතිරික්තය රු 1,299,949,538.00 ක් විය මෙය 2023 වර්ෂයේ දී රු 348,844,769.00 ක් විය.
3. මෙම විශ්වවිද්‍යාලයේ සේවයේ නියුතු වූවන් සඳහා ගෙවන ලද ණය සහ අත්තිකාරම් මඟින් ඉතිරිය අයවිය යුතුය. එහි අගය රු 58,809,679.00 කි. මෙය 2023 වර්ෂයේ දී රු 58,678,030.00 ක් විය.
4. විශ්වවිද්‍යාලය මගින් අනුමැතිය නොලත් ආයෝජනය කරන ලද මුදල්වල අගය ශේෂ පත්‍රය සකසන අවස්ථාව වන විට රු 475,529,829.00 කි. මෙය 2023 වර්ෂයේ දී රු 367,374,809.00 කි.
5. අභ්‍යන්තර ආදායම් ප්‍රභව

2023 Rs.	2024 Rs.	වෙනස Rs.	වෙනස ප්‍රතිශතයක් ලෙස %
86,080,614	79,242,290	6.838,324	8

a. ශේෂ පත්‍රයේ දැක්වෙන අන්දමට විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුම්වල අවසන් ශේෂය අදාළ මුදල් පොත් සමග ප්‍රත්‍යාගණනය කොට ඇත. අදාළ බැංකු මගින් ඔවුන්ගේ අගයන් සනාථ කොට විගණකාධිපති වෙත දැනුම් දෙන ලෙස දන්වනු ලැබ ඇත. මෙම අගයන් කෙටි කාලීන ගනු දෙනුවලට සමානව පවතී.
b. ශේෂ පත්‍රයේ සඳහන් තොග අගය රු 52,134,407.00 කි. මෙහි අගය සනාථ කළ යුත්තේ හිමිකම පවත්නා තොග අගය මතය. ප්‍රත්‍යාගණනය කරන ලද තොග අගයන් ගිණුම් ගත කොට ඇත.
c. ශේෂ පත්‍රයේ දැක්වෙන පරිදි කෙරෙමින් පවතින වැඩවල මූල්‍ය අගය 1,816,820,722.00 කි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව කෙරෙමින් පවතින වැඩ ඉදිරියට ගෙන ඇත.
d. 2024 වර්ෂයේ සමුච්චිත අරමුදලේ ශේෂය වන රු. 8,949,305,620 පෙර වර්ෂයේ (2023) පැවති රු. 7,595,769,649 සමග සසඳන කල ක්ෂයවීම් සම්බන්ධව පහත සඳහන් තොරතුරු අදාල කරගත යුතුය.
   අංක 649 හා 1995 ඔක්තෝබර් 05 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛනය සහ අංක 09/2022 (2022 මැයි 05 දිනැති) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛනය දක්වා ඇති පරිදි වාර්ෂික ගිණුම්වල ක්ෂයවීම් සංකල්පය යොදා ගැනීම අනුගමනය කර ඇත. ඒ අනුව 2024 වර්ෂයේ මුළු ක්ෂයවීම් වටිණාකම රු. 910,715,612 කි.
e. 2021 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම යාමේ දී ගෙවනු ලබන පාරිතෝෂික ගෙවීමේ අගය රු 609,836,576 කි. මේවා පාරිතෝෂික පනතේ විධිවිධාන ප්‍රකාර වේ. මේ හා සමාන ආයෝජන දක්නට නොලැබේ.

ආ. අය වැය පාලනය

ගත වූ වර්ෂය තුළ ඵලදායී මූල්‍ය කළමනාකරණ මෙවලමක් ලෙස අය වැය වැඩසටහන යොදා ගන්න ලදී.

ඇ. ගිණුම් ප්‍රත්‍යාගණනය

සියලු පාලන ගිණුම් ප්‍රත්‍යාගණනය කොට ඇති අතර තොරතුරු ලේඛන සකසා මූල්‍ය ප්‍රකාශය සමග ඉදිරිපත් කෙරේ

සාමාන්‍ය

අවසන් වශයෙන් ප්‍රකාශ කළ හැක්කේ විශ්වවිද්‍යාලය ගැටලු කිහිපයකට මුහුණපෑම හේතුවෙන් මිල ගණන් වෙනස් වීම් සහ විවිධ පාලනය කළ නොහැකි තත්වයන් 2024 තුළ දක්නට ලැබුණු බවයි. කෙසේ වෙතත් ඒ සියලු බාධාවන් නොසලකා විශ්වවිද්‍යාලය තම ඉලක්කයන් කරා සාර්ථක අන්දමින් මෙහෙය වීම සඳහා අධ්‍යයන අනධ්‍යයන සහ උසස් අධ්‍යාපන වැඩසටහන් 2024 වර්ෂය තුළ ක්‍රියාත්මක විය.

උපකුලපති

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය උදික් කේ ජයසිංහ

2025 පෙබරවාරි 20

2021 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය තත්ත්වය

		2024 දෙසැම්බර් 31 දිනට	2023 දෙසැම්බර් 31 දිනට
වත්කම්			
ජංගම වත්කම්	**සටහන**		
මුදල් හා මුදල් සමාන දෑ	**1**	636,190,679	610,992,542
ආයෝජන	**2**	475,529,829	376,374,801
වෙළඳ හා වෙනත් ලැබීම්	**3**	66,984,467	34,262,542
පෙර ගෙවුම්	**4**	18,381,494	12,854,731
අත්තිකාරම්	**5**	16,588,524	167,301,623
කාර්යය මණ්ඩල සඳහා ණය	**6**	16,974,045	17,052,037
ඊන්වෙන්ට්‍රි තොග	**7**	51,586,572	45,499,714
ජීවවිද්‍යාත්මක වත්කම්	**8**	547,835	452,890
ගිවිසුම් උල්ලංඝණය කළ අයගෙන් අයකිරීම	**9**	90,610,0074	32,296,913
වෙනත් ජංගම වත්කම්	**10**	56,361,238	50,857,134
		1,429,754,356	1,347,944,927
ජංගම නොවන වත්කම්			
අත්තිකාරම්	**5**	1,013,750.000	1,013,750
බාර්යමණ්ඩලය සඳහා ණය	**6**	41,535,634	41,625,994
දේපල, පිරියත සහ උපකරණ	**11**	9,980,294,554	9,562,090,866
ඌයෝජන / දේපල	**12**	427,785,176	-
ක්‍රියාත්මක කෙරෙන මූලධන කටයුතු	**13**	1,816,820,722	1,006,020,396
		12,267,449,836	10,610,751,005
මුළු වත්කම්		13,697,204,192	11,958,695,931

වගකීම්			
ජංගම වගකීම්	**14**	166,057,904	184,530,330
විවිධ ණය හිමියෝ	**15**	1,823,529	5,389,586
වියදම් ණය හිමියෝ	**16**	117,581,853	125,651,134
කල්තැබූ වගකීම්	**17**	48,480,876	27,295,758
වෙනත් වගකීම්	**18**	649,167,920	507,767,553
		983,412,161	850,634,343
කල්තැබූ වගකීම්	**17**	90,610,074	32,296,913
		90,610,074	32,296,913
ජංගම නොවන වත්කම්			
වෛද්‍ය පීඨයේ ඉඩමට ගෙවිය යුතු මුදල	**19**	108,426,384	101,333,069
පාරිතෝෂික වෙන්කිරීම්	**20**	609,836,576	472,646,076
		718,262,961	573,979,145
මුළු වගකීම්		**1,792,285,196**	**1,456,910,401**
මුළු ශුද්ධ වත්කම්		11,904,918,996	10,501,785,530
සමුච්චිත අරමුදල (ලාභ/අලාභ) මූලධන	21	9,407,824,144	8,007,828,450
සමුච්චිත අරමුදල (ලාභ/අලාභ) ජංගම	22	(458,522,524)	(412,048,801)
මූලධන (වැය නොකල ප්‍රාග්ධන ප්‍රදාන)		147,340,939	204,909,534
නැවත තක්සේරු කිරීම සඳහා ඉතුරුම්		2,291,443,768	2,291,443,768
		11,388,086,326	10,092,114,951
සංචිත හා සීමිත අරමුදල්			
වැඩසටහන් සංවර්ධන අරමුදල	22	169,476,999	132,912,728

පරිත්‍යාග අරමුදල	23	4,383,789	4,014,177
විශේෂඅරමුදල	24	342,971,881	272,743,674
		516,832,669	409,670,599
ඹුළු ශුද්ධ වත්කම් හිමිකම		11,904,918,996	10,501,755,530

වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය මගින් දල්වා ඇති රාජ්‍ය අංශයේ ආයත්න සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවල අවශ්‍යතාවලට සහ 1971 අංක 38 දරණ මූල්‍ය පනත සහ 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාලඒ අනතට අනුව මූල්‍ය ප්‍රකාශය සකස් කර ඇති බව මූල්‍යාධිකාරී සහතික කරයි

(ඩී. ඒ. යූ. ධර්මදාස මයා)
මූල්‍යාධිකාරී
2024. පෙබරවරි 20

මෙම මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කිරීම විශ්වවිද්‍යාල පාලක සභාවේ වගකීමක් වේ. විශ්වවිද්‍යාල පාලක සභාව වෙනුවෙන් සභාපතිවරයා විසින් මෙම ප්‍රකාශ නිකුත් කිරීම සඳහා අවසර ලබා දෙන ලදී

ජ්‍යෂ්ඨ මහාචාර්ය උදික් කේ ජයසිංහ
උපකුලපති
සභාපති - පාලක සභාව

ඩබ්. ඒ. ඩී. චිත්‍රානන්ද මයා
ලේඛකාධිකාරී
ලේකම් – පාලක සභාව

පාලක සභාව වෙනුවෙන් අත්සන් තබන ලදී.

ඩබ් ඒ යූ විජේසිංහ මහතා
පාලක සභා සාමාජික

සුපුන් අධිකාරි මයා
පාලක සභා සාමාජික

2024 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය

ආදායම		**මෙම වර්ෂය 2024**	**පසුගිය වර්ෂය 2023**
පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන		2,295,500,000	2,042,000,000
ශිෂ්‍යාධාර සඳහා රජයේ ප්‍රදාන		55,604,000	49,455,000
වෛද්‍ය පීඨයේ පශ්චාද් උපාධි පුහුණු ගෙවීම්		785,739	-
පුනරාවර්තන ප්‍රතිපාදන - ප්‍රදාන		4,101,596	10,696,492
පුනරාවර්තන මුළු ආදායම		2,355,991,335	2,102,151,492
ගණුදෙනු හුවමාරු මගින් ලත් ආදායම්			
අභ්‍යන්තර ආදායම්	25	29,960,796	29,751,675
ආයෝජන පොළිය	26	36,608,871	28,093,915
කුලී ආදායම	27	5,937,129	6,684,333
විවිධ ලැබීම්	28	6,735,494	21,550,691
ගණුදෙනු හුවමාරු මගින් ලත් මුළු අදායම		79,242,290	86,080,614
ඔඹු ආදායම		2,435,233,625	2,188,232,10
මූලධන ආදායම	29		
හුවමාරු නොවන ගණුදෙනු ආදායම් - මූලධන		2,268,725,651	1,219,130,298
මුළු අදායම්		2,435,233,625	2,188,232,106
පුනරාවර්තන වියදම්	**30**		
පුද්ගල පඩි නඩි		2,008,944,299	1,713,774,403
ප්‍රවාහන		428,725	479,062
සැපයුම් හා පාරිභෝගික භාණ්ඩ		59,060,110	80,736,128
නඩත්තු		40,667,455	35,859,375
කොන්ත්‍රාත් සේවා		271,601,081	307,184,124
වෙනත් වියදම්		41,081,841	48,772,955
ශිෂ්‍යාධාර ගෙවීම්		55,804,000	49,455,000

වෛද්‍ය පිටයේ pgim - md පුහුනු ගෙවීම්		785,739	-
පුනරාවර්තන ප්‍රදාන		4,102,596	10,696,492
සමස්ත පුනරාවර්ත වියදම්		2,482,274,755	2,246,957,569
අදාල කාලයේ අතිරික්තය / හිඟය		**(47,041,130)**	**(58,735,463)**
ගණුදෙනු හුවමාරු ආදායම මූලධන	29	**2,268,725,651**	**1,219,130,298**
හුවමාරු නොවුන ආදායම මුලදන		**2,268,725,651**	**1,219,130,298**
මුලදන වියදම ක්ෂයවීම්	12.1	**910,715,612**	**792,191,032**
මුලදන වියදම (පුනරාවර්තන)		**7,743,335**	**14,297,907**
පර්යේෂන වියදම් (පුනරාවර්තන)		**3,555,036**	**4,125,692**
සම්පත් ඉවත දැමීම		**-**	**949,435**
		921,734,983	**811,560,066**
ගිණුම් වර්ෂය තුළ අතිරික්ත හිඟය		**1,346,990,668**	**407,570,252**
අදාල කාලසීමාවේ අතිරික්තය / හිඟය		**1,299,949,538**	**348,844,769**

2024 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2021 දෙසැම්බර් 31 දිනට රු	2020 දෙසැම්බර් 31 දිනට රු
මෙහෙයුම් ක්‍රියාකාරීත්වයෙන් ලද මුදල් ප්‍රවාහය		
සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් අතිරික්තය / හිඟය	1,299,949,538	348,844,768
එකතු කළා- මූල්‍ය නොවන සංචලන		
ක්ෂයවීම්	910,715,612	792,194,032
පාරිතෝෂික	159,234,495	108,394,652
ගෙවන ලද පාරිතෝශික	(22,043,995)	(26,000,990)
නැවත් තක්සේරු කිරීම සඳහා වෙන්කල මුදල් ගැලපීම	-	(2,411,412)
වත්කම් අපහරණ පාඩුව	-	-944,435
වෛද්‍ය පීඨයේ ඉඩම සඳහා පොළිය	7,093,315	-
පරිත්‍යාග ලැබීම් - මූලධන	(1,667,801,632)	(407,025,268)
වෙලඳ සහ අනෙකුත් ලැබිය යුතු මුදල් (අඩුවීම් / වැඩිවීම්)	(32,721,925)	(34,112,724)
පෙරගෙවුම් (අඩුවීම් / වැඩිවීම්)	(5,526,363)	(8,813,128)
අත්තිකාරම් (අඩුවීම් / වැඩිවීම්)	150,713,099	18,763,400
කාර්යමණ්ඩලය සඳහා ණය (අඩුවීම් / වැඩිවීම්)	168,352	(305,039)
තොග (අඩුවීම් / වැඩිවීම්)	(6,086,858)	(2,193,740)
ජීවවිද්‍යාත්මක වත්කම්	(94,945)	(452,890)
ගිවිසුම් කඩකල අයගෙන ලැබීම	158,313,161	(32,296,913)
අනෙකුත් ජංගම වත්කම් (අඩුවීම් / වැඩිවීම්)	(5,504,103)	(25,029,444)
විවිධ ණය හිමියෝ (අඩුවීම් / වැඩිවීම්)	(18,472,346)	(59,659,808)
වියදම් හිමියො (අඩුවීම් / වැඩිවීම්)	17,769,281	19,913,279
වගකීම් (අඩුවීම් / වැඩිවීම්)	79,498,279	59,592,671
වෙනත් (අඩුවීම් / වැඩිවීම්)	141,400,367	75,948,815
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය	920,872,409	829,764,087

ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත මුදල්		
දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම	92,881,008	797,931,247
සීමිත අරමුදල් ආයෝජන	99,155,028	96,192,453
ක්‍රියාත්මක වන ප්‍රාග්ධන කටයුතු	810,800,327	228,398,429
පරිත්‍යාග අරමුදල	369,612	1,089,141
ආයෝජන වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය	1,002,466,751	664,636,129
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත මුදල් ප්‍රවාහය		
විශේෂ අරමුදල	70,228,207	111,413,578
වැඩසටහන් සංවර්ධණ අරමුදල	36,564,272	44,972,357
මූල්‍ය ක්‍රියාකාරීත්වයන්ගෙන් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය	106,792,479	156,385,934
මුදල් සහ මුදල් හා සමාන දෑ (අඩුවීම් / වැඩිවීම්)	25,198,137	321,513,893
කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ	610,992,542	289,478,649
කාලපරිච්ඡේදය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ	636,190,679	610,992,542

2024 මූල්‍ය ප්‍රකාශය

1. විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්ති
   1.1. ස්ථාපිත ටොරතුරු
   1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය ස්ථාපනය කරන ලද අතර එය කුලියාපිටිය කනදුල්ලෙහි පිහිටා තිබේ

   1.2. නිකුට් කිරීම සඳහා අවසර ලබාදුන් දිනය
   2025 පෙබරවාරි මස 20 වන දින පැවති ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයීය 255 වෙනි පාලක සභා රැස්වීමේදී ශ්‍රී ලංකා වයඹ විද්‍යාලයේ 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය නිකුත් කිරීම සඳහා අවසර ලබා දෙන ලදී

   1.3. වාර්තාකරන කාලපරිච්ඡේදය
   විශ්වවිද්‍යාලයේ වාර්ථාකරන කාලපරිච්ඡේදය 2024 ජනවාරි මස 01 වන දින සිට දෙසැම්බර් මස 31 වන දින දක්වා වේ.

2. විශේෂ ගිණුම්කරන ප්‍රතිපත්ති පිළිබඳ සාරංශය
   2.1. අනුකූලතා ප්‍රකාශය

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරන ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කර ඇති අතර රාජ්‍ය අංශයේ ගිණුම්කරන ප්‍රමිත නොමැති අවස්ථාවලදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතද උපයෝගී කොට ගැනේ. මෙම මූල්‍ය ප්‍රකාශන වලට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය මූල්‍ය කාරය සාධන ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය අය වැය සහ තථ්‍ය ප්‍රමාණ සහ සටහන් සාරංශ සහ ගිණුම්කරණ ප්‍රමිත සහ වෙනත් හෙලිදරව් කිරීම්වලින් සමන්විත වේ

2.2. මිණුම්කිරීමේ පදනම

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයීය මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇති අතර ප්‍රමාණාත්මක වෙනස්කම් පිරිවැය සහ තථ්‍ය අගය අතර ප්‍රමාණාත්මක වෙනස්කම් පිරිවැය සහ තථ්‍ය අගය අතර වෙනස්කම් මෙයින් වෙනස් වේ

2.3. ප්‍රමාණාත්මකභාවය සහ සමාහරණය

සෑම ප්‍රමාණාත්මක සමාන අයිතම පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙනම ඉදිරිපත් කර ඇත. අසමාන ස්වභාවයේ හෝ ක්‍රියාකාරීත්වයේ පවත්නා අයිතම ප්‍රමාණාත්මක නොවන්නේ නම් හැර වෙනම ඉදිරිපත් කර ඇත.

2.4. හිලව් කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත මගින් නියමකර හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් සහ අදායම් හා වියදම් හිලව් කර නොමැත

2.5. සන්සන්ධනාත්මක අගයන්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව න්‍යාම කර ඇති අවස්ථාවන්හිදී මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ දී සිදු වී ඇති වෙනස්කම් සනාත කිරීම සඳහා සන්සන්ධනාත්මක අගයන් ගැලපුම් කර ඇත

2.6. ක්‍රියාකාරී හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකක

විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමෙ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලින් මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලැබේ

2.7. අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පැවැත්ම මත පිහිටා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති අතර අවශ්‍ය අවස්ථාවන්හිදී ගැලපීම් සිදු කෙරේ

2.8. වාර්ථාකරණ කාලයට පසු සිදුවීම්

වාර්තා කරන ලද කාලයට පසුව සිදු වූ සියලු සිදුවීම් සලකා බලන ලද අතර සුදුසු හා අවශ්‍ය අවස්ථාවන් වල දී මූල්‍ය ප්‍රකාශවල ගැලපීම් සිදු කර ඇත.

2.9. විදේශ මුදල් ගණුදෙනු හා ශේෂ

අදාල ගණුදෙනු සිදුවන දිනවල පවතින විනිමය අනුපාත භාවිත කරමින් විදේශ මුදල් ගණුදෙනු ක්‍රියාකාරී මුදල්ට පරිවර්තනය කෙරේ. ඒවා පියවීමෙන් සහ වත්කම් හා බැරකම් වසර අවසානයේ දී සිදු කරන ලද පරිවර්තනයන් විදේශ මුදල් ලාභ / අලාභ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ හඳුනා ගැනේ.

*** අත්සන් ඉංග්‍රීසි පිටපතෙහි ඇත

විගණකාධිපති වාර්තාව

2024

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. NWCG/KR/D/WUSL/2024/FA/01

ඔබේ අංකය உமது இல. Your No.

WAYAMBA UNIVERSITY OF SRI LANKA KULIYAPITIYA
25 JUN 2025
VC - 433
REGISTRAR'S OFFICE

திகதி Date 2025 මැයි 30 දින

WAYAMBA UNIVERSITY OF SRI LANKA
2657-1
17 JUN 2025

Fwd:

18/Jun/2025
VICE-CHANCELLOR
WAYAMBA UNIVERSITY OF SRI LANKA
KULIYAPITIYA.

උපකුලපති,
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ("විශ්වවිද්‍යාලය") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුළත්, මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ඉකුත් වර්ෂයන්ට අදාළ රු.2,214,330ක් වූ ස්වයං මූල්‍ය පාඨමාලාවන්ගෙන් විශ්වවිද්‍යාල දායකත්ව ආදායම, වර්ෂයේ ආදායමට ගිණුම්ගත කර තිබීමෙන් හා සමාලෝචිත වර්ෂයට අදාල විශ්වවිද්‍යාල දායකත්ව ආදායම රු.1,605,757ක් වර්ෂයේ ආදායමට ගිණුම්ගත නොකිරීමෙන් වර්ෂයේ අතිරික්තය රු. 608,573කින් වැඩියෙන් දක්වා තිබුණි. එසේම ඉකුත් වර්ෂයන්ට අදාළ විශ්වවිද්‍යාල දායකත්ව ආදායම රු.558,910ක් හඳුනානොගැනීම හේතුවෙන් සමුච්චිත අරමුදල එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) පිරිවැය රු.189,170,790ක් වූ භාවිතාකල හැකි තත්ත්වයේ නොපවතින වෛද්‍ය පීඨයේ ශ්‍රවනාගාරය 2020 වර්ෂයේදී වත්කමක් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා ගොඩනැගිලි වත්කම හා කෙරීගෙන යන වැඩ එම වටිනාකමින් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 14 හා 69 ඡේද අනුව වත්කම් භාවිතයට ගැනීමට සුදුසු තත්ත්වයකට පත්වූ දින සිට ක්ෂය කිරීම ආරම්භ කළ යුතු වුවත් ඊට අනුකූල නොවන ලෙස ක්ෂය කිරීම හේතුවෙන් සමුච්චිත ක්ෂය රු.38,622,370ක් වැඩියෙන්ද සමුච්චිත අරමුදල රු.29,163,830ක් හා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.9,458,540ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 19 වන ඡේදය ප්‍රකාරව මාකඳුර පරිශ්‍රයේ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය වෙත විදුලි සැපයුම් ලබාදීම වෙනුවෙන් 2020 වර්ෂයේදී දරන ලද රු.4,436,225ක් ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් ගොඩනැගිලි වටිනාකම හා වර්ෂයේ අතිරික්තය අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 19 හා 58 ඡේද අනුව වෙනම වත්කම් පන්ති ලෙස හඳුනාගත යුතු පිරිවැය රු.36,671,442ක් වූ මාර්ග පද්ධති හා අන්තර් සම්බන්ධිත කුට්ටිගල් ඇතිරූ මාර්ග හා රු.15,607,903ක් වූ සන්නිවේදන ජාල උපකරණ වටිනාකම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ පිළිවෙලින් ඉඩම් යටතේ හා කාර්යාල උපකරණ සහ පරිගණක උපාංග යටතේ ගිණුම් ගත කර තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 47 ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණවල සාධාරණ වටිනාකම් වෙනස්වීම් සෑම වසර තුනකට හෝ පහකට වරක් ප්‍රත්‍යාගනණය කර මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කළ යුතු වුවද, විශ්වවිද්‍යාලය සතු ඉඩම් හා ගොඩනැගිලි පිළිවෙලින් 2013 වර්ෂයේදී රු.325,750,000කට හා 2016 වර්ෂයේදී රු.3,784,300,000 කට ප්‍රත්‍යාගණනය කිරීමෙන් පසු පිළිවෙලින් වර්ෂ 11 ක් හා වර්ෂ 08 ගත වී තිබුණද නැවත ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 58 ඡේදය අනුව සමාලෝචිත වර්ෂය තුළදී නගර සංවර්ධන ව්‍යාපෘතිය මගින් වැඩ නිම කර භාරදෙන ලද වත්කම් ගිණුම්ගත කිරීමේදී වෙන වෙනම වත්කම් පන්ති යටතේ හඳුනාගත යුතු වටිනාකම රු.379,700,492ක් වූ ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ, විදුලි හා සවිකිරීම් සහ ජලනල, අපජල නල, කානු අයිතම ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර ගොඩනැගිලිවලට අදාල ප්‍රතිශතය යටතේ ක්ෂය කිරීම හේතුවෙන් වර්ෂයේ ක්ෂය රු.9,210,753ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. ඒ අනුව වර්ෂයේ අතිරික්තය සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දේපළ පිරියත උපකරණ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි.

(උ) 2024 ජනවාරි 29 දිනැති අංක 01/2024 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මූල්‍ය චක්‍රලේඛ ලිපිය අනුව බැදුම්කර ගිවිසුම් කඩකල පුද්ගලයන්ගෙන් අයවිය යුතු ශේෂය සඳහා සමාලෝචිත වර්ෂයට අදාළ අයකළ යුතු රු.12,517,718ක පොළිය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) පිරිවැය රු.948,000,017ක් වූ දේපල පිරියත උපකරණ භාවිතයට සුදුසු තත්ත්වයට පත් වූ අවස්ථාවේ සිට ක්ෂය ගණනය නොකිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය හා දේපල පිරියත හා උපකරණ ශේෂය රු.21,305,996ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි.

(එ) ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38(අ) අතුරු විධානය යටතේ විශ්වවිද්‍යාලය විසින් 2024 සැප්තැම්බර් 26 දින භුක්තිය භාර ගෙන තිබූ මාකඳුර පරිශ්‍රයේ පර්චස් 214 ක් වූ ඉඩම් කැබලි දෙක සමාලෝචිත වර්ෂය තුළදී ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. අදාළ පනත ප්‍රකාරව භුක්තිය ලබා ගත් දින සිට සියයට 7ක පොළිය සඳහා වෙන් කිරීමක් සිදුකර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.2 විශ්වවිද්‍යාලයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන විශ්වවිද්‍යාලයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාලව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

විශ්වවිද්‍යාලයේ 2024 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කල යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම

හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලයේ පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලයට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීති, රීති / විධානයට යොමුව	**අනුකූල නොවීම**
(අ)	1971අංක 38 දරන මුදල් පනතේ 11වන වගන්තිය	අදාළ විෂයභාර අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව විශ්වවිද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.475,529,828ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.
(ආ)	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ සංශෝධිත ආයතන සංග්‍රහයේ 09 වෙනි පරිච්ඡේදයේ 3.1 ඡේදය	විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්යමණ්ඩලයේ පැමිණීම හා පිටවීම විධිමත් ලෙස තහවුරු කර නොගෙන සමාලෝචිත වර්ෂය තුළදී වැටුප් හා දීමනා ලෙස රු.1,388,115,483ක් ගෙවා තිබුණි.
(ඇ)	1992 අංක 62 දරන පාරිතෝෂික ගෙවීම් (සංශෝධන) පනතේ 4(1) වන උපවගන්තිය	නිලධාරීන් 19 දෙනකුට පාරිතෝෂික ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු.1,942,355ක් අධිභාර ගෙවීමට පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 වෙනත් කරුණු

(අ) AHEAD ව්‍යාපෘතිය මඟින් වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය, තාක්ෂණ පීඨය සහ පශු සම්පත්, සීවර හා පෝෂණ පීඨ වෙත 2020 හා 2021 වර්ෂවලදී ලබාදී තිබුණු රු.8,013,485ක රසායනාගාර උපකරණ 2024 දෙසැම්බර් 31 දින වන විටත් නිෂ්කාර්යව පැවතුණු අතර රු.6,168,402ක් වටිනා රසායනාගාර උපකරණවල වගකීම් කාලය 2024 ජූනි වන විට අවසන් වී තිබුණි.

(ආ) 2020 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු නිමකර වෛද්‍ය පීඨයට භාරදී තිබුණු රු.23,159,226ක වටිනාකමින් යුත් ප්‍රජා මධ්‍යස්ථානය වර්ෂ 05 කට ආසන්න කාලයක සිට ඌන උපයෝජිතව පැවතුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ ව්‍යාපෘති 11කට අදාළව එකතු වටිනාකම රු.46,364,339ක් වූ රැඳවුම් මුදල්වලට අදාළ වගකීම් කාලය ඉකුත් වී වර්ෂ 11 සිට මාස 05 දක්වා කාලයක් ගතවී තිබුණද අදාළ මුදල් නිදහස් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) බැඳුම්කර ගිවිසුම් කඩකල කථිකාචාර්යවරියකගෙන් අයකල යුතු බැඳුම්කර වටිනාකම රු.4,666,714ක් අඩුවෙන් ගණනය කර තිබුණු අතර එම හිඟ බැඳුම්කර මුදල අදාල කථිකාචාර්යවරියගෙන් හෝ දෝෂ සහිතව ගණනය කළ නිලධාරීන් හඳුනාගෙන ඔවුන්ගෙන් හෝ එම මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) විශ්වවිද්‍යාලය 1999 වර්ෂයේ සිට පවත්වාගෙන යනු ලබන තක්සේරු වටිනාකම රු.40,000,000ක් වූ මාකඳුර පරිශ්‍රයේ අක්කර 22 ක ඉඩම් නීත්‍යානුකූලව විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) මාකඳුර පරිශ්‍රයේ පර්චස් 74 ක් පමණ වූ කුඹුරු ඉඩම් කැබලි 03 ක් පවරා ගැනීම සඳහා රු.1,013,750ක අත්තිකාරම් මුදලක් හා පොල් පර්යේෂණ මණ්ඩලයට අයිති අක්කර 05 ක ඉඩම පවරා ගැනීම සඳහා රු.මිලියන 10ක මුදලක් 2013 හා 2014 වර්ෂයන්හිදී පිළිවෙලින් පන්නල ප්‍රාදේශීය ලේකම් වෙත හා පොල් පර්යේෂණ මණ්ඩලය වෙත ගෙවීම් කර වසර 11ක් පමණ ගතවී තිබුණද එම ඉඩම් නීත්‍යානුකූලව විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

ජී.එච්.ඩී. ධර්මපාල
විගණකාධිපති (වැ.බ)

<u>ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය සහ 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව</u>

1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) මෙය නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. 2024.12.31 දිනට මෙම ශේෂයන් ගිණුම්ගත කර ඇති බැවින් එදිනට සමුච්චිත අරමුදලෙහි අඩුවක් නොමැත.

(ආ) වෛද්‍ය පීඨයේ ඉදිකිරීමේ කොන්ත්‍රාත් ගිවිසුම්වලට අනුකූලව ශ්‍රවනාගාරය ඉදිකිරීමේ කටයුතු නිම කර ඇති බැවින් සහ එය පීඨයේ ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන බව දැනුම් දී ඇති බැවින් 2020.12.31 දින එය වත්කමක් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර ඇති අතර එදින සිට ක්ෂය ප්‍රතිපාදනය ද සිදු කරයි.

එහෙත්, මෙම ශ්‍රවණාගාරය සඳහා ආසන සවි කිරීමේ කාර්යය උක්ත කොන්ත්‍රාත්තුවේ වගකීමක් නොවන අතර එය අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සිදු කරගෙන යනු ලබයි. ඒ අනුව, ශ්‍රවණාගාර පුටු 300 ක් සවි කිරීම සඳහා එම ව්‍යාපෘතිය මඟින් Your Home Furniture (Pvt) Ltd ආයතනය වෙත කොන්ත්‍රාත්තුව පිරිනමා ඇති අතර කොන්ත්‍රාත්කරු විසින් Leg box 65, W. Pad box 10 සහ Arm box 07 ක් මේ වන විටත් සවි කර ඇත.

(ඇ) මෙම රු. 4,436,225/- ක් මාකඳුර පරිශ්‍රයේ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයට විදුලි සැපයුම ලබා ගැනීම වෙනුවෙන් ලංකා විදුලි බල මණ්ඩලය වෙත ගෙවීම් කර ඇත. මෙය විදුලි බල මණ්ඩලය විසින් සවිකරනු ලබන ට්‍රාන්ස්ෆෝමරය සහ අනෙකුත් උපකරණ සඳහා සහ සේවා ගාස්තුව සඳහා කරන ගෙවීමක් වන බැවින් සහ විදුලි ට්‍රාන්ස්ෆෝමරය විදුලි බල මණ්ඩලයේ වත්කමක් වන බැවින් විශ්වවිද්‍යාලයේ ගිණුම්වල මෙය දේපල, පිරියත, උපකරණ යටතේ ප්‍රාග්ධනිත කිරීම හෝ ඒ සඳහා ක්ෂය ප්‍රතිපාදනය කිරීම සිදු කළ නොහැක. එබැවින්, ගොඩනැගිලි වටිනාකම හෝ වර්ෂයේ අතිරික්තය අඩුවෙන් දක්වා නොමැත. **(ඇමුණුම - 01)**

(ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 649 සහ 09/2022 අනුව විශ්වවිද්‍යාලයේ මාර්ග පද්ධති වෙනම වත්කම් පන්තියක් ලෙස වර්ගීකරණය කර නොමැත. කෙසේ වුවද මාර්ග පද්ධති වටිනාකම ඉඩම් වටිනාකමෙන් වෙන් කර ගැනීමට විශ්වවිද්‍යාලය මඟින් උත්සාහ කළද වටිනාකම තක්සේරු කිරීමට නොහැකි බව තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ප්‍රකාශ කර තිබීම සහ විධිමත් ක්‍රමවේදයකට අනුව වටිනාකම තක්සේරු කිරීමෙන් පසුව සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් වත්කම් පන්ති වර්ගීකරණයක් හා අදාළ ක්ෂය ප්‍රතිශතය පිළිබඳව දැනුම් දුන් පසුව ඒ අනුව ගිණුම් පිලියෙල කරන බවට 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා ලබා දී තිබෙන හෙලිදරව් කිරීමේ සටහන් අංක 2.37.4 මඟින් දක්වා ඇත. **(ඇමුණුම - 02)**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 649 සහ 09/2022 අනුව වත්කම් පන්ති වර්ගීකරණය කර ක්ෂය ගණනය කරනු ලැබේ. ඉහත කී චක්‍රලේඛනයන්හි සන්නිවේදන ජාල උපකරණ වෙනම වත්කම් පන්තියක් ලෙස හඳුනාගෙන නොමැති බැවින් විශ්වවිද්‍යාලයේ ගිණුම්වල ද එසේ දක්වා නොමැති අතර කාර්යාල උපකරණ සහ පරිගණක උපාංග යටතේ ගිණුම්ගත කර ක්ෂය ප්‍රතිපාදනය කර ඇත.

(ඉ) 2024.02.22 දිනැති Association of Public Finance Accountants of Sri Lanka සභාපති විසින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් හට යැවූ ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රමිත අංක 03

හි සිදු කල වෙනස්කම් පිළිබඳ ලිපිය **(ඇමුණුම - 03)** සහ Association of Public Finance Accountants හි ලේකම් විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ගණකාධිකාරී ඇමතූ ලිපිය අනුව **(ඇමුණුම - 04)** විශ්වවිද්‍යාලයේ දේපල, පිරියත, උපකරණ වටිනාකම් ගිණුම්ගත කිරීම සම්බන්ධ ගිණුම් ප්‍රතිපත්තිය පාලක සභා අනුමැතිය ලබා ගැනීමෙන් පසුව වෙනස් කර ඇත. ඒ අනුව 2024 වර්ෂයේ සිට පිරිවැය ක්‍රමය අනුව දේපල, පිරියත, උපකරණ ගිණුම්ගත කිරීමද ප්‍රත්‍යාගණනය කළ වත්කම් පන්තීන් deemed පිරිවැය (deemed cost) අනුව ගිණුම්ගත කර ඇති අතර මේ බව 2024 මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් ප්‍රතිපත්ති අංක 2.13.5 යටතේ සඳහන් කර ඇති බැවින් ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කර නොමැත.

(ඊ) නගර සංවර්ධන ව්‍යාපෘතිය මඟින් ඉදිකර වැඩ නිම කර තිබූ ගොඩනැගිලිවල සාධාරණ අගය සහ ගෘහ භාණ්ඩවල වටිනාකම පිළිබඳව නගර සංවර්ධන ව්‍යාපෘතිය මඟින් ලබා දුන් තොරතුරු අනුව ගිණුම්ගත කර ඇත. **(ඇමුණුම - 05)** 2025 වර්ෂයේ නගර සංවර්ධන ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම නිම කළ පසුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අනුව වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.

(උ) 2024.08.23 පැවති 85 වැනි විගණන කමිටු තීරණය අනුව, අනුමත ගෙවීම් සැලසුමකට අනුව ගෙවීම් කරන අයවලුන්ගෙන් පොලියක් අය නොකිරීමට තීරණය කර ඇත. ඒ අනුව, බැදුම්කර ගිවිසුම් උල්ලංඝණය කර ඇති ආර්.එම්.ඩබ්.එස්. රත්නායක යන අය පමණක් ගෙවීම් කටයුතු නිසි පරිදි සිදු නොකරන අතර අනෙක් අය සැලසුමකට අනුකූලව ගෙවීම් කටයුතු සිදු කරයි. **(ඇමුණුම - 06)**

(ඌ) දේපල, පිරියත, උපකරණ සඳහා ගෙවිම් කරන දින සිට හෝ පරිත්‍යාග ලැබුණු දින සිට ක්ෂය කිරීම සිදු කර තිබෙන අතර එම වත්කම් භාවිතයට ගැනීමට සුදුසු තත්වයට පත්වූ දිනය තහවුරු කරගෙන එදින සිට ක්ෂය ගණනය කිරීමට කටයුතු කරනු ලැබේ.

(එ) මෙම ඉඩම් කොටස්වල නිරවුල් භුක්තිය ඉඩම් හිමියන් විසින් 2024.09.26 දින විශ්වවිද්‍යාලය වෙත බාර දී ඇතත් එම ඉඩම් කොටස් සඳහා නීත්‍යානුකූලව පැවරුම්පත්‍ර ලබා දී නොමැති බැවින් එහි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ නොහැක. එහෙත්, මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 2.37.3 මඟින් මේ පිළිබඳව තොරතුරු හෙලිදරව් කර ඇත.

2. <u>වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව</u>

2.2.2

(අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය

මෙම මුදල් ආයෝජනය කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ මුදල් කමිටුවේ සහ පාලක සභාවේ අනුමැතිය ලබා ගෙන ඇත. සමාලෝචිත වර්ෂයේ දී නව ස්ථාවර තැන්පතු 03 ක ආයෝජනය කර තිබූ රු. 41,600,000/- සඳහා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ සංශෝධිත ආයතන සංග්‍රහයේ 09 වෙනි පරිච්ඡේදයේ 3.1 ඡේදය

විශ්වවිද්‍යාලයක සාමාන්‍ය රාජකාරි වේලාව පෙ.ව. 8.00 සිට ප.ව. 5.30 පමණ වනතෙක් පැවතිය ද බොහෝවිට එය මධ්‍යම රාත්‍රිය දක්වා වුවද දීර්ඝ වන අවස්ථා පවතී. එසේම ආචාර්යවරයකුගේ දෛනික රාජකාරිවලින් දේශන පැවැත්වීම යනු එක් කාර්යභාරයක් පමණක් වේ. එයට අමතරව, නිතිපතා දේශන සඳහා සූදානම් වීම, නිබන්ධන සෑදීම, ප්‍රශ්නපත්‍ර පිළියෙල කිරීම, සෝදුපත් කියවීම,

විභාග පැවැත්වීම, උත්තර පත්‍ර පරීක්ෂාව, පර්යේෂණ පැවැත්වීම, මෙහෙයවීම, ශිෂ්‍ය පර්යේෂණ සුපරීක්ෂණය, පර්යේෂණ පත්‍රිකා පිළියෙල කිරීම, එළිදැක්වීම, පර්යේෂණ පත්‍රිකා සමාලෝචනය, විෂය මොඩියුල සැකසීම, විෂයමාලා සංවර්ධනය, විෂයමාලා ප්‍රතිශෝදනය, විවිධාකාර වූ ශිෂ්‍යයන් සම්බන්ධ රාජකාරි, ශිෂ්‍ය උපදේශන කටයුතු ඇතුලු විශාල රාජකාරි ප්‍රමාණයක් දෛනිකව ආචාර්යමණ්ඩලය විසින් ඉටුකරනු ලබන අතර මෙයට අමතරව පාලක සභා නියෝජනය, සනාතන සභා රාජකාරි, පීඨාධිපති, අධ්‍යයන අංශ ප්‍රධාන, විනය පාලක, විවිධ අධ්‍යක්ෂ තනතුරු, උපදේශක සේවා වැනි පරිපාලනමය රාජකාරී ද ඉටු කරනු ලබයි. මෙම රාජකාරි නිරන්තරව ම වසර පුරාම පූර්ණකාලීනව සිදු කළ යුතුව ඇති අතර එය පැය 08 රාජකාරියක් නොව ඉන් ඔබ්බට ද පැතිරී යන එකකි.

මේ සියලු රාජකාරි අධ්‍යයන කාර්යමණ්ඩල භවතුන් විසින් පූර්ණකාලීනව අඛණ්ඩව සිදු කරනු ලබන නිසාත් ඒ සඳහා නිශ්චිත වේලාවක් නොමැති හෙයිනුත් සාමාන්‍ය පිළිවෙතක් ලෙස ලාංකීය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අධ්‍යයන කාර්යමණ්ඩලය ඇඟිලි සලකුණු යන්ත්‍රානුසාරයෙන් තැබීම හෝ වෙනත් ආකාරයකින් පැමිණිම හා පිටවීම සලකුණු නොකරන බව පෙන්වා දෙනු කැමැත්තෙමි.

එහෙත්, ඔවුන් විසින් සිය රාජකාරී නොපිරිහෙලා ඉටු කරනු ලබන බවට වන සාක්ෂි ශිෂ්‍ය පැමිණීමේ ලේඛන සහ ඉහතින් සඳහන් කරන ලද විවිධ අධ්‍යයන කාර්යයන්වල නියැලීමේ දී තබන ලද අත්සන් ලේඛන තුළින් තහවුරු කර ගත හැකිය.

(ඇ) 1992 අංක 62 දරන පාරිතෝෂික ගෙවීම් (සංශෝධන) පනතේ 4(1) වන උපවගන්තිය

පාරිතෝෂික ගෙවීම් පනත අනුව සේවය අවසන් කළ දින සිට දින 30 ක් ඇතුළත පාරිතෝෂික මුදල් ගෙවා අවසන් කළ යුතු වුවත් සේවය අවසන් කිරීම විවිධ ආකාරයෙන් සිදුවීම සහ ඒ සඳහා බලපාන විශේෂ හේතු මත මෙම පාරිතෝෂික ගෙවීම දින 30 ක් ඇතුළත ගෙවීම් කිරීම ප්‍රායෝගිකව කළ නොහැකි වී ඇත.

විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ V වන පරිච්ඡේදයේ 4.5 ඡේදය අනුව සේවයෙන් ඉල්ලා අස් වූ සේවකයෙකුගේ ඉල්ලා අස්වීම පත්වීම් බලධරයා විසින් බාර ගන්නා තෙක් එම ඉල්ලා අස්වීම ක්‍රියාත්මක නොවේ. විශ්වවිද්‍යාල සේවකයෙකුගේ ඉල්ලා අස්වීම බාර ගත යුත්තේ පත්වීම් බලධරයා වන පාලක සභාව විසින් වන අතර යම් සේවකයෙකු ඉල්ලා අස් වීමේ ලිපියක් බාර දුන් පසු එම ඉල්ලා අස්වීම බාර ගනු පිණිස එළඹෙන ආසන්නතම පාලක සභා රැස්වීම වෙත ඉදිරිපත් කරනු ලබන අතර එහි අනුමැතිය ලැබෙනුයේ ඊළඟ පාලක සභා රැස්වීමේ දී අදාළ තීරණය තහවුරු කිරීමෙන් පසුව වේ.

විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ V වන පරිච්ඡේදයේ 7.9 ඡේදය අනුව; විශ්වවිද්‍යාලය විසින් අදාළ තැනැත්තාගේ ඉල්ලා අස්වීම බාර ගන්නා තෙක් සේවය අවසන් වීම මත හිමි වන කිසිදු ගෙවීමක් අනුමත නොකළ යුතු ය.

යථොක්ත විගණන විමසුමෙන් දක්වා ඇති සේවක භවතුන්ගෙන් කිහිප දෙනෙකු හට ඉල්ලා අස් වන අවස්ථාවේ දී විනය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක වෙමින් පැවති අතර එම විනය ක්‍රියාමාර්ගයන්හි අවසන් තීරණය පාලක සභාවට යොමු කර පාලක සභාව විසින් එම ඉල්ලා අස්වීම බාර ගත් බවට හෝ බාර නොගත් බවට වන තීරණය ලබා දෙන තෙක් එම පාරිතෝෂික ගෙවීම අනුමත කළ නොහැකි බැවින් අදාළ ගෙවීම් ප්‍රමාද වී ඇත.

එසේම, බැඳුම්කර ගිවිසුමක් මත අධ්‍යයන නිවාඩු ලබා සිටින අතරතුර සිය ඉල්ලා අස්වීම බාර දී ඇති අවස්ථාවක ඉල්ලා අස්වීම බාර ගත හැක්කේ අදාළ බැඳුම්කර වටිනාකම සම්පූර්ණයෙන් පිය වූ පසු පමණි.

තව ද, ඇතැම් සේවකභවතුන් සිය ඉල්ලා අස්වීම බාරදුන් පසුව විශ්වවිද්‍යාලය විසින් දැනුම්දෙනු ලබන එහි ප්‍රතිවිපාක පිළිගැනීමේ ලිපිය ඔවුන් විසින් විශ්වවිද්‍යාලයට ලබා දීමට ප්‍රමාද වීම, ඉල්ලා අස්වීමේ ලිපි බාර දෙන අවස්ථාවේ දී ඔවුන්ට හිමි විය යුතු අවසාන වැටුප් වර්ධකය වැටුප් රහිත නිවාඩු ලැබ පසුව සේවයට වාර්තා කිරීම මත හෝ වෙනත් හේතු මත විශ්වවිද්‍යාලය විසින් ලබා දී නොනිබීම සහ පාරිතෝෂික මුදල් බැංකුගත කිරීමට අදාළ ගිණුම් විස්තර ඔවුන් විසින් නිසි වේලාවට නිවැරදිව විශ්වවිද්‍යාලයට ලබා නොදීම මත පාරිතෝෂික ගෙවීම් ප්‍රමාද වී ඇත.

තවද, විශ්වවිද්‍යාල පද්ධතිය තුළ 2024 මැයි සිට 2024 ජූලි දක්වා පැවති අනධ්‍යයන සේවක වෘත්තීය ක්‍රියාමාර්ගය නිසා ද විමසුමේ සඳහන් පාරිතෝෂික ගෙවීම් ප්‍රමාද වී ඇත.

කෙසේවෙතත්, ඉහතින් සඳහන් කළ අවශ්‍යතා සම්පූර්ණ කළ වහාම පාරිතෝෂික ගණනය කර අධ්‍යයන/ අනධ්‍යයන ආයතන අංශය විසින් අභ්‍යන්තර විගණන අංශය හරහා මුදල් අංශය වෙත යොමු කරන අතර ඉහතින් සඳහන් කළ සේවකයින්ගේ ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා සේවක දැනුවත් කිරීම් සිදු කර ඇත.

2.3 වෙනත් කරුණු

(අ) භාවිත නොකළ රසායනාගාර උපකරණ - වෛද්‍ය පීඨය

RT- PCR යන්ත්‍රය - මෙම යන්ත්‍රය සඳහා සකස්කර ඇති විද්‍යාගාරයේ නිම කිරීම් කටයුතු අවසන් කර නොමැති වීම නිසා යන්ත්‍රය ස්ථාපනය කර පරීක්ෂණ කටයුතු ආරම්භ කිරීමේ නොහැකියාව පැවති අතර එහි වැඩ කටයුතු මේ වනවිට ආරම්භ කර ඇති අතර එම කටයුතු අවසන්වූ වහාම යන්ත්‍රය පාවිච්චියට ගැනීමේ හැකියාව ඇත.

තවද, ක්ෂුද්‍ර ජීව විද්‍යා අධ්‍යනාංශයෙහි Micro Biologist තනතුර සඳහා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු බඳවාගෙන ඇති අතර එම අධ්‍යනාංශයෙහි තාක්ෂණික නිලධාරී PCR යන්ත්‍ර සම්බන්ධයෙන් විශේෂ පුහුණු වැඩසටහනකට සහභාගී කිරීමට නියමිතය.

B2 Bio Safety Cabinet - මේ සඳහා අවශ්‍ය වූ Molecular Diagnosis Laboratory මේ වන විට සාදා එය පාටිෂන් කර B2 Bio Safety Cabinet එක එහි ස්ථාපිත කර පාවිච්චියට ගෙන ඇත.

භාවිත නොකළ රසායනාගාර උපකරණ - තාක්ෂණ පීඨය

Fume Hood with Centrifugal Fan - මෙම උපකරණය සවිකිරීම සඳහා නව පීඨ ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් අවසන් වන තෙක් සිටීමට සිදු වූ අතර මේ වන විට එම උපකරණය නව පීඨ ගොඩනැගිල්ලෙහි ස්ථාපිත කර ඇත.

දැනට අම්ල හා භෂ්ම තනුක කිරීමෙහි ක්‍රියාවලිය සහිත පරීක්ෂණ සඳහා මෙම උපකරණය භාවිතා වන අතර වාෂ්ප පිටතට පැමිණිය හැකි පරීක්ෂණවලට භාවිතා කිරීම සඳහා වාතය පිටතට යා හැකි පරිදි නලයක් සවි කල යුතු අතර ඒ සම්බන්ධයෙන් අදාළ ආයතනය ද දැනුවත් කර ඇත. එම ආයතනය විසින් පරීක්ෂා කිරීමට ද පැමිණි අතර ඉදිරි දිනයක දී ඔවුන් විසින් ඉහත සඳහන් කරන ලද නලය සවිකිරීම සඳහා පැමිණෙනු ඇත.

භාවිත නොකළ රසායනාගාර උපකරණ - පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය

Biosafety Cabinet - මෙම උපකරණය 2021.07.05 දින භාරගත් අතර 2021.07.14 දින NuRes Laboratory හි ස්ථාපිත කර එහි ක්‍රියාකාරිත්වය පරීක්ෂා කරන ලදී.

මෙම උපකරණය ඇණවුම් කරන ලද්දේ නව ගොඩනැගිල්ලෙහි විද්‍යාගාරය ඉදිකළ පසු එහි ස්ථාපිත කොට භාවිතා කරන අභිලාශයෙනි. කෙසේවෙතත්, නව ගොඩනැගිල්ල ඉදිකිරීම කල්ගතවීම නිසා ඉඩකඩ අපහසුතාවය මධ්‍යයේ වුව ද මෙලෙස NuRes Laboratory හි ස්ථාපිත කර ගැනීමට සිදුවිය. ඉන්පසු මෙම Biosafety Cabinet ය සිසුන්ගේ සහ ආචාර්ය මණ්ඩලයේ උපාධි හා පශ්චාත් උපාධි පාඨමාලාවන්ට අදාළව සිදු කරනු ලබන පර්යේෂණ කටයුතු සඳහා භාවිතා කරන ලදී.

පර්යේෂණය සිදුකරනු ලබන පුද්ගලයා මෙන්ම පර්යේෂණයට භාජනය වන නියැදියේ ද ආරක්ෂාව තහවුරු වන පරිදි පර්යේෂණ කටයුතු සිදුකිරීම සඳහා Biosafety Cabinet ය භාවිතා කිරීම වඩාත් යෝග්‍ය වේ.

පර්යේෂණ නියැදිය රෝග කාරක මෙන්ම හානිකර වූ ජීවවිද්‍යාත්මක කාරක සමඟ නිරාවරණය වීම වලක්වා ගැනීමටත්, පර්යේෂණ ක්‍රියාවලිය සිදු කිරීමට අත්‍යවශ්‍ය පාලිත පාරිසරික තත්වයන් ලබාදීමත්, සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීම සඳහාත්, සාම්පල හෝ රසායනික ද්‍රව්‍ය මඟින් සිදුවිය හැකි පරිසර මෙන්ම පුද්ගලික හානිය අවම කිරීමටත්, සාම්පල/ රසායනික ද්‍රව්‍ය මඟින් පරිසරයට අහිතකර ද්‍රව්‍ය සහ රෝග කාරක පැතිරයාම වළක්වා ගැනීම සඳහාත් Biosafety Cabinet ය භාවිතා කළ හැක.

එබැවින්, පර්යේෂණය සඳහා අවශ්‍ය වන නියැදියන් (රුධිර සාම්පල/ ජෛව ක්‍රියාකාරී සංයෝග අඩංගු සාම්පල) පිළියෙල කිරීමත්, පර්යේෂණය සඳහා අවශ්‍ය වන රසායනික ද්‍රව්‍ය/ සංයෝග පිළියෙල කිරීමත් පර්යේෂණයට අදාළ වූ එක් එක් පියවරයන් සිදු කිරීම සඳහාත් Biosafety Cabinet ය භාවිතා කරන ලදී. කෙසේවෙතත්, නව ගොඩනැගිල්ලෙහි විද්‍යාගාරයේ ඉදිකිරීම් අවසන් වූ පසු මෙම Biosafety Cabinet ය නිසි පරිදි ස්ථාපිත කිරීමෙන් අනතුරුව බලාපොරොත්තු වන සම්පූර්ණ පර්යේෂණ කටයුතු කළ හැකිවනු ඇත.

(ආ) 2019 වසරේ වෛද්‍ය පීඨය ඉදිකරනවිට අනාගත වැඩසටහනක් ලෙස පළාතේ සෞඛ්‍යය සම්බන්ධව වෛද්‍ය පීඨයේ දායකත්වය ලබා දීම සඳහා මෙම ප්‍රජා වෛද්‍ය මධ්‍යස්ථානය ඉදිකොට ඇත. මෙම වෛද්‍ය මධ්‍යස්ථානය පවත්වාගෙන යාම සඳහා අවම අවශ්‍යතාවයන් වන්නේ වෛද්‍ය පීඨයේ ප්‍රජා වෛද්‍ය සහ පවුල් වෛද්‍ය දෙපාර්තමේන්තුව නිසි ආකාරව ප්‍රතිස්ථාපනය වීමයි. රටේ සිදු වූ ආර්ථික දුෂ්කරතාවන් සහ රටේ වෛද්‍යවරු රට හැරයාම යන ක්‍රියාවලි නිසා දෙපාර්තමේන්තුවලට වෛද්‍යවරුන් පැමිණීමේ විශාල දුර්වලතාවයක් පවතී. සෞඛ්‍යය අමාත්‍යාංශයේ වැටුපට වඩා අධ්‍යාපන අමාත්‍යාංශයේ වැටුප අඩුවීම ද මෙලෙස වෛද්‍ය පීඨයට මාරුවීම සඳහා උනන්දුව අඩු වීමට හේතුවක්ව පවතී. ඊට අමතරව වෛද්‍ය පීඨයේ මහාචාර්ය ඒකක කුලියාපිටියේ ඉදිවෙතැයි උපකල්පනය කොට තිබූ පදනම ද පසුකාලීනව වෙනස් වී ඇත. එවැනි පසුබිමක වෛද්‍ය පීඨයේ කාර්ය මණ්ඩලයෙන් කොටසක් කුලියාපිටියේ ද තව කොටසක් කුරුණෑගල ද තමන්ගේ ප්‍රමුඛ කාර්යයන් සිදු කරමින් සිටිති. ඒ නිසා ස්ථීර සැලැස්මකට ප්‍රජා වෛද්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීමට වර්තමානයේ අපොහොසත්ව ඇති බව දන්වනු කැමැත්තෙමි. එමෙන්ම සෞඛ්‍යය අමාත්‍යාංශයේ සායනයක් ඉතා නුදුරෙන් ප්‍රාදේශීය සභා කාර්යාලය තුළ පවත්වාගෙන යන අතර එය ඉතාම උසස් මට්ටමකින් පවතින බැවින් තවදුරටත් සායනයක් අතිරේකව අවශ්‍ය නොවන බව සෞඛ්‍ය බලධාරීන් අප වෙත දන්වා ඇත. එවැනි තත්වයක් යටතේ මෙම පරිශ්‍රය භාවිතා කිරීම සඳහා අලුත් තීරණ ගතයුතුව ඇති බව දන්වා සිටිමි.

වෛද්‍ය පීඨය සඳහා ඉදිකරන ලද මෙම ප්‍රජා වෛද්‍ය මධ්‍යස්ථානය එකී කර්තව්‍යයට භාවිතා නොවුණත් අපට අත්‍යවශ්‍යව තිබූ සුවිශේෂ කාර්යයකට ඉහළ දායකත්වයක් ලබා දුන් බව දන්වා

සිටිමි. එනම් මෙම වෛද්‍ය පීඨය සහ ඊට අදාළ මහාචාර්ය ඒකකවලට රජයෙන් සැපයුම් ලබා ගත නොහැකිව තිබුණු ආර්ථික දුෂ්කරතා පැවති අවධියේ අප වෙත විශාල ආධාර සංඛ්‍යාවක් වෙනත් පාර්ශ්ව වෙතින් ලැබුණු අතර එකී ආධාර රැස්කිරීම මෙම ප්‍රජා වෛද්‍ය මධ්‍යස්ථාන කාමර තුළ කරගෙන ගිය බව දන්වා සිටිමි. අදටත් වෛද්‍ය පීඨයේ වාට්ටු සඳහා ලැබුණු උසස් තත්වයේ ඇඳවල් එකී ප්‍රජා වෛද්‍ය මධ්‍යස්ථානයේ ගබඩා කර ආරක්ෂා සහිතව ඇති බව දන්වා සිටිමි.

(ඇ)

ව්‍යාපෘතිය	රඳවා තබාගත් මුදල (රු.)	ව්‍යාපෘතිය නිම කළ දිනය	වර්තමාන තත්ත්වය
Construction of an Overhead Water Tank 20,000L capacity at Kuliyapitiya	451,618.35	30.12.2012	ව්‍යාපෘතියට අදාළව අඩුපාඩු පවතින බැවින් ව්‍යාපෘතියට අදාළව රඳවා තබාගත් මුදල නිදහස් නොකරන ලෙස වැඩ බලන වැඩ ඉංජිනේරු විසින් දැනුම් දෙන ලදී.
Gymnasium, Kuliyapitiya	13,258,929.72	15.02.2014	අවසන් බිල්පතක් ඉදිරිපත් කරන ලෙස කොන්ත්‍රාත්කරු වෙත දැනුම් දී ඇතත් මේ වන තෙක් අවසන් බිල්පතක් ඉදිරිපත් කර නැත.
Canteen Block (Stage I)	3,472,245.08	27.16.2016	ව්‍යාපෘතියට අදාළව අඩුපාඩු පවතින අතර එම අඩුපාඩු නිවැරදි කරන ලෙස හා මේ පිළිබඳව කොන්ත්‍රාත්කරු සමඟ 2025.09.10 වන දින විශ්වවිද්‍යාලයේ දී පැවති රැස්වීමකදී සාකච්ඡා කරන ලදී. එහිදී පළමුව Laboratory building to introduce Engineering Technology Degree Programme ව්‍යාපෘතියේ වැඩ අවසන් කර එයට අදාළ ගෙවීම් නිදහස් කර ගැනීමෙන් පසු කොන්ත්‍රාත්කරුට අදාළ මෙම ව්‍යාපෘති සියල්ලෙහි අඩුපාඩු එකිනෙක නිවැරදි කර අවසන් කරන බව කොන්ත්‍රාත්කරු විසින් සඳහන් කරන ලදී. ඉන් පසු මෙම මුදල් නිදහස් කිරීම පිළිබඳව සළකා බැලිය හැක.
Health Centre Stage II, Makandura (WUSL/CW/2008/44)	811,648.78	27.06.2016	කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතිය නතර කරන ලද බැවින් රැඳවුම් මුදල විශ්වවිද්‍යාල ආදායමට ගන්නා ලෙස ගිණුම් අංශය දැනුවත් කර ඇත.
Faculty Building Stage III (Final)-FLFN (WUSL/CW/2010/02)	3,746,197.80	31.12.2019	කැබිනට් අනුමත මුදල දක්වා (රු. මිලියන 169.4) සම්පූර්ණ මුදල ගෙවා ඇති බැවින් ඉතිරි බිල්පත් ගෙවීමට රුපියල් මිලියන 181.85 දක්වා ඇස්තමේන්තුව සංශෝධනය කරන ලෙස අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ඉල්ලීමක් කරන ලදී. 2024.11.12 වන දින ඒ සඳහා අනුමැතිය ලැබුණි. නමුත් අදාළ ගෙවීම් කිරීම සඳහා සංශෝධිත ඇස්තමේන්තුව සඳහා කැබිනට් අනුමැතිය ලබා ගත යුතුව ඇත. ඒ පිළිබඳව 2025.08.06 වන දින අධ්‍යාපන

			අමාත්‍යාංශ ලේකම්වරයා වෙත ඉල්ලීම් කර ලිපියක් යොමු කර ඇති අතර මෙතෙක් අනුමැතිය ලැබී නැත.
Faculty Building Stage III (Final) FAS (WUSL/CW/2010/01)	9,063,444.98	31.12.2016	ව්‍යාපෘතියට අදාළව අඩුපාඩු පවතින අතර එම අඩුපාඩු නිවැරදි කරන ලෙස හා මේ පිළිබඳව කොන්ත්‍රාත්කරු සමඟ 2025.09.10 වන දින විශ්වවිද්‍යාලයේ දී පැවති රැස්වීමකදී සාකච්ඡා කරන ලදී. එහිදී පළමුව Laboratory building to introduce Engineering Technology Degree Programme ව්‍යාපෘතියේ වැඩ අවසන් කර එයට අදාළ ගෙවීම් නිදහස් කර ගැනීමෙන් පසු කොන්ත්‍රාත්කරුට අදාළ මෙම ව්‍යාපෘති සියල්ලෙහි අඩුපාඩු එකිනෙක නිවැරදි කර අවසන් කරන බව කොන්ත්‍රාත්කරු විසින් සඳහන් කරන ලදී. ඉන් පසු මෙම මුදල් නිදහස් කිරීම පිළිබඳව සලකා බැලිය හැක.
Proposed development the Nano Engineering Laboratory, Kuliyapitiya (WUSL/CW/2016R/K/21)	852,972.33	10.04.2017	2025.09.11 වන දින ගෙවීම් සඳහා ගිණුම් අංශය වෙත යොමු කර ඇත.
Proposed Development the laboratory complex, Engineering Technology Degree Programme, Kuliyapitiya (WUSL/CW/2016R/K/20)	683,142.77	10.02.2017	ව්‍යාපෘතියට අදාළව අඩුපාඩු පවතින අතර එම අඩුපාඩු නිවැරදි කරන ලෙස හා මේ පිළිබඳව කොන්ත්‍රාත්කරු සමඟ 2025.09.10 වන දින විශ්වවිද්‍යාලයේ දී පැවති රැස්වීමකදී සාකච්ඡා කරන ලදී. එහිදී පළමුව Laboratory building to introduce Engineering Technology Degree Programme ව්‍යාපෘතියේ වැඩ අවසන් කර එයට අදාළ ගෙවීම් නිදහස් කර ගැනීමෙන් පසු කොන්ත්‍රාත්කරුට අදාළ මෙම ව්‍යාපෘති සියල්ලෙහි අඩුපාඩු එකිනෙක නිවැරදි කර අවසන් කරන බව කොන්ත්‍රාත්කරු විසින් සඳහන් කරන ලදී. ඉන් පසු මෙම මුදල් නිදහස් කිරීම පිළිබඳව සලකා බැලිය හැක.
Construction of Faculty Building Stage III, FAPM (WUSL/CW/2014/01)	10,384,000.00	04.03.2019	ව්‍යාපෘතියට අදාළව අඩුපාඩු පවතින අතර එම අඩුපාඩු නිවැරදි කරන ලෙස හා මේ පිළිබඳව කොන්ත්‍රාත්කරු සමඟ 2025.09.10 වන දින විශ්වවිද්‍යාලයේ දී පැවති රැස්වීමකදී සාකච්ඡා කරන ලදී. එහිදී පළමුව Laboratory building to introduce Engineering Technology Degree Programme ව්‍යාපෘතියේ වැඩ අවසන් කර එයට අදාළ ගෙවීම් නිදහස් කර ගැනීමෙන් පසු කොන්ත්‍රාත්කරුට අදාළ මෙම ව්‍යාපෘති සියල්ලෙහි අඩුපාඩු එකිනෙක නිවැරදි කර අවසන් කරන බව කොන්ත්‍රාත්කරු විසින්

			සඳහන් කරන ලදී. ඉන් පසු මෙම මුදල් නිදහස් කිරීම පිළිබඳව සලකා බැලිය හැක.
Laboratory building to introduce Engineering Technology Degree Programme (WUSL/CW/2014/04)	6,167,712.50	28.02.2019	2025.09.10 වන දින විශ්වවිද්‍යාලයේ දී පැවති රැස්වීමක දී මෙම ව්‍යාපෘතියේ පවතින අඩුපාඩු පිළිබඳව කොන්ත්‍රාත්කරු සමඟ සාකච්ඡා කරන ලදී. එහි සාකච්ඡා වූ පරිදි කොන්ත්‍රාත්කරු මේ වන විට අදාළ අඩුපාඩු නිවැරදි කිරමින් පවතී. එය අවසන් කළ පසු මෙම ගෙවීම නිදහස් කළ හැක.
Construction of 4 Storied 100 rooms Hostel Building for FOM (Hostel No 08), Kuliyapitiya	173,169.46	14.09.2018	ව්‍යාපෘතියට අදාළව අඩුපාඩු පවතින අතර එම අඩුපාඩු නිවැරදි කරන ලෙස කොන්ත්‍රාත්කරු ලිඛිතව දැනුවත් කර ඇත.

(ඇ) **ජේ.අයි.කේ. හෙට්ටිආරච්චි මිය (කථිකාචාර්ය පරිවාස)**

හෙට්ටිආරච්චි මහත්මිය විසින් අධ්‍යයන නිවාඩු ලබා ගැනීමේ දී සපයා ඇති කරුණු අනුව බැඳුම්කර වටිනාකම ගණනය කර ඇත. කෙසේවෙතත් බැඳුම්කර අත්සන් කිරීමෙන් අනතුරුව ඇය විසින් ඉදිරිපත් කර ඇති ලේඛන මත බැඳුම්කර වටිනාකම නැවත ගණනය කළ ද ඒ පිළිබඳව තහවුරුවක් අදාළ විදේශීය විශ්වවිද්‍යාලය මගින් මේ වන තෙක් ලබා දී නොමැත. කෙසේවෙතත් රජයේ විගණනයේ කරුණු දැක්වීම මත අදාළ නැවත ගණනය කිරීම සිදු කර ඇයගෙන් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී.

(ඉ) මාකඳුර පරිශ්‍රයේ අක්කර 22 ක ඉඩම පවරා ගැනීම.

"මහයායවත්ත" ඉඩමේ වී අලෙවි මණ්ඩලය සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපිත පන්නල තාක්ෂණික මධ්‍යස්ථානය පිහිටි අක්කර 22 ක් පමණ වූ ඉඩම් කොටස වයඹ විශ්වවිද්‍යාලයීය මාකඳුර පරිශ්‍රය ස්ථාපිත කිරීම සඳහා භාර දී ඇත. අක්කර 22 ක් පමණ වූ මෙම ඉඩම් කොටස පැවරීම් සම්බන්ධ තොරතුරු පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නොමැති බව වාර්තා කර ඇත. එමෙන්ම, වී අලෙවි මණ්ඩලය සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ද නිසි ආකාරයේ ඉඩම් පවරා ගැනීමක් සිදු කර නොමැති බව පන්නල ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත.

මෙම ඉඩම විශ්වවිද්‍යාලයට භාර දීමට පෙර 1973/1974 කාලය තුළ මහයායවත්ත ගම් පුළුල් කිරීම යටතේ රජය විසින් අත්පත් කරගෙන ඇති ඉඩමකි. ඒ අනුව මැනුම් කටයුතු සිදුකර වයඹ විශ්වවිද්‍යාලයේ රේඛීය අමාත්‍යාංශය වෙත පවරාදීමට ඉඩම අත්පත්කර ගැනීමේ අරමුණ සංශෝධනය කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ඉඩම් අමාත්‍යාංශය විසින් පන්නල ප්‍රාදේශීය ලේකම්ට උපදෙස් ලබා දී ඇත. ඒ අනුව "ගම් පුළුල් කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම" යන අරමුණ වයඹ විශ්වවිද්‍යාලයේ මාකඳුර පරිශ්‍රය පුළුල් කිරීමේ දී අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම" ලෙස සංශෝධනය කිරීමට ගරු ඉඩම් අමාත්‍යතුමාගේ අනුමැතිය 2021.10.07 දිනැතිව ලබා දී ඇත. ඒ අනුව, පන්නල ප්‍රාදේශීය ලේකම් විසින් මෙම ඉඩම උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට පවරාදීමේ පැවරුම් පත්‍ර, පළාත් ඉඩම් කොමසාරිස්ගේ නිර්දේශ සහිතව ඉඩම් අමාත්‍යාංශය වෙත යවා ඇත. මේ සම්බන්ධයෙන් ප්‍රමුඛත්වය ගෙන කටයුතු කරන ලෙස ලේඛකාධිකාරී විසින් 2024.01.22 දිනැති ලිපිය මගින් ප්‍රාදේශීය ලේකම් පන්නල දැනුවත් කර ඇත.

ඉහත ලිපියට පිළිතුරු වශයෙන්, පන්නල ප්‍රාදේශීය ලේකම්වරයා විසින් 2024.02.19 දිනැති ලිපියෙන් ඔවුන් දැනටමත් අඩුපාඩු නිවැරදි කර සැකසූ සංශෝධිත වාර්තාව ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත 2023.09.26 දින යවා ඇති බව දන්වා ඇත.

මෙම කාර්යය සඳහා දීර්ඝ කාලයක් ගත වී ඇතත් පැවරුම්පත්‍ර ලබා දීමට නොහැකි වීම නිසා 2025.05.21 දින පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් අත්පත් කර ගැනීමේ නිලධාරීන් සමඟ සාකච්ජාවක් පවත්වන ලදී. ඔවුන් විසින් කරන ලද දැනුම් දීමට අනුව මෙම ඉඩම අත්පත් කර ගැනීමේ කාර්යයේ අවසන් අදියරේ පවතින බව ද, දැනට පළාත් ඉඩම් කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යවා ඇති බව ද දන්වන ලදී.

ඒ අනුව, සාමාන්‍ය පාලන අංශයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී සහ විෂයභාර ලිපිකරු විසින් 2025.06.03 දින අධ්‍යක්ෂ (ඉඩම් අත්පත්) හමුවෙන ලදී. ඔහු විසින් පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් අත්පත් නිලධාරීන් හට පැවරුම්පත්‍ර කඩිනමින් ලබා දීම සම්බන්ධයෙන් දුරකථනය මඟින් උපදෙස් ලබා දෙන ලදී.

මෙම ඉඩම අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා විසින් සිදු කරනු ලබන බව පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් භාර නිලධාරියා විසින් පසුව දැනුම් දෙන ලදී. ඒ අනුව, විශ්වවිද්‍යාලය විසින් 2025.06.20 දින මෙම ඉඩම අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කරන ලෙස ඉල්ලා සිටිමින්, ඉඩම් කොමසාරිස් ජනරාල් සහ ප්‍රාදේශීය ලේකම් (පන්නල) වෙත පිටපත් සහිතව අධ්‍යක්ෂ (ඉඩම් අත්පත් කර ගැනීම) වෙත ලිපියක් යවන ලදී.

(ඊ) **<u>පර්චස් 74 ක් පමණ වූ කුඹුරු ඉඩම් කැබලි 03 ක් පවරා ගැනීම</u>**

ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ මේ සඳහා 2013.04.18 දින අත්තිකාරම් මුදලක් ලෙස **රු.** 1,013,750.00 **ක** මුදලක් වයඹ විශ්වවිද්‍යාලය විසින් පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර ඇත. අත්පත් කර ගැනීමේ කටයුතු සිදු කරන අවස්ථාවල දී, ඉඩම් හිමිකරුවන්ගේ විරුද්ධත්වය හේතුවෙන් ගැටළු සහගත තත්ත්වයක් පවතින බැවින් පන්නල ප්‍රාදේශීය ලේකම්ගේ උපදෙස් පරිදි දැනට ක්‍රියාත්මක ඉඩම් අත්පත් කාර්යය කඩිනම් කර ගැනීම සඳහා 38 (අ) අතුරු විධානය යටතේ ආඥාවක් ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් මඟින් ලබා ගැනීමට කටයුතු කරන ලදී. ඒ අනුව, ප්‍රගමන අනුරේඛනයේ සඳහන් A,B,C,D,E,F,G,H,J යන ඉඩම් කැබලි වයඹ විශ්වවිද්‍යාලයට පවරා ගැනීම සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (අ) අතුරු විධානය යටතේ අංක:2287/38 හා 2022.07.08 දරණ අති විශේෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී.

මේ සඳහා අවශ්‍ය කරන නඩත්තු, ආරක්ෂක කටයුතු සහ මානව සම්පත් අවශ්‍යතාවයන් වෙනුවෙන් දැරීමට සිදුවන වියදම් සැලකිල්ලට ගෙන මෙම ඉඩම් කොටස්වලට අදාළ ප්‍රගමන අනුරේඛනයෙහි සඳහන් A,B,C,D,E,F,G,H,J යන ඉඩම් අතරින් G,H,J යන ඉඩම් කොටස් 03 අත්කර ගැනීමේ පනතේ 39 (1) වගන්ති ප්‍රකාරව ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමේ නියමයට අදාළ පුවත්පත් දැන්වීම 2023.12.29 දින දිනමිණ, ඩේලිනිවුස් හා තිනකරන් පුවත්පත්වල පළ කර ඇත.

මෙම ඉඩම් කැබලි අතරින් A සහ B යන ඉඩම් කැබලි දෙකට අදාළ ඉඩම් හිමිකරුවන් පමණක් 2024.09.26 දින ඉඩමේ නිරවුල් භුක්තිය විශ්වවිද්‍යාලයට බාර දී ඇත. එම ඉඩම් භුක්තියට බාර දී දීර්ඝ කාලයක් ගතවී තිබුණ ද වන්දි ගෙවීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට නොහැකිවීම පිළිබඳව ඉඩම් හිමිකරුවන් විසින් 2025.01.06 දිනැති ලිපිය මඟින් කරන ලද විමසීමට අනුව, මෙම ඉඩම්වල ඉදිරි කටයුතු සම්බන්ධයෙන් උපදෙස් ලබාදෙන ලෙස 2025.01.15 දිනැති ලිපිය මඟින් ලේඛකාධිකාරී විසින් පන්නල ප්‍රාදේශිය ලේකම්ගෙන් විමසීමක් කරන ලදී.

ප්‍රාදේශීය ලේකම්ගේ 2025.02.24 දිනැති ලිපියට අනුව ඉඩම් අමාත්‍යාංශය විසින් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 05 වන වගන්තිය යටතේ ප්‍රකාශය නිකුත්ක ළ පසු ඉදිරි කටයුතු සිදු කිරීමට හැකි බව දන්වා ඇත. නිශ්චිත ක්‍රියාපටිපාටි අනුගමනය කරමින් භුක්තිය බාරදෙන ලෙස දැනුවත් කිරීමෙන් අනතුරුව ද ඉතිරි ඉඩම් කොටස්වල භුක්තිය භාරදීමට ඉඩම් හිමියන් විරුද්ධත්වය ප්‍රකාශ කරන්නේනම් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 42 (2) අනුව කටයුතු කරන ලෙස ඉඩම් අමාත්‍යාංශය විසින් 2025.03.05 දිනැති ලිපිය මගින් පන්නල ප්‍රාදේශීය ලේකම් දැනුවත් කර ඇත.

මෙම සියලු ඉඩම් කොටස්වල හිමිකරුවන් සමඟ 2024.09.26 දින පැවති සාකච්ජාවේ දී ගත් තීරණයකට අනුව, මෙම ඉඩම් කැබලිවල දළ වටිනාකම රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ලබා ගන්නා ලදී. මෙම ඉඩම් කැබලි වයඹ විශ්වවිද්‍යාලයට පවරා දීමේ ඉදිරි කටයුතු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා එම දළ ඇස්තමේන්තුව 2025.03.23 දිනැති ලිපිය මගින් පන්නල ප්‍රාදේශීය ලේකම් වෙත යවන ලදී.

තවද, දින 07 ක් ඇතුළත ඉඩමේ අයිතිය විශ්වවිද්‍යාලය වෙත බාර දීමට කටයුතු නොකරන්නේනම් ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන අනුව අධිකරණ ක්‍රියාමාර්ග ගන්නා බව තවමත් ඉඩමේ භුක්තිය බාර නොදුන් ඉඩම් හිමිකරුවන් වෙත 2025.09.10 දින ප්‍රාදේශීය ලේකම් පන්නල විසින් දැනුම් දී ඇත.

<u>පොල් පර්යේෂණ මණ්ඩලයට අයිති අක්කර 05 ක ඉඩම පවරා ගැනීම</u>

"මහයායවත්ත" ඉඩමේ පොල් පර්යේෂණ ආයතනයට අයත් අක්කර 05 ක් පමණ වූ දැනට විශ්වවිද්‍යාලයීය නේවාසිකාර ඇතුළු ගොඩනැගිලි නිමකර ඇති භූමිය, 1973/1974 කාලය තුළ ගම් පුළුල් කිරීම යටතේ රජය විසින් අත්පත් කරගෙන ඇති ඉඩමකි. අත්පත් කර ගැනීමේ පනතේ 44 වෙනි වගන්තිය යටතේ පැවරුම් සහතිකයක් පොල් පර්යේෂණ මණ්ඩලය වෙත නිකුත් කර ඇත. ඒ අනුව, පොල් පර්යේෂණ ආයතනය විසින් මෙම ඉඩම සඳහා පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදල් ගෙවා ඇති බව තහවුරු වන අතර, එවකට ඉඩමේ තක්සේරු වටිනාකම අනුව රු. මිලියන 10 ක් වයඹ විශ්වවිද්‍යාලය විසින් පොල් පර්යේෂණ මණ්ඩලයට ගෙවා ඇත.

ඒ අනුව, මැනුම් කටයුතු සිදුකර ඉඩම් අත්පත් කර ගැනීමේ පනත අනුව වයඹ විශ්වවිද්‍යාලයේ රේඛීය අමාත්‍යාංශය වෙත පවරාදීමට ඉඩම අත්පත්කර ගැනීමේ අරමුණ සංශෝධනය කළ යුතු බව ඉඩම් අමාත්‍යාංශය විසින් පන්නල ප්‍රාදේශීය ලේකමට උපදෙස් ලබා දී ඇත. ඒ අනුව "ගම් පුළුල් කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම" යන අරමුණ වයඹ විශ්වවිද්‍යාලයේ මාකඳුර පරිශ්‍රය පුළුල් කිරීමේ දී අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම" ලෙස සංශෝධනය කිරීමට ගරු ඉඩම් අමාත්‍යතුමාගේ අනුමැතිය 2021.10.07 දිනැතිව ලබා දී ඇත. ඒ අනුව, පන්නල ප්‍රාදේශීය ලේකම් විසින් මෙම ඉඩම උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට පවරාදීමේ පැවරුම් පත්‍ර, පළාත් ඉඩම් කොමසාරිස්ගේ නිර්දේශ සහිතව ඉඩම් අමාත්‍යාංශය වෙත යවා ඇත. මේ සම්බන්ධයෙන් ප්‍රමුඛත්වය ගෙන කටයුතු කරන ලෙස ලේඛකාධිකාරී විසින් 2024.01.22 දිනැති ලිපිය මගින් ප්‍රාදේශීය ලේකම් පන්නල දැනුවත් කර ඇත.

මෙම කාර්යය සඳහා දීර්ඝ කාලයක් ගත වී ඇතත් පැවරුම්පත්‍ර ලබා දීමට නොහැකි වීම නිසා 2025.05.21 දින පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් අත්පත් කර ගැනීමේ නිලධාරීන් සමඟ සාකච්ජාවක් පවත්වන ලදී. ඔවුන් විසින් කරන ලද දැනුම් දීමට අනුව මෙම ඉඩම අත්පත් කර ගැනීමේ කාර්යයේ අවසන් අදියරේ පවතින බව ද, දැනට පළාත් ඉඩම් කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යවා ඇති බව ද දන්වන ලදී.

ඒ අනුව, සාමාන්‍ය පාලන අංශයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී සහ විෂයභාර ලිපිකරු විසින් 2025.06.03 දින අධ්‍යක්ෂ (ඉඩම් අත්පත්) හමුවෙන ලදී. ඔහු විසින් පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් අත්පත් නිලධාරීන් හට පැවරුම්පත්‍ර කඩිනමින් ලබා දීම සම්බන්ධයෙන් දුරකථනය මඟින් උපදෙස් ලබා දෙන ලදී.

මෙම ඉඩම අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා විසින් සිදු කරනු ලබන බව පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් භාර නිලධාරියා විසින් පසුව දැනුම් දෙන ලදී. ඒ අනුව, විශ්වවිද්‍යාලය විසින් 2025.06.20 දින මෙම ඉඩම අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කරන ලෙස ඉල්ලා සිටිමින්, ඉඩම් කොමසාරිස් ජනරාල් සහ ප්‍රාදේශීය ලේකම් (පන්නල) වෙත පිටපත් සහිතව අධ්‍යක්ෂ (ඉඩම් අත්පත් කර ගැනීම) වෙත ලිපියක් යවන ලදී.

08/12/2025

මහාචාර්ය ජී.එම්.පී. ඒකනායක
උපකුලපති
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

උපකුලපති
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
කුලියාපිටිය

තිරසාර සංවර්ධන යෝජනා

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

තිරසාර සංවර්ධන යෝජනා - ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

1 ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ පීඨ 06ට වසරකට සිසුන් 1500ක් පමණ ඇතුලත් කරගනු ලබයි. එසේ ම එම පීඨ මඟින් වාර්ෂිකව උපාධිධාරීන් 900ක් පමණ පිටවන අතර රටේ ආර්ථික වර්ධනයට අවශ්‍ය ශ්‍රම දායක්වය ලබා දෙන උපාධිධාරීන් පිරිසක් වයඹ විශ්වවිද්‍යාලය මඟින් බිහි කරනු ලබයි. එමඟින් ලංකාවේ දිළිඳුකම තුරන් කිරීමට අවශ්‍ය ශ්‍රම දායකත්වය ලබා දීමට විශ්වවිද්‍යාලයට හැකි වේ.

2 ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ මාකඳුර පරිශ්‍රයේ පිහිටි කෘෂිකර්ම හා වැවිළි කළමණාකරන පීඨය හා පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය මඟින් විවිධ පර්යේෂණ සිදු කරන අතර ඒ මඟින් විවිධ බෝග වර්ග හා ආහාර වර්ග හඳුන්වා දීම මඟින් රටේ දරිද්‍රතාව තුරන් කිරීම සඳහා පිටුවහලක් ලබා දේ.

3 ලංකාවේ 10 වන වෛද්‍ය පීඨය ලෙස ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ආරම්භ කරනු ලැබූ අතර වෛද්‍ය පීඨයේ දෙපාර්තමේන්තු 15ක් ඇති අතර රටේ සෞඛ්‍ය තත්වය දියුණු කිරීමට අවශ්‍ය වෛද්‍යවරුන් බිහි කිරීමට අවශ්‍ය පහසුකම් විශ්වවිද්‍යාලය මඟින් සැපයීම මෙහි අරමුණයි.

4 සංවර්ධනය වන රටක් වන ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය දියුණු කිරීමට උසස් අධ්‍යාපනයේ ගුණාත්මක බව වැඩි කිරීමට තත්ව ආරක්ෂණ වැඩ සටහන් මඟින් (Quality Assurance) ඉහළ මට්ටමේ අධ්‍යාපනයක් සිසුන්ට ලබා දීමට විශ්වවිද්‍යාලය කටයුතු කරනු ලැබේ. එසේ ම විශ්වවිද්‍යාලයේ තත්ව ආරක්ෂණ ඒකකයක් ද (Quality Assurance Unit) පිහිටුවා ඇත. එසේ ම සිසුන්ට අවශ්‍ය
තාක්ෂණය හා රැකියා අභිමුඛ පුහුණුවට යොමු කර ඒ තුළින් හොඳ අධ්‍යාපන තත්වයක් ලබා දීමට විශ්වවිද්‍යාලය කටයුතු කරනු ලැබේ.

5 විශ්වවිද්‍යාලය මඟින් සංවිධානය කරනු ලබන සෑම කටයුත්තකදී ම ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සැමට සමාන අයිතිවාසිකම් ලැබෙන ලෙස කටයුතු කරනු ලැබේ.

6 සනීපාරක්ෂාව හා ජල පහසුකම් ලබා දීමේ දී විශ්වවිද්‍යාලය පරිභෝජනය සඳහා අවශ්‍ය සියලුම ජලය නළ ළිං මාර්ගයෙන් ලබා ගන්නා අතර සිසුන්ට හා කාර්යය මණ්ඩලයේ පාවිච්චියට ගත හැකි අයුරින් ජලය පිරිපහදු කර ලබා දෙනු ලැබේ. එසේ ම මෙම ජලයේ තත්වය පිළිබඳව නිතරම පරීක්ෂා කරනු ලැබේ. විශ්වවිද්‍යාලයේ වෛද්‍ය මධ්‍යස්ථානය, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්, පවිත්‍රතා අංශය, උද්‍යාන පාලන අංශය යන සෑම අංශයක් ම සම්බන්ධ කර ගනිමින් වඩාත් හොඳ සනීපාරක්ෂ පහසුකම් සිසුන්ට හා කාර්යය මණ්ඩලයට ලබා දීමට කටයුතු කරනු ලැබේ.

7 විදුලිය හා බලශක්තිය ඉතිරිකර ගැනීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය පහත ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත.

- ආලෝකය අවශ්‍ය ස්ථානය සඳහා සංයුක්ත ප්‍රතිදීප්ත විදුලි බුබුළු (CFL Bulb) පමණක් භාවිත කිරීමට කටයුතු කිරීම
- සූර්ය ශක්තිය මඟින් විදුලිය ලබා ගැනීමට යෝජනා ඉදිරිපත් කර ඇත
- ගොඩනැගිලි ඉදි කිරීමේදී ඇතුළට හිරුඑළිය ලැබෙන පරිදි වීදුරු ආවරණ සහිතව නිර්මාණය කිරීමට කටයුතු කර ඇත.

8 විශ්වවිද්‍යාලයේ සියලුම පාඨමාලා රැකියා අභිමුඛ පාඨමාලාවන් වන අතර සැමවිටම විරැකියාවට විසඳුමක් ලැබෙන ආකාරයේ පාඨමාලා අලුතින් ඇති කරමින් සමාලෝචනය කරමින් තිබෙන පාඨමාලා වැඩි දියුණු කිරීමට විශ්වවිද්‍යාලය කටයුතු කරනු ලැබේ. එසේ ම අලුතින් ඉංජිනේරු පීඨයක් ඇති කිරීමට බලාපොරොත්තු වන අතර එමඟින් රටේ ඉංජිනේරු ක්ෂේත්‍රයට අවශ්‍ය ශ්‍රම දායකත්වය සැපයීමට බලාපොරොත්තු වේ.

9 තාක්ෂණ පීඨය විශ්වවිද්‍යාලයේ අලුතින් ආරම්භ කළ පීඨයක් වන අතර මෙමඟින් නවෝත්පාදන කටයුතු සඳහා වැඩි ප්‍රමුඛත්වයක් ලබා දෙනු ලැබේ. එසේ ම ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් විශ්වවිද්‍යාලය මඟින් සංවර්ධනය කරනු ලැබේ.

10 වයඹ විශ්වවිද්‍යාලයේ BREAD Center සහ BIC යන මධ්‍යස්ථාන මඟින් නවෝත්පාදන හා නව නිෂ්පාදන වෙනුවෙන් වන දිරිමත් කිරීම් කරන අතර නව නිෂ්පදන සඳහා අවශ්‍ය වන වෙළඳපළ හඳුන්වා දීමත් සිදුකරනු ලබයි.

එමඟින් ප්‍රදේශයේ අවට ප්‍රජාවට අවශ්‍ය තාක්ෂණික හා ව්‍යාපාරික දැනුම ලබා දීමට ද කටයුතු කරනු ලබයි.

11 විශ්වවිද්‍යාලය සතු සම්පත් උපරිම ඵලදායීතාවයකින් යුතුව භාවිතා කිරීමට කටයුතු කරනු ලබන අතර ඒ සඳහා පහත ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත.

- වෛද්‍ය පීඨයේ වරක් භාවිතා කළ ජලය පිරිසිදු කර නැවත භාවිතයට ගැනීම
- ඉවතලන ද්‍රව්‍ය දිරාපත්වන, වීදුරු, පොලිතීන් / ප්ලාස්ටික් සහ කඩදාසි වශයෙන් වෙන වෙන ම එකතුකර සුදුසු පරිදි අපහරණය කිරීම

12 විශ්වවිද්‍යාලය තම පරිශ්‍ර තුළ සැමවිටම හරිතකරණයට ලක් වූ පරිසරයක් පවත්වා ගැනීමට කටයුතු කරන අතර විශ්වවිදයාලයේ උද්‍යාන පාලන අංශ මඟින් රුක් රෝපණය කිරීම්, ඒවායේ ආරක්ෂාව සහ නඩත්තු සම්බන්ධයෙන් නිතරම සැලකිල්ලක් දක්වනු ලැබේ.

13 විශ්වවිද්‍යාලය තුළ විවිධ ජතීන්ට විවිධ ආගම්වලට අයත් ශිෂ්‍යයින් හා කාර්යය මණ්ඩලය සිටින අතර සෑම කටයුත්තකදී ම ජාතීන් අතර අන්‌නෝන්‍ය සුදහතාවය වර්ධනය වන අයුරින්

විශ්වවිද්‍යාලය කටයුතු කරනු ලැබේ. ජනවාරි 01 දින සර්ව ආගමික වැඩසටහන් පැවැත්වීම, අනෙකුත් ආගමික උත්සවවල දී සියලුදෙනා එකතුව ඒවාට අදාළ සැරසිළි, වැඩසටහන් සිදුකිරීම මඟින් අන්‍යෝන්‍ය සුහදතාවය වර්ධනය වේ.

14 ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාව තුළ හා විදේශීයව ඇති අධ්‍යාපන ආයතන, මූල්‍ය ආයතන සහ අනෙකුත් විශ්වවිද්‍යාල සමඟ අවබෝධතා ගිවිසුම් මඟින් සම්බන්ධතාවයන් පවත්වා ගැනීමට කටයුතු කරනු ලැබේ. එය සිසුන්ට හා කාර්යය මණ්ඩලයට දෙස් විදෙස් සබඳතා ගොඩනගා ගැනීමට පිටුවහලක් වේ.